ANNUAL REPORT
වාර්ෂික වාර්තාව
ஆண்டு அறிக்கை
2022

PRACTICAL SKILLS
LEAD TO
REAL SUCCESS



තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
மூன்றாம் நிலைக்கல்வி, தொழிற்கல்வி ஆணைக்குழு
TERTIARY AND VOCATIONAL EDUCATION COMMISSION

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
MINISTRY OF EDUCATION

කොමිෂන් සභා තොරතුරු

ආයතනය	තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
අමාත්‍යාංශය	අධ්‍යාපන අමාත්‍යාංශය
ලිපිනය	තුන්වන මහල, නිපුණතා පියස, 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05.
විද්‍යුත් ලිපිනය	info@tvec.gov.lk
වෙබ් අඩවිය	www.tvec.gov.lk
දුරකථන අංකය	011-7608000
ෆැක්ස් අංකය	011-2555007
විගණකවරු	විගණකාධිපති විගණකාධිපති දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල.
බැංකුකරුවන්	මහජන බැංකුව, වයි. එම්. බී. ඒ. ශාඛාව, බොරැල්ල.

වාර්ෂික වාර්තාව

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව පිළිබඳ ඇල්මක් දක්වන පාර්ශවයන් වෙත මෙය ලබාදීම අපේක්ෂාවයි. 2022 වර්ෂය තුළ කොමිෂන් සභාවේ කාර්යභාරය උත්පාදනය කිරීම් පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබාගැනීමට උපායමාර්ග, මූල්‍ය හා මූල්‍ය නොවන කාර්යය සාධනය මඟින් තොරතුරු සපයයි. 2022 ජනවාරි 01 දින සිට 2022 දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා ඉහත තොරතුරු ඇතුළත් වාර්තාවකි.

වාර්තාකරණයේ රාමුව

කොමිෂන් සභාව විසින් වාර්ෂික වාර්තාව පිළියෙළ කිරීමේ දී පහත විවිධ නීති රීති හා මාර්ගෝපදේශ කෙරෙහි අවධානය යොමුකර ඇත.

තිරසර බව වාර්තා කිරීම

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත හා 1999 අංක 50 දරණ සංශෝධිත පනත.

- 1971 අංක 38 දරණ මුදල් පනත (14 වගන්තිය)
- එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs)

මූල්‍ය වාර්තා

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති
- ශ්‍රී ලංකාවේ රාජ්‍ය පොදු ගිණුම්කරණ පද්ධති
- යහපාලනය සඳහා වූ පොදු ව්‍යාපාර මාර්ගෝපදේශය (06 වන පරිච්ඡේදය)
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනත

පටුන

පිටු අංකය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව 1

- පොදු අරමුණු
- දැක්ම
- මෙහෙවර
- වටිනාකම්
- TVEC තත්ත්ව ප්‍රතිපත්තිය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය 2

- පාලක මණ්ඩලයේ වගකීම
- සංයුතිය
  - ජනාධිපතිවරයා විසින් පත්කර ඇති සාමාජිකයින්
  - නිල බලයෙන් පත්කර ඇති සාමාජිකයින්
- කොමිෂන් සභා රැස්වීම් පැවැත්වීම
- පාලක මණ්ඩල සාමාජිකයින්ගේ තොරතුරු

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ තිරසාරභාවය 1991-2022 10

සභාපතිතුමාගේ පණිවිඩය 13

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය 15

අවදානම් තක්සේරු කිරීමේ හා අවම කිරීමේ උපායමාර්ග 17

- SWOT විග්‍රහය
- උපායමාර්ග

මූල්‍ය හා මෙහෙයුම් කාර්යය සාධන 18

මූල්‍ය කාර්යය සාධනය 19

ඇස්තමේන්තුගත වියදම් සහ මහාභාණ්ඩාගාරයේ මූල්‍ය නිදහස් කිරීම

2022 වර්ෂයෙහි සේවාවන් සැපයීම මඟින් උපයන ලද ආදායම

මූල්‍ය විග්‍රහය 2012 - 2022

මෙහෙයුම් කාර්යය සාධනය 21

සැලසුම් සකස් කිරීම

කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ පර්යේෂණ අධ්‍යයන ක්‍රියාත්මක කිරීම

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා ජාතික සංවර්ධන සැලැස්ම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම

වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස් කිරීම හා යාවත්කාලීන කිරීම

ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීම හා පවත්වාගෙන යාම

නිපුණතා සම්මත හා විෂයමාලා

සකස් කරන ලද ජාතික නිපුණතා සම්මත සහ විෂයමාලා - 2022

නව ජාතික නිපුණතා සම්මතය පමණක් සකස් කරන ලද වෘත්තීන් - 2022

යාවත්කාලීන කරන ලද නිපුණතා සම්මත සහ විෂයමාලා -2022

ජාතික නිපුණතා සම්මත හා විෂයමාලා පරිවර්තන කටයුතු

නව නිපුණතා සම්මත එළිදැක්වීමේ වැඩසටහන් පැවැත්වීම

ජාතික නිපුණතා සම්මත සංවර්ධනය කිරීමේ සහ අධීක්ෂණ කමිටු

පුහුණු ආයතන සඳහා තත්ත්ව ආරක්ෂණ ක්‍රමවේද අනුගමනය

වෘත්තීය පුහුණු ආයතන ලියාපදිංචිය

පාඨමාලා ප්‍රතිනය

තත්ත්ව කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කිරීම සහ සහතිකකරණය

තත්ත්ව වැඩි දියුණු කිරීමේ පද්ධතිය ස්ථාපනය කිරීම (QIS)

ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රදානය කිරීම

දැනුම ඇගයීමේ පරීක්ෂණය (Knowledge assessment)

ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 4 ප්‍රදානය කිරීම සඳහා පොදු ලිඛිත විභාගය පැවැත්වීම

ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 5 සහ 6 ලිඛිත විභාග පැවැත්වීම

ප්‍රායෝගික ඇගයීම්

ඇගයීම් නිලධාරි සංචිතය

නිපුණතාපාදක ඇගයීම් කටයුතු

ආබාධ සහිත අපේක්ෂකයින් සඳහා NVQ ඇගයීම්වලදී සිදුකළ යුතු සාධාරණ ගැලපුම් (01/2020 චක්‍රලේඛණයට අනුව) පිළිබඳ ඇගයුම්කරුවන් දැනුවත් කිරීම

ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් නිකුත්කිරීම

2006 සිට 2022 දක්වා නිකුත් කරන ලද මුළු සහතික පත්‍ර ප්‍රමාණය

ජාතික වෘත්තීය සුදුසුකම් ලබා නොදෙන පාඨමාලා, ජාතික වෘත්තීය සුදුසුකම් 5/6 මට්ටම් සමඟ සමාන කිරීම/ගැළපීම

වෘත්තීය පරිණතභාවය සහිත අයදුම්කරුවන් ජාතික වෘත්තීය සුදුසුකම් 5 වන මට්ටමේ සුදුසුකමට සමානකිරීම

පහත දක්වා ඇති සහතිකපත්‍ර සඳහා එම සහතිකපත්‍රලාභීන්ගේ ඉල්ලීම් අනුව ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් සමාන කිරීමේ සහතික නිකුත් කිරීම

ජාතික වෘත්තීය සහතිකපත් නිකුත් කිරීම පිළිබඳ වැඩසටහන්

පෙරදැනුම් ඇගයීමේ ක්‍රමය පිළිබඳව ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවත්වීම

නිපුණතා පාදක ඇගයීම්වල සංඝතභාවය තහවුරු කිරීමේ වැඩසටහන්

තොරතුරු පද්ධති 43

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය සංවර්ධනය හා පවත්වාගෙන යාම

ශ්‍රම වෙළෙඳ පොළ තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීම හා පවත්වාගෙන යාම

ශ්‍රම වෙළෙඳ පොළ තොරතුරු වෙබ් පිටුව

ලියාපදිංචි හා ප්‍රතීතන වෙබ් පිටුව

NVQ තොරතුරු පද්ධති මෘදුකාංගය නව අංගයන් එකතු කරමින් වැඩිදියුණු කිරීම

අන්තර්ජාලය, විද්‍යුත් තැපෑල හා පහසුකම්

කොමිෂන් සභාවේ පුස්තකාලය

පුහුණු සැසි පැවැත්වීම

කර්මාන්ත සබඳතා 47

හැඳින්වීම

ආංශික නිපුණතා සහා පවත්වාගෙන යාම

ඉදිකිරීම් කර්මාන්ත ආංශික නිපුණතා සභාව

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්ත ආංශික නිපුණතා සභාව

නිෂ්පාදන හා ඉංජිනේරු සේවා ආංශික නිපුණතා සභාව

සංචාරක කර්මාන්ත ආංශික නිපුණතා සභාව

කෘෂිකර්මාන්ත ආංශික නිපුණතා සභාව

සෞඛ්‍ය හා රැකවරණ සේවා කමිටුව

ආංශික නිපුණතා සභාවන්හි ප්‍රගති සමාලෝචනය

විශේෂ වැඩසටහන්

දිස්ත්‍රික් මට්ටමේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළු

RPL ක්‍රමවේදය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම

කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ආධාර සපයන ව්‍යාපෘති/ වැඩසටහන් සමඟ කටයුතු කිරීම.

ප්‍රකාශන 55

ශ්‍රම වෙළෙඳ පොළ තොරතුරු ප්‍රකාශනය

කාර්මික හා වෘත්තීය අධ්‍යාපන / පුහුණු මාර්ගෝපදේෂය (TVET Guide)

TVEC පුවත් ලිපිය

ජාතික නිපුණතා මෙහෙයුම් අත්පොත

කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු කේෂ්ත්‍රයේ පර්යේෂණ අධ්‍යයන

කොමිෂන් සභාවේ මානව සම්පත 57

කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලය - 2022

2022 වසරේ පත්වීම්

2022 වසරේ සේවයෙන් ඉවත්වීම්/විශ්‍රාම ගැනීම

2022 වර්ෂය තුළ ක්‍රියාත්මක වූ වැඩ බැලීමේ / වැඩ ආවරණය කිරීමේ තනතුරු සඳහා කොමිෂන් සභාව තුළින් තේරී පත් වූ නිළධාරීන්

දේශීය පුහුණු

වාර්ෂික වෘත්තීය සාමාජික ගාස්තු ප්‍රතිපූර්ණය

අභ්‍යන්තර විගණන හා විමර්ශනය 61

විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව 61

2022 වසරේ විගණන හා කළමනාකරණ කමිටුවේ සංයුතිය

නීති කටයුතු 63

පනත සංශෝධනය කිරීමේ ප්‍රගතිය

අවසන් කළ නඩු කටයුතු

ජාතික වෘත්තීය සුදුසුකම් චක්‍රලේඛ

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශය 65

2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 66

2022 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය 67

2022 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 68

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශ සටහන 70

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශ උප සටහන් 76

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශ උප ලේඛන 82

විගනණාකාධිපති වාර්තාව 85

විගණකාධිපති වාර්තාවේ පැහැදිලි කිරීම් හා පිළිතුරු 93

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) 1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතේ විධිවිධාන යටතේ, කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු අංශයේ නියාමන ආයතනය ලෙස 1991 දී ස්ථාපනය කරන ලද අතර, 1999 අංක 50 දරණ සංශෝධිත පනත මඟින් TVET ආශ්‍රිත පර්යේෂණ පැවැත්වීම, ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු පද්ධතිය දියුණු කිරීම, ප්‍රදාන ලබාදීම සහ TVET අංශයේ පරීක්ෂණ ඇතුළු තත්ත්ව සහතික සඳහා පද්ධති ස්ථාපිත කිරීම පිණිස වැඩි බලතල සහිතව සංශෝධනය කරන ලදී. එහි මූලික වගකීම් වන්නේ ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම්කරණය, තත්ත්ව ආරක්ෂණය සහ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනය රට තුළ සම්බන්ධීකරණය කිරීම සහ සංවර්ධනය කිරීම තුළින් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනයේ ගුණාත්මය ඉහළ මට්ටමක පවත්වා ගැනීම ප්‍රමුඛව කටයුතු කිරීමයි.

පොදු අරමුණු

a. ආර්ථිකයේ මිනිස් සම්පත් අවශ්‍යතාවලට සරිලන අයුරින් සියළුම මට්ටම්වල තෘතීයික අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපන ක්‍රමය සැලසුම් කිරීම, සම්බන්ධීකරණය සහ සංවර්ධනය කිරීම.

b. සහතික පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ඇතුළුව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ප්‍රදානයන් පිරිනැමීම සඳහා ජාතික වශයෙන් පිළිගත් ක්‍රමයක් සංවර්ධනය කිරීම, සහ

c. තෘතීයික අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනය සලස්වන ශිල්ප ආයතන, නියෝජ්‍ය ආයතන සහ වෙනත් සියළු ආයතනවල ශාස්ත්‍රීය හා පුහුණුවීම් සම්මතයක් පවත්වාගෙන යාම.

දැක්ම

රටේ මානව සම්පත් සංවර්ධන අවශ්‍යතා සපුරාලන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන සහ පුහුණුව පිළිබඳ ඉහළම ප්‍රමිතීන් කරා සියළුම පුරවැසියන්ට ප්‍රවේශ විය හැකි ශ්‍රී ලංකාවක්

මෙහෙවර

TVET අංශයේ නියාමන ආයතනය ලෙස, සමාජ ආර්ථික අරමුණු හා වෙනස්වන වෙළඳපොළ අවශ්‍යතාවන්ට අනුකූලව කාර්යක්ෂම හා ඵලදායී තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපිත කර පවත්වාගෙන යාම.

වටිනාකම්

කොමිෂන් සභාව එහි ඇල්මැති පාර්ශවයන් සමඟ වැඩ කිරීම තුළින් ඉහළ ගුණාත්මකභාවය සඳහා කැපවීම, ඉහළ අඛණ්ඩතාවයක් සඳහා කැපවීම, නවෝත්පාදනය, කණ්ඩායම් හැඟීම, නව තාක්ෂණය, වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අනුකූලතාවය සහ සමානව සැළකීම,

TVEC තත්ත්ව ප්‍රතිපත්තිය

NVQ සුදුසුකම් සඳහා ප්‍රතිතනය වී ඇති පාඨමාලා පිළිබඳ පුහුණු සපයන්නන් සහ අප සමඟ ලියාපදිංචි වී ඇති වෘත්තීය පුහුණුව සපයන්නන් සඳහා අප විසින් ලබාදෙන සේවාවන්වල තත්ත්වය සහතික කරන්නෙමු.

අප සපයන සේවාවල තත්ත්වය පවත්වාගෙන යාම සහ එය සහතික කිරීම සඳහා ISO 9001:2008 අනුකූල පරිදි තත්ත්ව කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කළෙමු. තත්ත්ව කළමනාකරණ පද්ධතියේ සහ අප සේවාවන්වල සඵලතාවය නිරන්තරව වැඩිදියුණු කර ගැනීම සඳහා අපි උත්සාහ දරන්නෙමු.

TVEC ඒකාබද්ධ අරමුණු සාක්ෂාත් කරගැනීමට එහි අවට පරිසරය ආරක්ෂා කරගැනීම සඳහාත් අපි මානව සම්පත් කළමනාකරණ පද්ධතියක් පවත්වාගෙන යන්නෙමු.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය

පාලක මණ්ඩලයේ වගකීම

කොමිෂන් සභා පනතේ අරමුණු ඉටුකරගැනීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පුහුණුව සම්බන්ධ සමස්ථ ක්‍රියාවලියම නියාමනය, මෙහෙයවීම, මඟපෙන්වීම, අධීක්ෂණය හා ඒ සම්බන්ධ ඇගයීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමයි.

සංයුතිය

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මෙම කොමිෂන් සභාව 1999 අංක 50 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන (සංශෝධන) පනතේ දැක්වෙන විධි විධාන අනුව ජනාධිපතිවරයා පත් කරනු ලබන සභාපතිවරයෙකු ඇතුළු සාමාජිකයන් 11 දෙනෙකුගෙන් ද නිල බලයෙන් 06දෙනෙකු ලෙසද සාමාජිකයින් 17 දෙනෙකුගෙන් සමන්විත වේ.

ජනාධිපතිවරයා විසින් පත්කර ඇති සාමාජිකයින්

- ආචාර්ය(ඉංජිනේරු) උදේනි වික්‍රමසිංහ මහතා - සභාපති
- මහාචාර්ය ටී.එම්. බන්දුල පාලවත්ත මහතා - සාමාජික
- එම්.ජී.කේ.එම්. ප්‍රනාන්දු මහතා - සාමාජික
- පී.ඒ.ඩී.ආර්. චන්ද්‍රසිරි මහතා - සාමාජික
- කනිෂ්ක වීරසිංහ මහතා - සාමාජික
- මහාචාර්ය එන්.ආර්. අබේනායක මහත්මිය - සාමාජික
- ජයන්ත විජේසිංහ මහතා - සාමාජික
- මංජුල හිරන්යා ද සිල්වා මහතා - සාමාජික
- මහාචාර්ය සුදන්ත ලියනගේ මහතා - සාමාජික
- මහාචාර්ය එච්.එච්. සුමතිපාල මහතා - සාමාජික
- සරත් චන්ද්‍ර මොහොට්ටි මහතා - සාමාජික

නිල බලයෙන් කර ඇති පත්ව ඇති සාමාජිකයින් :

- ආචාර්ය කේ.ඒ. ලලිතධීර මහතා - සාමාජික
  අධ්‍යක්ෂ ජනරාල් - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
- තරංග නලීන් ගම්ලත් මහතා - සාමාජික
  සභාපති - ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය
  (2020.02.06 සිට 2022.08.30 දක්වා)
- රුචික අමරසේකර මහතා - සාමාජික
  සභාපති - ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය (2022.09.30 සිට)
- එරන්ද බස්නායක මහතා - සාමාජික
  සභාපති - ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය (2021.07.07 සිට 2022.11.17 දක්වා)
- ඒ.ටී.යූ. කැප්පෙටිපොළ - සාමාජික
  සභාපති - ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය (2022.11.17 සිට)
- එස්.සී. ජගත් මහතා - සාමාජික
  අධ්‍යක්ෂ ජනරාල් - කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
- මහාචාර්ය කේ. එල්. ජයරත්න මහතා - සාමාජික
  අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය
  (2020.02.06 සිට 2022.08.30 දක්වා)
- මහාචාර්ය සී. මහේෂ් එදිරිසිංහ මහතා - සාමාජික
  අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (2022.09.30 සිට)
- ගීතා විමලවීර මහත්මිය - සාමාජික
  මුදල් අමාත්‍යාංශය - මහා භාණ්ඩාගාර නියෝජිත (2020.02.06 සිට 2022.02.25 දක්වා)
- හර්ෂනි සමරසිංහ මහත්මිය - සාමාජික
  මුදල් අමාත්‍යාංශය - මහා භාණ්ඩාගාර නියෝජිත (2020.03.25 සිට 2022.08.30 දක්වා)
- හර්ෂනි ප්‍රනාන්දු මහත්මිය - සාමාජික
  මුදල් අමාත්‍යාංශය - මහා භාණ්ඩාගාර නියෝජිත (2022.09.30 සිට)

කොමිෂන් සභා රැස්වීම පැවැත්වීම

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සහකාර අධ්‍යක්ෂ (නීති) සහ කොමිෂන් සභාවේ ලේකම් වශයෙන් ද කටයුතු කරන අතර 2022 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 13 ක් පවත්වන ලදී.

පාලක මණ්ඩල සාමාජිකයින්ගේ තොරතුරු

ආචාර්ය (ඉංජි.) උදේනි වික්‍රමසිංහ මහතා



විශේෂඥතාවය

යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය

සුදුසුකම්

මොරටුව විශ්ව විද්‍යාලයේ තොරතුරු තාක්ෂණය MSc. උපාධිය, මැන්චෙස්ටර් විශ්වවිද්‍යාලයේ කාර්මික අධ්‍යාපනය හා පුහුණුව සම්බන්ධයෙන් පශ්චාත් උපාධිය (M.Ed), පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ BSc ඉංජිනේරු උපාධිය.

වර්තමාන තත්ත්වය

ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශයේලේකම්වරයෙකු ලෙස සේවය කර පසුව 2021 ජනවාරි 27 සිට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති ලෙස සේවය කරයි.

ආචාර්ය කේ.ඒ.ලලිතධීර මහතා



විශේෂඥතාවය

ආර්ථික විද්‍යාව හා කාර්මික වෘත්තීය අධ්‍යාපනය ක්ෂේත්‍රය

සුදුසුකම්

කොළඹ විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය (PhD) උපාධිය, කොළඹ විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය, රුහුණු විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ ගෞරව උපාධියක් ලබාතිබීම. වෘත්තීය කළමනාකරණ ආයතනයේ (FCPM) පූර්ණ සාමාජිකත්වය ලබාතිබීම.

වර්තමාන තත්ත්වය

2021 අප්‍රේල් 27 දින සිට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස සේවය කරයි.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ටී.එම්. බන්දුල පාලවත්ත මහතා



විශේෂඥතාවය

මෙහෙයුම් හා තාක්ෂණ කළමනාකරණ සේවා කළමනාකරණ තත්ත්ව කළමනාකරණ

සුදුසුකම්

1981 වර්ෂයේ දී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ගණිතය පිළිබඳ විශේෂ උපාධිය ලබා 1987 වර්ෂයේ දී බෙල්ජියම් ලුවෙන් කතෝලික විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ලබා ඇත.

වර්තමාන තත්ත්වය

1982 වර්ෂයේ දී සිට ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ හා වාණිජ විද්‍යා පීඨයේ ව්‍යාපාර පරිපාලන අලෙවි කළමනාකරණ තොරතුරු තාක්ෂණ හා තීරණ විද්‍යා යන අධ්‍යනාංශවල සේවය කර ඇති අතර දැනට තීරණ විද්‍යා අධ්‍යනාංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයා වශයෙන් සේවය කරනු ලබයි.

එම්.පී.කේ.එම්.ප්‍රනාන්දු මහතා



විශේෂඥතාවය

ශ්‍රී ලංකා පරිපාලන සේවය

සුදුසුකම්

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කලා උපාධිධාරියෙකු හා 1984 වර්ෂයේ සිට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නියතු නිලධාරියෙකු වශයෙන් අමාත්‍යාංශ ගණනාවක සේවය කර ඇත.

වර්තමාන තත්ත්වය

2019 -2020 වර්ෂවල ජාතික වැටුප් සේවක කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් කටයුතු කර ඇති අතර මේ වන විට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ උප සභාපති වශයෙන් කටයුතු කරයි.

පී.ඒ.ඩි.ආර්.චන්ද්‍රසිරි මහතා



විශේෂඥතාව

සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය

සුදුසුකම්

මොරටුව විශ්ව විද්‍යාලයයේ ජාතික තාක්ෂණ ඩිප්ලෝමාධාරියෙකු හා එංගලන්තයේ සිටි ඇන්ඩ් ගිල්ඩිස් ආයතනයේ සිවිල් ඉංජිනේරු උපාධිධාරියෙකි. ශ්‍රී ලංකා සංස්ථාගත ඉංජිනේරු ආයතනයේ හා ශ්‍රී ලංකා වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙකි.

වර්තමාන තත්ත්වය

ශ්‍රී ලංකා සංස්ථාගත ඉංජිනේරුවන්ගේ ආයතනයේ ප්‍රතීතන මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි. ශ්‍රී ලංකා ඉංජිනේරුවන්ගේ සභාවේ වර්තමාන සාමාජිකයෙකි. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සහතික ලත් කම්ටුවේ (Credential Committee) සාමාජිකයෙකු ද වේ.

කනිෂ්ක වීරසිංහ මහතා



විශේෂඥතාවය

නීතිඥ වෘත්තීය

සුදුසුකම්

ඔහු ශාස්ත්‍රපති උපාධියක් ඇතුළුව ජාත්‍යන්තර සබඳතා / කටයුතු පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ඇත. සිංගප්පූරු ජාතික විශ්ව විද්‍යාලයෙන් (NUS) කළමනාකරණය පිළිබඳ විධායක අධ්‍යාපනය ලබා ඇත. ඔහු දැනට ජාත්‍යන්තර සබඳතා (ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන් පිළිබඳ) පිළිබඳ ආචාර්ය උපාධියක් හදාරමින් සිටී.

වර්තමාන තත්ත්වය

ලංකා සේවා යෝජකයින්ගේ සම්මේලනයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් / ප්‍රධාන විධායක නිලධාරියෙකු වූ ඔහු 2021 මාර්තු මාසයේ දී ධූරයෙන් ඉවත් වී නැවත පුද්ගලික නීතිඥ වෘත්තීය වෙත පැමිණියේය.

මහාචාර්ය එන්.ආර්.අබේනායක මහත්මිය



විශේෂඥතාවය

ව්‍යවහාරික සංඛ්‍යාලේඛන ක්ෂේත්‍රය

සුදුසුකම්

2017 වසරේ දී මහාචාර්ය තනතුරට පත් වූ ඇය, 1995 වසරේ දී පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී (B.Sc. Hons) උපාධිය ද, 2001 වසරේ දී ශාස්ත්‍රපති උපාධිය ද (M.Sc), ඉන්දියාවේ නවදිල්ලියේ, ඉන්දියානු කෘෂිකාර්මික සංඛ්‍යාලේඛන ආයතනයෙන් 2008 වසරේ දී ආචාර්ය උපාධිය (Ph.D) ද ලබා ගත්තේය.

වර්තමාන තත්ත්වය

දැනට ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශයේ ව්‍යවහාරික සංඛ්‍යාලේඛන පිළිබඳ මහාචාර්යවරයකු ලෙස සේවය කරන අතර ඇයගේ සප්ත වාර්ෂික නිවාඩු සඳහා එංගලන්තය මැන්චෙස්ටේර් මෙට්‍රොපොලිටන්ට් විශ්වවිද්‍යාලයේ ආරධිත මහාචාර්යවරියක් ලෙස සේවයකරයි. කෘෂි ව්‍යාපාර කළමනාකරණ දෙපාර්තමේන්තුවේ (ABM) ප්‍රධානියා ලෙසත්, ශ්‍රී ලංකා ව්‍යවහාරික සංඛ්‍යාලේඛන ආයතනයේ (IASSL) සභාපතිනිය ලෙසත් සේවය සේවය කර ඇත.

ජයන්ත විජේසිංහ මහතා



විශේෂඥතාවය

වෘත්තීය සමිති හා සේවක සබඳතා

සුදුසුකම්

ඔහු BA පළමු කොටස කැලණිය විශ්වවිද්‍යාලයේ හදාරා ඇති අතර ජන සන්නිවේදනය සහ සමාජ සංවර්ධනය පිළිබඳ ධර්මවේද ඩිප්ලෝමාවක් ද හදාරා ඇත.

වර්තමාන තත්ත්වය

පළාත් සභා සහ පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති වෘත්තීය සමිති හා සේවක සබඳතා අංශයේ සහකාර ලේකම් වශයෙන් හා සීමාසහිත කළුබෝවිටියන තේ කර්මාන්තශාලාවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික මෙන්ම එම තේ කර්මාන්තශාලාවේ ම විගණන කමිටු සාමාජික ලෙස කටයුතු කරයි.

මංජුල ද සිල්වා මහතා



විශේෂඥතාව

ගණකාධිකරණය හා කළමනාකරණය

සුදුසුකම්

කොළඹ විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ගෞරව උපාධියක් ද ලන්ඩන් විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද ලබා ඇත. තවද ඔහු වරලත් කළමනාකරණ ගණකාධිකාරවරයෙකු ද වේ.

වර්තමාන තත්ත්වය

2023 ජනවාරි 31 දින තෙක් වර්ෂ තුනක කාලයක් ලංකා වාණිජ මණ්ඩලයේ මහලේකම් හා ප්‍රධාන විධායක නිලධාරී ලෙස කටයුතු කරනු ඇත. දැනට සී/සෙන්ට්‍රල් ෆිනෑන්ස් සමාගමේ හා සී/BPPL හෝල්ඩිංග් සමාගමේ අධ්‍යක්ෂවරයෙක් ලෙස කටයුතු කරයි. කොළඹ විශ්ව විද්‍යාලය, සණස විශ්ව විද්‍යාලය, ඕස්ට්‍රේලියාවේ ඊඩිත් කෝවන් (EDITH COWAN) විශ්ව විද්‍යාලය ඇතුළු උසස් අධ්‍යාපන ආයතන කිහිපයකම බාහිර කථිකාචාර්යවරයෙකි.

මහාචාර්ය සුදන්ත ලියනගේ මහතා



විශේෂඥතාවය

රසායන විද්‍යාව, රසායනික කර්මාන්ත ක්ෂේත්‍රය, අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය, මැතිවරණ ක්‍රම සහ ප්‍රතිපත්ති ආදී ක්ෂේත්‍ර ගණනාවක අත්දැකීම් රැසක් සහිත මහාචාර්යවරයෙකි.

සුදුසුකම්

ආචාර්ය උපාධිය - එක්සත් රාජ්‍යයේ වේල්ස් හි කාඩිෆ් විශ්වවිද්‍යාලය

පශ්චාත් ආචාර්ය උපාධිය - ඕස්ට්‍රේලියාවේ ඇඩිලේඩ් විශ්වවිද්‍යාලය, ජපානයේ ඉබරාකි විශ්වවිද්‍යාලය

රසායන විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

වර්තමාන තත්ත්වය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 26 වන උපකුලපති ලෙස 2020 ජනවාරි සිට 2022 දෙසැම්බර් දක්වා පත් වී ඇත.

එක්සත් රාජධානියේ පොදු රාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල සංගමයේ පාලක සභාවේ සාමාජිකයෙකු ලෙසට 2022 අගෝස්තු මස පළවෙනි දින සිට අවුරුදු තුනක කාලයකට පත්වී ඇත.

මහාචාර්ය එච්.එච්.සුමතිපාල මහතා



විශේෂඥතාවය

භෞතික විද්‍යාව

සුදුසුකම්

2020 දී භෞතික විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයා තනතුරට පත් වූ මොහු 1986 දී ඔහුගේ දර්ශනපති උපාධිය (Ph.D.) සම්පූර්ණ කර ඇත. පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයට සම්බන්ධ වී ඇත. 1985 දී භෞතික විද්‍යාව පිළිබඳ B.Sc (විශේෂ) දෙවන පන්තියේ (ඉහළ අංශය) ගෞරව සහිත උපාධිධරයෙකි.

සුදුසුකම්

ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ (IAEA) තාක්ෂණික සහයෝගිතා අංශයේ සම්බන්ධීකරණයෙන් න්‍යෂ්ටික තාක්ෂණය පිළිබඳ අධ්‍යාපනය සඳහා වූ ආසියානු ජාලයේ (ANENT) ව්‍යාපෘතියක් වන ජාත්‍යන්තර න්‍යෂ්ටික විද්‍යා ඔලිම්පියාඩ් (INSO) හි මෙහෙයුම් කමිටුවේ සාමාජිකයෙක් වන අතර ජාත්‍යන්තර කනිෂ්ඨ විද්‍යා ඔලිම්පියාඩ් (IJSO) හි ශ්‍රී ලංකාවේ සම්බන්ධීකාරක ලෙස ක්‍රියා කරයි.

සරත් චන්ද්‍ර මොහොට්ටි මහතා



විශේෂඥතාවය

හෝටල් හා සංචාරක ක්ෂේත්‍රය

වර්තමාන තත්ත්වය

ගලධාරි හෝටලය, ගෝල්ෆේස් හෝටලය හා වෝටර්ස්ඒජ් හෝටලයේ සාමාන්‍යාධිකාරි හා Sri Lanka Tourism and Hotel Management ආයතනයේ සභාපති තනතුර දරා ඇත. Commonwealth Hotel Association හි කළමනාකරණ අධ්‍යක්ෂ ලෙස ද කටයුතු කරයි.

රුචික අමරසේකර මහතා



වර්තමාන තත්ත්වය

සභාපති ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය

ඒ.ටි.යු. කැප්පෙටිපොළ



විශේෂඥතාවය

ඉලෙක්ට්‍රොනික ඉන්ජිනේරු

සුදුසුකම්

උපාලි කැප්පෙටිපොළ මහතා Tokyo Denshi Kougakuin - Japan විශ්වවිද්‍යාලයෙන් Bsc ඉන්ජිනේරු උපාධිය හදාරා ඇත.

වර්තමාන තත්ත්වය

උපාලි කැප්පෙටිපොළ මහතා අධ්‍යාපන අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ වත්මන් සභාපතිවරයා වේ.

එස්.සී.ජගත් මහතා



විශේෂඥතාවය

කළමනාකරණ හා ආර්ථික විද්‍යා ක්ෂේත්‍රය

සුදුසුකම්

ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ BSc කළමනාකරණ උපාධිය හා ආර්ථික විද්‍යාව හා ජාත්‍යන්තර වෙළඳාම සම්බන්ධයෙන් වූ MSc උපාධිය (දකුණු කොරියාව)

වර්තමාන තත්ත්වය

එස්.සී. ජගත් මහතා කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ වත්මන් අධ්‍යක්ෂ ජනරාල්වරයා වේ.

මහාචාර්ය සී.මහේෂ් එදිරිසිංහ මහතා



විශේෂඥතාවය

ඉංජිනේරු භෞතික විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයෙකි.

සුදුසුකම්

මහාචාර්ය එදිරිසිංහ මහතා ශ්‍රී ලංකා කොළඹ විශ්වවිද්‍යාලයෙන් භෞතික විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය සහ ආචාර්ය උපාධිය හදාරා ඇති අතර 2007 දී ස්වීඩනයේ උප්සලා විශ්වවිද්‍යාලය සහ කොළඹ විශ්ව විද්‍යාලය අතර බෙදීම් පර්යේෂණ වැඩසටහනක් යටතේ අකුණු ආරක්ෂණය පිළිබඳ උපාධිය ද ඔහු 2016 දී එක්සත් රාජධානියේ ලන්ඩන් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය සම්පූර්ණ කර ඇත.

වර්තමාන තත්ත්වය

මහාචාර්ය එදිරිසිංහ මහතා අධ්‍යාපන අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ වත්මන් අධ්‍යක්ෂ ජනරාල්වරයා වේ.

හර්ෂනි ප්‍රනාන්දු මහත්මිය



විශේෂඥතාවය

ගණකාධිකරණය හා පරිපාලනය

සුදුසුකම්

කැළණිය විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යා අංශයේ පශ්චාත් උපාධිධාරිනියකි. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලන අංශයෙන් විද්‍යාවේදී විශේෂ උපාධියක් සම්පූර්ණ කර ඇත.

වර්තමාන තත්ත්වය

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ පළමුවන පංතියේ නිළධාරිනියක් වන අතර, වර්තමානයේ මුදල් අමාත්‍යාංශයේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරියක් වශයෙන් සේවය කරයි.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ තිරසාරභාවය 1991-2022

කොමිෂන් සභාව ස්ථාපිත කළ දින සිට අද දක්වා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පුහුණුව හා එහි ගුණාත්මය නඟා සිටුවීම සඳහා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරමින් සිටී. එම සුවිශේෂී කාර්යයන්ගේ සංක්ෂිප්ත සටහනකි.

1992

පුහුණු ආයතන සඳහා අන්තර්කාලීන ලියාපදිංචි කිරීම

1995

පුහුණු ආයතන ලියාපදිංචි කිරීම සඳහා සංවර්ධන සැලැස්ම (විශේෂ ගැසට් නිවේදනයක් 1995 සැප්තැම්බර් 07 නිකුත් කරන ලදී)

1998

ආයතන ලියාපදිංචිය ආරම්භය (“P” අංකය නිකුත් කිරීම)

ශ්‍රම වෙළඳපළ තොරතුරු ප්‍රකාශය නිකුත් කිරීම

1999 අංක 50 දරණ පනත

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව අමතර බලතල සහිතව ව්‍යවස්ථාපිත මණ්ඩලයක් බවට පත් කිරීම.

1999

දියුණු වන කර්මාන්ත ක්ෂේත්‍ර සඳහා වෘත්තීය පුහුණු සැලසුම් සංවර්ධනය කිරීම ආරම්භ කිරීම

2000

ජාතික කුසලතාව මත පුහුණු වැඩසටහන් ප්‍රතිනතය කිරීම

2003

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය සංවර්ධනය කිරීම හා විද්‍යුත් තැපෑල ප්‍රථම වරට එළිදැක්වීම.

2004

ශ්‍රී ලංකාවේ ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව ස්ථාපිත කිරීම

2005

කොමිෂන් සභාවේ පර්යේෂණ කවය ආරම්භ කිරීම

2006

පෞද්ගලික සහ රාජ්‍ය නොවන සංවිධානයන්හි පවත්වාගෙන යනු ලබන පුහුණු වැඩසටහන් ප්‍රතිනතය ආරම්භ කිරීම හා ඒ සමඟම NVQ සුදුසුකම් ප්‍රදානය ආරම්භ කිරීම. ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමවේදය අනිකතුත් රටවල් සමඟ සම්බන්ධීකරණයක් ඇතිකර ගැනීම.

2007

පළාත්බද වෘත්තීය පුහුණු සැලසුම් සකස් කිරීම ආරම්භ කිරීම

පළමු ජාතික වෘත්තීය සුදුසුකම් සහතික පත්‍රය පිරිනැමීමේ උත්සවය 2007 පෙබරවාරි මස පැවැත්වීම

2008

වෘත්තීය පුහුණුවහි නියැලෙන පීඩාවට පත් වූ කණ්ඩායම් සඳහා මූල්‍යාධාර ලබාදීම ආරම්භ කිරීම

2009

ප්‍රතිනයලත් පෞද්ගලික පුහුණු ආයතන විසින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය සඳහා රාජ්‍ය ලාංඡනය භාවිත කිරීමට අවසර ලබාදීම

ඇගයීම්කරුවන්ගේ දත්ත සංචිතය පවත්වාගෙන යාම හා ඇගයීම්කරුවන් පුහුණු කිරීම ප්‍රවර්ධනය කිරීම

2011

ජාතික වෘත්තීය සුදුසුකම් පිළිබඳ පොදු චක්‍රලේඛ කොමිෂන් සභා වෙබ් අඩවියට ඇතුළත් කිරීම

ජාතික වෘත්තීය සුදුසුකම් සමානතා සහතික ලබාදීම

2012

කොමිෂන් සභාවෙහි විභාග හා ඇගයීම් අංශයක් පැවැත්වීමට අමාත්‍යාංශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අවසර ලබා දීම

2013

මාර්ගගත ලියාපදිංචිය ආරම්භ කිරීම

2016

විද්‍යුත් සහතික හඳුන්වාදීම

2020

පීඩාවට පත් වූ කණ්ඩායම් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම ලබාගැනීමට අදාල ඩිජිටල් ක්‍රමයක් හඳුන්වාදීම

ජාතික වෘත්තීය සුදුසුකම් ලබාගැනීම සඳහා ස්වයංක්‍රීයව ක්‍රමවේදයක් හඳුන්වාදීම

නිපුණතා බලපත්‍රය හඳුන්වාදීම

2021

පළපුරුද්ද මත ජාතික වෘත්තීය සුදුසුකම් ලබා ගැනීම කඩිනම් කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික ක්‍රමයක් හඳුන්වාදීම

NVQ සහතිකය තත්ත්වාරක්ෂණය ඉහළ නංවා QR කේතය සහිතව නිකුත් කිරීම ආරම්භ කිරීම

සභාපතිතුමාගේ පණිවිඩය




2021 වර්ෂයේ ජනවාරි 27 දින සිට මා සභාපතිවරයා වශයෙන් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ රාජකාරි කටයුතු ආරම්භ කරන ලදී.

1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතේ විධිවිධාන යටතේ, කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු අංශයේ නියාමන ආයතනය ලෙස 1991 දී ස්ථාපනය කරන ලද අතර 1999 අංක 50 දරණ සංශෝධිත පනත අනුව කොමිෂන් සභාව විසින් සංවර්ධන සැලසුමක් (Development Plan) සකස් කල යුතු බව සඳහන් ව තිබුණි. මෙම කාර්යය අවසන් කරන ලදී.

2022 වර්ෂය තුළදී නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු ආයතන තුළින් පර්යේෂණ යෝජනා මෙන්ම කෙටි ව්‍යාපෘති සඳහා ද යෝජනා කැඳවන ලදී. පර්යේෂණ සිදු කලද මේ දක්වා සිදු කර ඇති පර්යේෂණයන්හි සඳහන් යෝජනා හා ඉදිරි වැඩපිළිවෙල ක්‍රියාත්මක කරවීමේ අඩුපාඩු හඳුනාගත් බැවින් 2022 වර්ෂයේදී පර්යේෂණවලට අමතර ව කෙටි ව්‍යාපෘති සඳහා ද ඉඩ ප්‍රස්තාව සලසා දෙන ලදී.

වෘත්තීය පුහුණුව සපයන පුහුණු ආයතන මෙම කොමිෂන් සභාව යටතේ ආයතන ලියාපදිංචිය ලබා ගැනීම නෛතික අවශ්‍යතාවයක් වේ. ඒ අනුව දිවයින තුළ ක්‍රියාත්මක වන සියලු වෘත්තීය පුහුණු ආයතන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි විය යුතුයි. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතට අනුව ලියාපදිංචිය සඳහා ඇගයීමේ දී ආයතනයන්හි යටිතල පහසුකම්හි ප්‍රමාණවත් බව පුහුණු උපකරණ සහ ඒවායේ ප්‍රමාණවත් බව උපදේශකයන්ගේ සුදුසුකම්, පුහුණුව ලබා දීමේ ක්‍රමවේදය, විෂය මාලාවන්හි ප්‍රමාණවත් බව ආදී නිර්ණායක පිලිබඳ විමර්ශනය කර ඒ අනුව අදාල නිර්ණායක සපුරන්නේ නම් වර්ෂ දෙකක කාලයකට කොමිෂන් සභාව එම ආයතනය සඳහා ලියාපදිංචිය ලබා දේ.

වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ අවශ්‍යතාවයට ගැලපෙන සැලසුම් සකසා අවසන් වී ඇති අතර, ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. වෘත්තීය පුහුණු ආයතන නියාමනය සඳහා අවශ්‍ය පියවර ගෙන ඇති අතර, නියමිත ප්‍රමිතිය අනුව ක්‍රියා නොකරන ආයතනයන්හි ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවීමට අවශ්‍ය පියවර ගෙන ඇත. ඒ අනුව ආයතනවල කාර්යක්ෂමව සිදු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.



ආචාර්ය (ඉංජි.) උදේනි වික්‍රමසිංහ
සභාපති

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය



කොමිෂන් සභාවේ මූලික පරමාර්ථ අතර ප්‍රතිපත්ති හා සැලසුම් සැකසීම, කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණුවේ ගුණාත්මකභාවය පවත්වාගෙන යාම හා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ප්‍රදානයන් සඳහා ක්‍රමවේදයන් පවත්වාගෙන යාම ආදී කරුණු වේ.

ආයතනයේ අනුමත කාර්යය මණ්ඩලය 116 ක් වුවද පවතින රාජ්‍ය ප්‍රතිපත්ති මත 2022 වර්ෂාවසානයේ සේවක සංඛ්‍යාව 84 දෙනෙක්ට සීමා විය. එම සේවකයින් සඳහා කෙටිකාලීන හා දිගුකාලීන පාඨමාලා හැදෑරීමට අවස්ථාව ලබා දීමට හැකිවිය.

මෙම වර්ෂයේ මහා භාණ්ඩාගාරය මඟින් ආයතනය වෙත ප්‍රාග්ධන වියදම් සඳහා රු.මිලියන 7.540 ක්ද පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 152.725ක්ද නිදහස් කරන ලදී. තවද ආයතනය උපයාගත් සමස්ත ආදායම රුපියල් මිලියන 63.8 ක් විදේශීය ආධාර ව්‍යාපෘති ක්‍රියාත්මක වන S4IG, Youlead, KOICA, ILO යන ආයතනවල සහයෝගය සහිතව ආයතනයේ භෞතික කාර්යය සාධනය ලඟා කරගැනීම සඳහා ඉවහල් විය.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රගමනය සඳහා වන ජාතික සංවර්ධන සැලැස්ම කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන රේඛීය අමාත්‍යාංශ ලේකම් මඟින් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත්කර ජනාධිපතිවරයාගේ අනුමැතිය ලබාගැනීමට අමාත්‍යාංශයට යොමුකර ඇත.

තවද වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම සඳහා වන වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් 21 ක් 2022 වර්ෂය වන විට සකස්කර ඇති අතර සැලසුම් 18 ක් යාවත්කාලීන කර ඇත. එමෙන්ම තෘතීයික අධ්‍යාපනය පිළිබඳ සිදුකරන පර්යේෂණ ඒ සඳහා ඉවහල් වේ. මෙමඟින් TVET හි ඉහළ ගුණත්වයක් ආරක්ෂා කිරීම සඳහා කොමිෂන් සභාව විවිධ පියවර ගෙන ඇත.

වෘත්තීය පුහුණු ආයතන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ගැනීම නෛතික අවශ්‍යතාවයක් වේ. ඒ අනුව 2022 ආයතන 970ක් ඇගයීමට ලක්කර පුහුණු ආයතන 132ක් අළුතින් ලියාපදිංචි කර ඇති අතර, පුහුණු ආයතන 443ක් ලියාපදිංචිය යාවත්කාලීන කිරීමට හැකි විය. එමෙන්ම විදේශගත වන ශ්‍රමිකයන් වෙනුවෙන් කොමිෂන් සභාව ලියාපදිංචිය තහවුරු කිරීමේ ලිපි 2166ක් විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත නිකුත් කර ඇත.

ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා 2022 වසරේ නව ජාතික නිපුණතා සම්මත සහ විෂය මාලාවන් සංඛ්‍යාව 32ක් හා නිපුණතා සම්මත සහ විෂයමාලා 33ක් යාවත්කාලීන කරන ලදී. එමෙන්ම ප්‍රතිනතය කරන ලද මුළු පාඨමාලා සංඛ්‍යාව 1390ක් වේ. නිපුණතාපාදක ඇගයීම් නිලධාරීන් ලෙස ඇගයුම්කරුවන් 299 දෙනෙක් ඇගයීම් සංචිතයට ඇතුළත් කරගන්නා ලද අතර, ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත්‍ර (NVQ) 117,954ක් නිකුත් කර ඇත.

ආංශික නිපුණතා සහා අබණ්ඩව පවත්වාගෙන යාම සඳහා අදාල නිපුණතා සහා සමඟ මනා සම්බන්ධතාවයක් පවත්වාගනිමින් අදාල සියලු පාර්ශවයන්ගේ දායකත්වය සහිතව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලද අතර, අදාල වැය SSD මඟින් ප්‍රතිපූර්ණය කිරීමට අවශ්‍ය කටයුතු ඉටුකරන ලදී.

මෙම වර්ෂයේදී ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශන 02ක් ප්‍රකාශනයට පත්කර ඇති අතර NVQ සහතිකපත්‍රලාභීන් 468 දෙනෙකු සඳහා නිපුණතා බලපත්‍ර නිකුත්කිරීමට කටයුතු කර ඇත.

මෙම ප්‍රධාන තත්ත්ව ආරක්ෂණ ක්‍රමවේද මූලික කරගෙන ඉහළ කාර්යය සාධන මට්ටමක් ළඟාකරගැනීමේ ක්‍රියාවලියේදී මාගේ කාර්යය මණ්ඩලය මෙන්ම පද්ධති හා සම්බන්ධ බාහිර පාර්ශවයන්ගේ දායකත්වය TVET හි ඉහළ තත්ත්ව ආරක්ෂණය පවත්වා ගැනීමට බෙහෙවින් ඉවහල් වූ බව මාගේ විශ්වාසයයි.




ආචාර්ය කේ.ඒ.ලලිතධීර
අධ්‍යක්ෂ ජනරාල්

අවදානම් තක්සේරු කිරීමේ හා අවම කිරීමේ උපායමාර්ග

කොමිෂන් සභාව TVET හි ඉහළ තත්ත්ව ආරක්ෂණයක් පවත්වාගෙන යාමට කටයුතු කිරීමේදී මුහුණ දෙන දේශපාලන, ආර්ථික, සමාජීය, තාක්ෂණික, පාරිසරික සහ නෛතික සාධක සළකා බැලීම තුළින් කොමිෂන් සභාවට ඇතිවන අවදානම් හඳුනාගැනීමටත් එම අවදානම් අවම කරගැනීමට අවශ්‍ය උපායමාර්ග නිශ්චය කිරීමටත් SWOT විග්‍රහය උපයෝගී කරගනී.

SWOT විග්‍රහය



උපායමාර්ග

- පනතේ බලතල බලාත්මක කිරීම හා අවශ්‍ය සංශෝධන සිදුකිරීම
- නව තාක්ෂණය යොදාගනිමින් තොරතුරු පද්ධති ස්වයංක්‍රීය කිරීම
- මහජන ප්‍රචාරණය ඉහළ නැංවීමට අවශ්‍ය පියවර ගැනීම
- ඉහළ තත්ත්ව ආරක්ෂණ පද්ධතියක් ඇති කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ජාත්‍යන්තර සම්බන්ධතා ඉහළ නංවාගැනීමට කටයුතු කිරීම
- සේවක පුහුණුව හා අභිප්‍රේරණය

මූල්‍ය හා මෙහෙයුම් කාර්යය සාධන

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය මඟින් ලබා දෙනු ඇත. ඊට අමතරව කොමිෂන් සභාව විසින් උපයන ආදායම්ද වෙනත් දේශීය /විදේශීය ආයතන විසින් ලබාදෙන ප්‍රදානයන් මඟින්ද කොමිෂන් සභාවේ වියදම් මූල්‍යනය වේ. මෙම මූල්‍ය ප්‍රතිපාදන මඟින් කොමිෂන් සභාවේ කාර්යය සාධනය ලඟාකරගැනීම සඳහා මෙහෙයුම් අංශ 04ක් සහ ඒ සඳහා සහායක අංශ 06ක සහභාගීත්වයෙන් ක්‍රියාකරනු ඇත.

සැලසුම් හා පර්යේෂණ අංශය

වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස් කිරීම, පර්යේෂණ සිදු කිරීම, ශ්‍රම වෙළෙඳපළ තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම

ජාතික වෘත්තීය සුදුසුකම් අංශය

ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික නිපුණතා සම්මත ගොඩනැඟීම සහ කර්මාන්ත අවශ්‍යතාවය හඳුනාගැනීම. ඒ අනුව මෙම නිපුණතා සම්මත හා විෂයමාලා සකස් කිරීම, යාවත්කාලීන කිරීම සහ ජාතික වශයෙන් අනුමත කරගැනීම මෙන්ම අවශ්‍යතාවය අනුව පාඨමාලා ජාතික සුදුසුකම් රාමුව අනුව ගැළපීම.

පුහුණු ආයතන මියාපදිංචි හා පරීක්ෂණ අංශය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම උදෙසා අවශ්‍ය වන්නා වූ පුහුණු මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම, පාඨමාලා ප්‍රතිනය කිරීම සහ පුහුණු මධ්‍යස්ථානයන්හි තත්ත්ව කළමනාකරණ පද්ධති ක්‍රියාත්මක කිරීම.

ඇගයීම් තත්ත්ව ආරක්ෂණ අංශය

ඇගයුම් නිර්ණායක/ක්‍රමවේද සංවර්ධනය හා වැඩිදියුණු කිරීම, ඇගයීම්කරුවන් ලියාපදිංචි කිරීම, පුහුණු කිරීම සහ ඇගයීම් සඳහා ඔවුන් යොමු කිරීම

ලිඛිත ඇගයීම් පැවැත්වීම සහ සම්බන්ධීකරණය

ඇගයීමවල සංඝතභාවය සහ තත්ත්ව සහතික මට්ටම පවත්වාගෙන යාම

කර්මාන්ත සබඳතා අංශය

කාර්මික වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණු ක්ෂේත්‍රයේ ප්‍රගමනය සඳහා අවශ්‍ය කර්මාන්ත තොරතුරු ලබා ගැනීම, කර්මාන්තයේ සම්බන්ධතා ගොඩනැඟීම, මාර්ගෝපදේශ ගොඩනැඟීම සහ ආංශික නිපුණතා සහ සම්බන්ධීකරණය

තොරතුරු පද්ධති අංශය

එක් එක් අංශවල පවත්වාගෙන යන තොරතුරු පද්ධති නවීන තාක්ෂණය අනුව ස්ථාපිත කිරීම, යාවත්කාලීන කිරීම, ගබඩා කිරීම සහ බෙදාහැරීම

පාලන අංශය

රාජ්‍ය ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීම මඟින් මානව සම්පත් කළමනාකරණය, අනෙකුත් අංශ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම සහ ආයතනය සතු වත්කම් ආරක්ෂා වන පරිදි කටයුතු කිරීම

මූල්‍ය අංශය

සියලු මූල්‍ය කාර්යයන් මෙහෙයවීම සහ ඒවා ගිණුම්ගත කරමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සහ ප්‍රකාශයට පත්කිරීම

අභ්‍යන්තර විගණන අංශය

කොමිෂන් සභාවේ මෙහෙයුම්, මූල්‍ය හා අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය නිවැරදිව මෙන්ම ක්‍රමානුකූලව සිදුවන්නේදැයි නිරීක්ෂණය කිරීම සහ ඒවා වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබාදීම සහ ආයතනයේ වත්කම්වල ආරක්ෂාව සහතික කිරීම

නීති අංශය


අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම සහ කොමිෂන් සභාවේ මෙහෙයුම් කාර්යයන් වලදී මෙන්ම අනිකුත් අවස්ථාවන්වලදී අවශ්‍ය නීතිමය කටයුතු සිදුකිරීම

මූල්‍ය කාර්යය සාධනය

2022 වර්ෂය සඳහා කොමිෂන් සභාවේ පුනරාවර්තන වියදම මිලියන රු.173ක් ද ප්‍රාග්ධන වියදම මිලියන 10ක් ද ලෙස සමස්ථ ඇස්තමේන්තු වියදම රු.මිලියන 183කි. ඒ අනුව මහාභාණ්ඩාගාරය විසින් කොමිෂන් සභාව වෙත පුනරාවර්තන වියදම සඳහා රුපියල් මිලියන 152,725 ක් ද ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 7,540 ක්ද නිදහස් කර තිබුණි.

ඇස්තමේන්තුගත වියදම් සහ මහාභාණ්ඩාගාරයේ මූල්‍ය නිදහස් කිරීම

විස්තරය	ඇස්මේන්තුව (රු.මිලියන)	භාණ්ඩාගාර මූල්‍ය නිදහස් කිරීම (රු.මිලියන)
පුනරාවර්තන	173,000	152,725
ප්‍රාග්ධන	10,000	7,540



2022 වර්ෂයෙහි සේවාවන් සැපයීම මඟින් උපයනලද ආදායම

	ඇස්තමේන්තුගත ආදායම (රු.මිලියන)	සත්‍ය ආදායම (රු.මිලියන)
ආයතන ලියාපදිංචි ආදායම	1.463	3.584
ආයතන ප්‍රතීතන හා ඇගයුම්	0.600	2.138
සහතිකපත් නිකුත් කිරීම	3.850	13.919
සහතිකපත් සැසඳීම	0.100	0.397
ජාතික වෘත්තීය සුදුසුකම් සහතික කිරීම	0.900	2.166
විභාග ගාස්තු	29.400	35.942
නිපුණතා බලපත්‍ර ආදායම	0.100	0.247
ශිෂ්‍ය වාර්තාපොත් අලෙවිය	3.375	3.764
ඇගයුම් ගාස්තු සහ කබා අලෙවිය	2.600	1.447
අනෙකුත් පොත් අලෙවිය	0.012	0.030
තත්ත්ව කළමනාකරණ සහතික කිරීම	0.750	0.100
ආංශික සභා සම්මුඛ පරීක්ෂණය	-	0.037
මුළු ආදායම	43.150	63.771

මූල්‍ය විග්‍රහය 2012 - 2022

	2012	2013	2014	2015	2016	2017	2018	2019	2020	2021	2022
ලැබීම්	70.877	77.906	118.45	127.516	168.629	198.644	234.263	222.693	193.478	184.59	234.886
ප්‍රාග්ධන වියදම්	10.81	13.71	15.11	9.42	12.24	14.35	8.18	8.6	5.01	7.06	7.49
පුනරාවර්තන වියදම	54.76	59.62	77.89	91.52	120.8	124.31	142.72	163.09	138.33	167.04	202.3
ව්‍යාපෘති වියදම්	8.054	11.17	26.191	27.526	42.166	49.797	54.068	40.188	29.061	18.978	8.955
අතිරික්තය/ (ඌනතාවය)	-2.747	-6.594	-0.741	-0.95	-6.577	10.187	29.295	10.815	21.077	-8.488	16.141
ශුද්ධ ස්ථාවර වත්කම්	43.715	35.248	46.246	35.772	34.88	34.567	29.296	27.087	19.472	16.717	105.635
ජංගම වත්කම්	16.308	19.882	20.938	20.725	31.84	38.935	65.458	84.688	108.423	108.756	128.952
හිමිකම්	4.038	-1.309	0.801	-1.141	0.474	14.975	37.311	52.841	73.222	65.563	81.512
වෙන්කිරීම්	6.557	7.671	9.614	12.985	11.968	13.71	16.757	20.582	24.957	25.748	26.859
ජංගම වගකීම්	5.712	13.519	10.522	8.881	19.397	10.25	11.389	11.264	10.244	17.444	20.581

මෙහෙයුම් කාර්යය සාධනය

සැලසුම් සකස් කිරීම

ශ්‍රී ලංකාවේ ආර්ථික හා මානව සම්පත් සංවර්ධන අවශ්‍යතාවන් අනුව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පර්යේෂණ සිදු කිරීම, සැලසුම් කිරීම, සම්බන්ධීකරණය සහ සංවර්ධනය කිරීම, වෘත්තීය පුහුණු සැලැස්ම සකස් කිරීම, ජාතික සංවර්ධන සැලැස්ම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ ශ්‍රම වෙළෙඳපළ තොරතුරු ප්‍රකාශ නිකුත් කිරීම තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියමු ආයතනය ලෙස අප ඉටු කරනු ඇත.

කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ පර්යේෂණ අධ්‍යයන ක්‍රියාත්මක කිරීම

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ පර්යේෂණ කවය (Research Cell) මඟින් පර්යේෂණ සිදුකිරීම හා මෙහෙයවීම සිදු කරනු ඇත. එමෙන්ම විවිධ ආයතන නියෝජනය කරමින් ද පර්යේෂණ සිදුකරන අතර, එම පර්යේෂණ අධ්‍යයනවල ගුණාත්මකභාවය රැකගැනීම සඳහා පර්යේෂණ කටයුතු මෙහෙයවීම හා අවශ්‍ය උපදෙස් ලබාදීම සිදු කරනු ඇත. 2005 වර්ෂයේ සිට ආරම්භ කරන ලද පර්යේෂණ කවය මේවන විට කාර්මික හා වෘත්තීය ක්ෂේත්‍රයට වැදගත් පර්යේෂණ රාශියක් (www.tvec.gov.lk) එළිදක්වා ඇත.

නව පර්යේෂණ අධ්‍යයන- 2022

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයට අයත් පුහුණු ආයතන තුළින් පර්යේෂණ යෝජනා 2021 වර්ෂයේදී කැඳවා තිබුණි. එම යෝජනාවලින් යෝජනා 12ක් පර්යේෂණ සිදු කිරීම සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇත. එම පර්යේෂණවලින් පර්යේෂණ 07ක් සඳහා 2022 වර්ෂයේදී මූලික ගෙවීම් සිදුකර පර්යේෂණ ඉටුකිරීම ආරම්භකර ඇත. 2022 වර්ෂය අවසන් වන විට පර්යේෂණ 04 ක දළ වාර්ථා කොමිෂන් සභාව වෙත ලැබී ඇත. අදාල සම්පූර්ණ පර්යේෂණ 2023 වර්ෂයේ මුල් කාර්තුවේදී නිම කිරීමට සැලසුම්කර ඇත.

අංක	පර්යේෂණයේ නම	අරමුණ	පර්යේෂකයා
01	කුරුණෑගල දිස්ත්‍රික්කයේ වෘත්තීය පුහුණු අධ්‍යාපනය ලබන සිසුන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීමට තුඩුදෙන සාධක විශ්ලේෂණය කිරීම.	TVET සිසුන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමේ බලපෑම, ඊට හේතුවන, සිසුන්ගේ පෞරුෂත්වයට එයින් සිදුවන බලපෑම සහ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම අවම කිරීම සඳහා නිර්දේශ යෝජනා කිරීම.	කාර්මික, අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපා-ර්තමේන්තුව
02	ශ්‍රී ලංකාවේ වෘත්තීය පුහුණු අධිකාරිය විසින් මෙහෙයවනු ලබන අධ්‍යයන කාර්යය මණ්ඩලය තුළ උපදේශකවරුන් රඳවා තබා ගැනීමට බලපාන සාධක විමර්ශනය කිරීම.	වෘත්තීය පුහුණු අධිකාරියේ අධ්‍යයන කටයුතු තුළ උපදේශකයින් රඳවා තබා ගැනීම සඳහා ප්‍රධාන නිර්ණායක මොනවාදැයි හඳුනා ගැනීම.	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
03	ඊ-ඉගෙනුම මෙවලමක් ලෙස භාවිත කරමින් ඉගැන්වීමේ ඉගෙනුම් ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම (ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ TVET අංශවල ICT පාඨමාලා අධ්‍යයනය)	විවිධ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පාඨමාලා තුළ ඊ-ඉගෙනුම් පද්ධතිය ස්ථාපිත කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ දුෂ්කරතා හඳුනා ගැනීම.	කාර්මික, අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපා-ර්තමේන්තුව
04	ලංකාවේ දකුණු පළාතේ තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපන සහ පුහුණුව (TVET) යථාර්ථීකරණය සඳහා අවකාශීය (GIS) විශ්ලේෂණය	දකුණු පළාතේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල හා පුහුණු පාඨමාලාවල අවකාශීය ව්‍යාප්තිය හඳුනා ගැනීම, අභ්‍යාසලාභීන්ගේ වෘත්තීය ප්‍රගමන මාර්ග අධ්‍යයනය කිරීම දකුණු පළාතේ වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා ඉඩම් පරිහරණ රටාව සහ සහභාගීත්වය අතර සම්බන්ධය හඳුනා ගැනීම.	තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
05	වෘත්තීය පුහුණු වැඩසටහන් පිළිබඳ සේවා නියුක්තිය ඉදිරි දර්ශනය ගුණාත්මකභාවය සහ අදාළත්වය පිළිබඳ විශේෂ අවධානය යොමු කිරීම.	"රැකියාව" මත "වෘත්තීය පුහුණු වැඩසටහන්" "වැඩ ලෝකයට" ඇති බලපෑම තීරණය කිරීම. කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා මානව ධාරිතාව ගොඩනැගීමේ රැකියා සඳහා "වෘත්තීය පුහුණු වැඩසටහන්"වල"ගුණාත්මකභාවය" සහ "අදාළත්වය" යන බලපෑම හඳුනා ගැනීම	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
06	නම්‍යශීලී ඉගෙනුම් ක්‍රමය ක්‍රියාත්මක කිරීමට බලපාන සාධක	නම්‍යශීලී ඉගෙනුම් ක්‍රමය ක්‍රියාත්මක කිරීමට බලපාන සාධක හඳුනා ගැනීම.	තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
07	ශ්‍රී ලංකාවේ සමුද්‍රීය වෘත්තීය පුහුණු අංශයේ සිසුන් අතර පාරිසරික සාක්ෂරතාවය පිළිබඳ විමර්ශනය කිරීම	සමුද්‍රීය TVET අංශයේ පාරිසරික සාක්ෂරතා මට්ටම මැනීම, පාරිසරික සාක්ෂරතා මට්ටම් සංසන්දනය කිරීම ලිංගභේදය මත පදනම්ව සිසුන් අතර පාරිසරික සාක්ෂරතා මට්ටම සංසන්දනය කිරීම.	ශ්‍රී ලංකා සමුද්‍ර විශ්ව විද්‍යාලය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා ජාතික සංවර්ධන සැලැස්ම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම

පුහුණු ආයතන ලියාපදිංචි කිරීම සඳහා සංවර්ධන සැලැස්ම පිළියෙළ කර විශේෂ ගැසට් නිවේදනයක් 1995 සැප්තැම්බර් 07 නිකුත් කරන ඇත.

ජාතික සංවර්ධන සැලැස්ම සකස් කිරීම -2022

ක්ෂේත්‍රයේ පුහුණු ආයතන නිලධාරීන්ගේ සහ රේඛීය අමාත්‍යාංශයේ වෘත්තීය පුහුණුව සම්බන්ධ ප්‍රවීන නිළධාරීන්ගේ නියෝජනයෙන් යුතුව ජාතික සංවර්ධන සැලැස්ම සකස් කොට වලංගු ගත කර කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන ඇත. පසුව රේඛීය අමාත්‍යාංශයේ ඇමතිතුමා මඟින් ජනාධිපතිවරයාගේ අනුමැතිය ලබාගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම්තුමා වෙත යොමු කර ඇති අතර, පසුව අමාත්‍යාංශ ලේකම්තුමාගේ ඉල්ලීමට අනුව කැබිනට් පත්‍රිකාවක් සකසා අමාත්‍යාංශ ලේකම්තුමා වෙත නැවත යොමු කර ඇත.

වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස්කිරීම හා යාවත්කාලීන කිරීම

ශ්‍රම වෙළෙඳපළ ඉල්ලුම අනුව හඳුනාගත් කර්මාන්ත ක්ෂේත්‍රවල සහ පළාත්වල පවතින රැකියා ඉල්ලුම හා සැපයුම අතර පවතින විෂමතාවය හඳුනාගෙන එකී විෂමතාවය අවම කරගැනීම සඳහා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් පළාත් වශයෙන් සහ කර්මාන්ත වශයෙන් සකස්කිරීම හා යාවත්කාලීන කිරීම සිදුකරයි. 2022 වර්ෂය අවසන් වනවිට වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් 21 ක් සකස්කර ඇති අතර සැලසුම් 18 ක් යාවත්කාලීනකර ඇත.

කර්මාන්තගත වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලැස්ම

පළාත්බද වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලැස්ම

වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලසුම් සකස් කිරීම-2022

ශීතකරණ හා වායුසමීකරණ ක්ෂේත්‍රය

වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලැසුම් සකස් කිරීමේ වැඩසටහන යටතේ ශීතකරණ හා වායුසමීකරණ ක්ෂේත්‍රය සඳහා සැලැස්ම සකස් කිරීම 2021 වර්ෂයේ දෙවන කාර්තුවේදී ආරම්භ කරන ලද අතර, පරිසර අමාත්‍යාංශයේ ජාතික ඕසෝන් ඒකකය මේ සඳහා උපදේශන හා මූල්‍ය දායකත්වය ලබාදේ. 2022 වර්ෂයේදී මෙම වාර්ථාව දළ සැලැස්ම සකස්කොට නිම කරන ලදී. අදාල වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලැස්ම සඳහා වලංගුගත කිරීමේ වැඩසටහන් 02 ක් මේ වන විට පවත්වා ඇති අතර 2023 වර්ෂයේ අප්‍රේල් මසට පෙර සකස් කොට නිම කිරීමට නියමිත වේ.

ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීම හා පවත්වාගෙන යාම




තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ වර්තමාන රැකියා ඉල්ලුම සහ අනෙකුත් ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු සැපයීම අරමුණු කරගෙන ඊට අදාල ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු පද්ධතියක් ස්ථාපනය කර ඇත. දත්ත සමීක්ෂණය හා විශ්ලේෂණය මඟින් ලබාගන්නා ලද තොරතුරු ශ්‍රම වෙළෙඳපොළ ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සම්පාදකයන්, වෘත්තීය මාර්ගෝ -පදේශකයන්, රැකියාගත කිරීමේ නියුතු ආයතන, පුහුණුකරුවන්, සේවායෝජකයන් හා රැකියා අපේක්ෂකයින් යනාදී පාර්ශවවල ප්‍රයෝජනය සඳහා ශ්‍රමවෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනය (LMI Bulletin ප්‍රකාශයට පත්කරනු ලැබේ.) (www.tvec.gov.lk)

ශ්‍රමවෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනය - 2022

2022 වසර තුළ දී ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශන 2 ක් ප්‍රකාශයට පත්කිරීමට හැකිවිය. මෙම ප්‍රකාශන මඟින් 2021 වසරේ අවසාන සහ 2022 වර්ෂයේ මුල් භාගය තුළ ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළෙඳපොළේ පැවැති ස්වභාවය විනිවිදව කොටස් 5 කින් යුක්තව විශ්ලේෂණය කර ඉදිරිපත් කිරීමට සමත් වී තිබේ.


ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනයේ දේශීය හා විදේශීය වශයෙන් රැකියාවලට ඇති ඉල්ලුම, දේශීය හා විදේශීය වශයෙන් ඇති පුවත්පත් දැන්වීම් පදනම් කරගෙන එක් එක් කර්මාන්ත අංශයන්හි ඇති රැකියා අවස්ථා, රැකියාගත වීම්, අධ්‍යාපන සුදුසුකම්, ස්ත්‍රී/පුරුෂ භාවය හා පලපුරුද්ද ආදී වශයෙන් රැකියාවට සම්බන්ධ අදාල තොරතුරු අන්තර්ගත කර ඇත.



2006 සිට 2021 වර්ෂය දක්වා එක් එක් වර්ෂයන්හි "ඉරිදා ලංකාදීප" හා "Sunday Observer" පුවත්පත් මඟින් සමීක්ෂණය කරන ලද දැන්වීම් පදනම් කරගෙන සම්පාදනය කරන ලද රැකියා පිළිබඳ දැන්වීම් සංඛ්‍යාව

වර්ෂය	රැකියා පිළිබඳ දැන්වීම් සංඛ්‍යාව	වර්ෂය	රැකියා පිළිබඳ දැන්වීම් සංඛ්‍යාව
2006	104,839	2014	91,430
2007	113,060	2015	81,369
2008	116,157	2016	74,245
2009	82,167	2017*	226,555
2010	124,741	2018	215,991
2011	108,193	2019	160,933
2012	136,994	2020	123,003
2013	107,698	2021	144,157

2006-2021 වර්ෂය දක්වා පැවති රැකියා පිළිබඳ දැන්වීම්



(* 2017 වර්ෂයේ සිට සිළුමිණ පුවත්පත වෙනුවට ලංකාදීප පුවත්පත යොදාගැනිම.)

නිපුණතා සම්මත හා විෂයමාලා

වෘත්තීය අධ්‍යාපන පහුණු සැලසුම් අනුව හඳුනාගත් කර්මාන්ත ක්ෂේත්‍රවල රැකියා ඉල්ලුම හා සැපයුමට අනුව ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා වෘත්තීන්ට අදාලව ජාතික නිපුණතා සම්මත සහ නිපුණතා පාදක විෂයමාලා සකස්කිරීම සිදුකරයි. ඒ අනුව නව ජාතික නිපුණතා සම්මත සංවර්ධනය කරන ලදුව ඒවා බලලත් කරන ලදී.

සකස් කරන ලද ජාතික නිපුණතා සම්මත සහ විෂයමාලා - 2022

ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම සහ අදාල ක්ෂේත්‍ර (රැකියා අනුව)

3 වන මට්ටම

- ඉදිකිරීමේ උපකරණ ක්‍රියාකරු (ක්‍රොලර් ඩෝසර්)
- ඉදිකිරීමේ උපකරණ ක්‍රියාකරු (පම්ප්කාර්)
- ඉදිකිරීමේ උපකරණ ක්‍රියාකරු (එක්ස්කැවේටර්)
- කපරාදුකරු
- ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරු (බැකෝලෝඩර්, වීල් ලෝඩර්)
- වෛද්‍ය රසායනාගාර සහයක

3 සහ 4 වන මට්ටම

- විදුලි සංදේශ කුළුණු කාර්මික ශිල්පී
- මධ්‍යම ජීවාණුහරණසේවා දෙපාර්තමේන්තු කාර්මික ශිල්පී
- රබර්කිරි ආශ්‍රිත නිෂ්පාදන ශිල්පී
- ක්‍රීඩාභාණ්ඩ නිෂ්පාදන ශිල්පී

4 වන මට්ටම

- සංගීතඥ (ගායනා)
- ශල්‍යාගාර කාර්මික ශිල්පී
- පිළිගැනීමේ නිලධාරී (වෛද්‍යසේවා)
- අවන්හල් කඩිනම් සේවා කණ්ඩායම් සාමාජික
- සැටලයිට් ටීවී සහ බ්‍රෝඩ්බෑන්ඩ් තාක්ෂණ ශිල්පී
- ආයුර්වේද සම්බාහන චිකිත්සක
- අත් පා උපාංග කාර්මික ශිල්පී
- සමූපකාර කළමනාකරණය
- ඖෂධ නිෂ්පාදන කාර්මික ශිල්පී
- චේදිකා ආලෝකකරණ කාර්මික ශිල්පී

5 වන මට්ටම

- ඇඟලුම් වෙළෙඳ කළමනාකරණය
- ඇඟලුම් නිෂ්පාදන සංවර්ධන තාක්ෂණ හා කළමනාකරණය
- තොරතුරු සහ සයිබර් ආරක්ෂණ තාක්ෂණය
- ඉලෙක්ට්‍රොනික මාධ්‍යය
- රෙදිපිළි වර්ණ ගැන්වීම සහ නිමකිරීමේ තාක්ෂණය
- සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණය
- රක්ෂණසේවා සහ අලෙවි කළමනාකරණය
- ගිනිනිවීමේ ඉංජිනේරු තාක්ෂණය
- ඩිජිටල් මාධ්‍ය තාක්ෂණය

5 සහ 6 වන මට්ටම

- මානව සම්පත් කළමනාකරණය

6 වන මට්ටම

- වෛද්‍ය රසායනාගාර
- පුස්තකාල සහ තොරතුරුසේවා

නව ජාතික නිපුණතා සම්මතය පමණක් සකස් කරන ලද වෘත්තීන් - 2022

ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම්

2 සහ 3 වන මට්ටම

- පොල්වගා සහායක
- පොල් කැපුම්කරු
- පොල් රැහුම්කරු
- වැහිආවරණ සවිකරන්නා

3 වන මට්ටම

- රබර් රොටී නිපැයුම්කරු
- කිතුල්මල් කැපුම් ශිල්පී

2, 3 සහ 4 වන මට්ටම

- යන්ත්‍ර ක්‍රියාකරු (කේබල් නිෂ්පාදනය)

යාවත්කාලීන කරන ලද නිපුණතා සම්මත සහ විෂයමාලා -2022

2 සහ 3 වන මට්ටම

- ශීතකරණ හා වායුසමීකරණ සේවාකරු

2, 3 සහ 4 වන මට්ටම

- නේවාසික ගෘහපාලක
- ඇළුමිනියම් පිරිසැකසුම්කරු
- මැණික් කපන්නා
- ලිතෝ යන්ත්‍ර මෙහෙයුම් ශිල්ප
- ඇඳුම් මසන්නා (ටේලර්)
- ඉදිකිරීම් උපකරණ කාර්මික ශිල්ප
- ස්වර්ණාභරණ සාදන්නා

3 වන මට්ටම

- පෙළඹොටම්

3 සහ 4 වන මට්ටම

- කේක් සැරසිලිකරු
- පැලතවාන් සංවර්ධන සහායක
- කොණ්ඩා සැකසුම්කරු
- පාවහන් තැනුම් ශිල්පී
- විදුලි කාර්මික ශිල්පී
- පෙදරේරු කාර්මික ශිල්පී
- ස්කුබා කිමිදුම්කරු
- රියදුරු
- මෝටර්රථ පින්තාරු ශිල්පී
- සම්භාණ්ඩ නිෂ්පාදන ශිල්පී
- වඩුකාර්මික (ගොඩනැගිලි)

4 වන මට්ටම

- තත්ත්ව සහතික අධීක්ෂක (ඇඟළුම් නිෂ්පාදනය)
- සංචාරක මඟපෙන්වන්නා
- ඡායාරූප ශිල්පී
- නිෂ්පාදන සහායක

5 වන මට්ටම

- සමුද්‍ර යන්ත්‍රෝපකරණ නඩත්තු තාක්ෂණය
- වෘත්තීය හා තාක්ෂණ කාර්මික පුහුණුව ඉගැන්වීම

5 සහ 6 වන මට්ටම

- සංචාරක හා සංචාර කළමනාකරණය
- වෙල්ඩින් තාක්ෂණය
- පෙරපාසල් නඩත්තු තාක්ෂණය
- ස්වර්ණාභරණ නිර්මාණ සහ නිපැයුම් තාක්ෂණය
- මෝටර්රථ තාක්ෂණය
- පෙරපාසල් කළමනාකරණය

6 වන මට්ටම

- විදුලිසංදේශ තාක්ෂණය

ජාතික නිපුණතා සම්මත හා විෂයමාලා පරිවර්තන කටයුතු

සිංහල භාෂාවට පරිවර්තනය කරන ලද ජාතික නිපුණතා සම්මත සහ විෂයමාලා -2022

- ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරු
- විදුලිවැට නඩත්තු සහයක
- මෝටර්රථ කාර්මික ශිල්පී / තාක්ෂණ ශිල්පී
- යතුරුපැදි කාර්මික ශිල්පී
- අලෙවි නියෝජිත
- ළමා ආරක්ෂණ සහ චිකිත්සක සහායක
- ඇඟළුම් තාක්ෂණ ශිල්පී
- පැලතවාන් සංවර්ධන සහකාර
- කුරුඳු කර්මාන්තශාලා මෙහෙයුම්
- තත්ත්ව සහතික අධීක්ෂක (ඇඟළුම් නිෂ්පාදනය)
- නාගරික ඝන අපද්‍රව්‍ය වැඩඅධීක්ෂක
- විදුලිසංදේශ කුළුණු කාර්මික ශිල්පී

දෙමළ භාෂාවට පරිවර්තනය කරන ලද නිපුණතා සම්මත හා විෂයමාලා -2022

- ආවුද සහ අච්චු තැලුම් ශිල්පී
- නාගරික ඝන අපද්‍රව්‍ය වැඩඅධීක්ෂක
- විදුලි කාර්මික ශිල්පී
- මෝටර්රථ කාර්මික ශිල්පී / තාක්ෂණ ශිල්පී
- ක්‍රොලර් ට්‍රැක්ටර්
- ඩීසල් ජනන නඩත්තු කිරීමේ තාක්ෂණ ශිල්පී
- තත්ත්ව සහතික අධීක්ෂක (ඇඟළුම් නිෂ්පාදනය)
- ඇළුමිනියම් පිරිසැකසුම්කරු

නව නිපුණතා සම්මත එළිදැක්වීමේ වැඩසටහන් පැවැත්වීම

නව ජාතික නිපුණතා සම්මත සකස් කිරීමෙන් අනතුරුව සහ පවතින ජාතික නිපුණතා සම්මත යාවත්කාලීන කිරීමෙන් අනතුරුව ඒ පිළිබඳව අදාල ක්ෂේත්‍රයන් දැනුවත් කිරීම සඳහා වැඩසටහන් පවත්වනු ලැබේ.

2022

වසර තුළ මාර්ගගත ක්‍රමය ඔස්සේ ක්ෂේත්‍රයන්ට අදාල නිපුණතා සම්මත එළිදැක්වීමේ වැඩසටහන් 3ක් පවත්වන ලදී.

- සෞඛ්‍ය අංශය
- විදුලි සංදේශ අංශය
- සමූපකාර අංශය

අන්තර් ආයතනික ජාතික වෘත්තීය සුදුසුකම් මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීම

ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටළු හඳුනාගෙන ඒවාට විසඳුම් සෙවීම, සාමූහික තීරණ ගැනීම සහ නවයෝජනා ක්‍රියාත්මක කිරීම අරමුණු කර ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමවේදය ක්‍රියාත්මක කරන රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන් හි ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පිහිටුවා ඇති අතර එම කමිටුව අන්තර් ආයතනික ජාතික වෘත්තීය සුදුසුකම් මෙහෙයුම් කමිටුව ලෙස හඳුන්වයි.

2022

වසර තුළ එම කමිටු රැස්වීම් 07 ක් පවත්වන ලදී.

ජාතික නිපුණතා සම්මත සංවර්ධනය කිරීමේ සහ අධීක්ෂණ කමිටු

ජාතික වෘත්තීය සම්මත සංවර්ධනය කිරීම සඳහා දේශීය මෙන්ම විදේශීය ශ්‍රම වෙළෙඳපොළ ඉල්ලුම සළකාබලා අවසර ලබාදීමත්, ජාතික නිපුණතා සම්මතවල ගුණාත්මකභාවය පවත්වාගෙන යාමත්, ජාතික නිපුණතා සම්මත සහ අදාල අනෙකුත් ලේඛන සකස්කිරීමේ දී ඇතිවන ගැටළු නිරාකරණය කිරීම සඳහා ජාතික නිපුණතා සම්මත සංවර්ධනය කිරීමේ සහ අධීක්ෂණ කමිටුව පිහිටුවා ක්‍රියාත්මක කර ඇත.

2022

වසර තුළ එම කමිටු රැස්වීම් 08 ක් පවත්වා, අදාල තීරණගැනීම හා ප්‍රගතිය සමාලෝචනය කිරීම සිදුකරන ලදී.

පුහුණු ආයතන සඳහා තත්ත්ව ආරක්ෂණ ක්‍රමවේද අනුගමනය

1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතට අනුව සහ වෘත්තීය පුහුණු ආයතන ලියාපදිංචිය උදෙසා වූ සංවර්ධන සැලැස්මට අනුව, (1995 සැප්තැම්බර් 05 දින අංක 887/8 දරණ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් සියළු වෘත්තීය පුහුණු ආයතන සඳහා අදියර 4කින් යුතු තත්ත්ව ආරක්ෂණ ක්‍රමවේදයක් අනුගමනය කරනු ලබයි.

- වෘත්තීය පුහුණු ආයතන ලියාපදිංචිය
- පාඨමාලා ප්‍රතිනතය
- තත්ත්ව කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කිරීම සහ සහතිකකරණය
- තත්ත්ව වැඩි දියුණු කිරීමේ පද්ධතිය ස්ථාපනය කිරීම (QIS)

වෘත්තීය පුහුණු ආයතන ලියාපදිංචිය

වෘත්තීය පුහුණුව සපයන පුහුණු ආයතන මෙම කොමිෂන් සභාව යටතේ ආයතන ලියාපදිංචිය ලබා ගැනීම නෛතික අවශ්‍යතාවකි. ඒ අනුව දිවයින තුළ ක්‍රියාත්මක වන සියළු වෘත්තීය පුහුණු ආයතන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි විය යුතුය. ඉහත සඳහන් කරන ලද පනතට අනුව ලියාපදිංචිය සඳහා ඇගයීමේදී ආයතනයන්හි පාඨමාලාවන්ට අදාලව මානව සම්පත, පුහුණුව ලබාදෙන ලේඛන හා ක්‍රමවේද හා භෞතික සම්පත්වල ප්‍රමාණාත්මක බව පිළිබඳ ඇගයීමක් කර ඒ අනුව අදාල නිර්ණායක සපුරන්නේ නම් වර්ෂ දෙකක කාලයකට කොමිෂන් සභාව එම ආයතන සඳහා ලියාපදිංචිය ලබාදේ. 2022 වර්ෂයේ අවසානයේ වෘත්තීය පුහුණු ආයතන 1160 ක් ලියාපදිංචිය වලංගු තත්ත්වයේ වන අතර, එයින් රාජ්‍ය ආයතන ව්‍යවස්ථාපිත සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල 546ක් ද පෞද්ගලික / රාජ්‍ය නොවන සංවිධානවලට අයත් ආයතන 614 ඇත.

2022

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව කොමිෂන් සභාව ආයතන 600ක ප්‍රමාණයක් ලියාපදිංචිය සඳහා ඇගයීම් කිරීම ඉලක්ක ගත කර ඇති අතර ආයතන 970 ප්‍රමාණයක් ඇගයීමට ලක්කිරීමට හැකි වී ඇත.

2022 වර්ෂයේ පුහුණු ආයතන ලියාපදිංචිය සඳහා ඇගයීම් කිරීම් (නව සහ යාවත්කාලීන) වර්ගීකරණයට අනුව

ඇගයීම් ප්‍රමාණය	ලියාපදිංචි ආයතන ප්‍රමාණය		
	නව ලියාපදිංචි	යාවත්කාලීන	එකතුව
ඉලක්කගත	100	500	600
අයදුම්පත් ලද	402	521	923
ඇගයීම් කළ	355	615	970

2022 වර්ෂයේ පුහුණු ආයතන ලියාපදිංචි කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලද පුහුණු ආයතන එහි හිමිකාරිත්වය අනුව

හිමිකාරිත්වය	ලියාපදිංචි ආයතන ප්‍රමාණය		
	නව ලියාපදිංචි	යාවත්කාලීන	එකතුව
රාජ්‍ය	01	123	124
පුද්ගලික	131	320	451
එකතුව	**132**	**443**	**575**

ලියාපදිංචිය ලත් වෘත්තීය පුහුණු ආයතන ලියාපදිංචිය තහවුරුකිරීමේ ලිපි නිකුත් කිරීම

විදේශ ගතවීම සඳහා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන මඟින් පුහුණුව ලද සහතික පත්‍රලාභීන් අදාල පුහුණු ආයතනයන්හි ලියාපදිංචිය තහවුරු කිරීම සඳහා වන ලිපි විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත නිකුත් කිරීම සිදු කරනු ලැබේ. එවැනි ලිපි 2166ක් පමණ 2022 වසර තුළ විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත නිකුත් කර තිබේ.

පාඨමාලා ප්‍රතීතනය

ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව 2004 වර්ෂයේ හඳුන්වා දෙන ලදී. යම් වෘත්තීයන් සඳහා NVQ සුදුසුකම් ප්‍රදානය කිරීම සඳහා ජාතික නිපුණතා සම්මතයන් සංවර්ධනය කර තිබිය යුතුය. එම නිපුණතා සම්මත අනුව ජාතික විෂය මාලාවන් සකස් කරන අතර, ඊට අනුකූලව නිපුණතාපාදක ක්‍රමය යටතේ පුහුණු කටයුතු සිදු කරන පාඨමාලාවන් ප්‍රතීතනය කිරීම මෙම කොමිෂන් සභාව මඟින් සිදු කරනු ලැබේ.

2022

වර්ෂය තුළ සිදු කරන ලද පාඨමාලා ප්‍රතීතනය ඇගයීම් ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ. ප්‍රතීතනය ලබා ඇති පාඨමාලා හරහා පුහුණුවක් ලබන පුහුණුවන්නන් අවසන් ඇගයීම මෙම කොමිෂන් සභාව මඟින් සිදු කරන අතර එහි ප්‍රතිඵල අනුව NVQ සුදුසුකම් ප්‍රදානය කරනු ලැබේ.

ඇගයීම් ප්‍රමාණය	පාඨමාලා ප්‍රතීතන ඇගයීම් ප්‍රමාණය		
	නව ලියාපදිංචි	යාවත්කාලීන	එකතුව
ඉලක්කගත	300	300	600
ඇගයීම් කල	614	1134	1748

2022 වර්ෂය තුළ මෙම කොමිෂන් සභාව මඟින් ප්‍රතිනතය කරන ලද මුළු පාඨමාලා සංඛ්‍යාව 1390 වන අතර හිමිකාරිත්වය අනුව එය පහත දක්වා ඇති වගුව පරිදි වේ.

හිමිකාරිත්වය	පාඨමාලා ප්‍රතිනත ප්‍රමාණය		
	නව ලියාපදිංචි	යාවත්කාලීන	එකතුව
රාජ්‍ය	235	636	871
පුද්ගලික	267	252	519
එකතුව	**502**	888	**1390**

තත්ත්ව කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කිරීම සහ සහතිකකරණය

තත්ත්ව කළමනාකරණ පද්ධතියකින් අපේක්ෂා කරනුයේ ඕනෑම පුහුණු ආයතනයක් මඟින් ඉටුකරන සේවාව වඩාත් ගුණාත්මකව ඉහළ තත්ත්වයකින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රමවේදයක් සකස්කර ඒ අනුවල ක්‍රියාත්මකවීමයි. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෘත්තීය පුහුණුවේ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීමේ අරමුණින් අදාල පුහුණු ආයතන සඳහා තත්ත්ව කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දී ඇත. එහිදී ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ පවතින ISO 9001 : 2008, S LS IWA 2 : 2007 නිර්ණායකවලට අදාල වන පරිදි මෙම තත්ත්ව කළමනාකරණ පද්ධති ස්ථාපිත කර ඇත. ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 05 සහ 06 පාඨමාලා ආරම්භ කරන සියලු ආයතන පාඨමාලා ප්‍රතිනතයට අමතරව මෙම තත්ත්ව කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කළ කිරීම අනිවාර්යය වනු ඇත.

2022

වර්ෂයේ රට තුළ පැවැති කොරෝනා තත්ත්වය හා සාමාජීය ආර්ථික අර්බුදකාරී තත්ත්වයන් හමුවේ පුහුණු ආයතන මුහුණදී සිටින සම්පත් හිඟය හා අමුද්‍රව්‍ය සොයාගැනීමේ අපහසුව ආදී විවිධ ගැටලු හේතුවෙන් වෘත්තීය පුහුණු ආයතන තුළ තත්ත්ව කළමනාකරණ පද්ධති ස්ථාපනය කිරීම සඳහා වන විගණනයන් සිදු කිරීම සඳහා සැලසුම් නොකරන ලදී.

තත්ත්ව වැඩි දියුණු කිරීමේ පද්ධතිය ස්ථාපනය කිරීම (QIS)

තත්ත්ව වැඩි දියුණු කිරීමේ පද්ධතිය තුළදී කර්මාන්ගත පුහුණුවල ආයතනික පුහුණුවෙහි සාර්ථකත්වය පිළිබඳව අදාල ආයතනවලින් ප්‍රතිපෝෂණ ලබාගැනීම අනිවාර්යය අංගයකි. 2022 වන විටත් COVID වසංගතයට පෙර පැවති තත්ත්වයට පුහුණු ආයතනවල පුහුණු කටයුතු සිදු නොවීම නිසා තත්ත්ව තත්ත්ව වැඩි දියුණු කිරීමේ පද්ධතිය ස්ථාපනය කිරීමට පුහුණු ආයතනවලින් ඉල්ලීම්කර නොතිබුණි.

ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රදානය කිරීම

තත්ත්ව පාලන ක්‍රමවේදයක් වන වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුවේ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීමට උපකාරී වන පද්ධති සංවර්ධනය කොට පවත්වාගෙන යාම, තත්ත්ව ආරක්ෂණ හා ඇගයීම් නියාමනය මඟින් ඉතා ඉහළ ගුණත්වයකින් යුත් ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රදානය කිරීම සිදුකරනු ඇත. මෙහිදී ප්‍රධාන ක්‍රමවේද 04ක් යටතේ නිපුණත්වලාභීන් ඇගයීම් කරනු ඇත.

- නිපුණතා පාදක පුහුණුලාභීන් (CBT)
- පෙර දැනුම පාදක පුහුණුලාභීන් (RPL)
- කර්මාන්ත / ව්‍යාපාර පාදක පුහුණුලාභීන් (EBT)
- නම්‍යශීලී ඉගෙනුම් මාදිලියේ පුහුණුලාභීන් (FLM)

ඉහත ක්‍රමවේදය යටතේ වූ පුහුණුලාභීන්ගේ ගුණත්වය පරීක්ෂාකිරීම ජාතික සුදුසුකම් මට්ටම් අනුව ප්‍රධාන වශයෙන් ත්‍රිවිධාකාරයකට පරීක්ෂා කරනු ඇත.

- දැනුම ඇගයීමේ පරීක්ෂණය (Knowledge assessment)
- ප්‍රායෝගික ඇගයීම් (Practical Test)
- වාචික පරීක්ෂණය (Viva Test)

දැනුම ඇගයීමේ පරීක්ෂණය (Knowledge assessment)

වෘත්තීය 13 ක පුහුණුලාභීන් සඳහා න්‍යායාත්මක දැනුම පරීක්ෂා කිරීම අරමුණු කොට ලිඛිත පරීක්ෂණයක් දීප ව්‍යාප්තව පවත්වනු ලැබේ. මෙහිදී NVQ මට්ටම් 4 සඳහා පමණක් මෙම ලිඛිත පරීක්ෂණ පවත්වනු ලැබේ.

ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 4 ප්‍රදානය කිරීම සඳහා පොදු ලිඛිත විභාගය පැවැත්වීම

2022 වර්ෂය තුළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 04 සඳහා වෘත්තීන් 13 සඳහා පවත්වනු ලබන පොදු ලිඛිත පරීක්ෂණයේ සහභාගීත්වය පහත පරිදි වේ.

2022 වර්ෂය තුළදී ක්ෂේත්‍ර 13 සඳහාම ලිඛිත පරීක්ෂණ වාර 04ක් පවත්වන ලදී.

වර්ෂය තුළ ඇගයීම් පැවැත්වූ මාසය	අයදුම්කළ සිසුන් ගණන	සමත් වූ සිසුන් ගණන
ජනවාරි	5701	3106
අප්‍රේල්	8683	6097
ජූලි	10947	7679
දෙසැම්බර්	15590	11176

ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 5 සහ 6 ලිඛිත විභාග පැවැත්වීම

පෞද්ගලික අංශයේ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 සහ 6 පාඨමාලා සඳහා ලිඛිත පරීක්ෂණ පැවැත්වීම එම පාඨමාලා ප්‍රතීතනය කර ඇති පුහුණු මධ්‍යස්ථාන තුළම පැවැත්වීමට ඔවුන් ඉල්ලීම් කළ යුතු අතර, එය පදනම් කරගෙන අදාල පරීක්ෂණ සිදුකරනු ඇත. එමෙන්ම රාජ්‍ය අංශයේ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 සහ 6 පාඨමාලාවන්හි ලිඛිත පරීක්ෂණ අදාල පුහුණු ආයතන විසින්ම පවත්වනු ලැබේ.

2022

පුද්ගලික අංශයේ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 සහ 6 පාඨමාලාවල පොදු ලිඛිත විභාගය 2022 වසර තුළ අදාල ආයතනවල ඉල්ලීම මත පහත ක්ෂේත්‍ර සඳහා සමාසිකව විභාග 58ක් පවත්වන ලදී.

- පරිගණක හා තොරතුරු තාක්ෂණය
- ප්‍රමාණ සමීක්ෂණ
- ඉදිකිරීම් තාක්ෂණය
- විලේපන ශේදය
- කෘෂිකර්ම නිෂ්පාදන තාක්ෂණය
- මෙකාට්‍රොනික් තාක්ෂණය
- ශීතකරණ හා වායු සමීකරණ
- නිෂ්පාදන තාක්ෂණය
- පෙරපාසල් කළමනාකරණය
- මුද්‍රිත තාක්ෂණය
- සැලසුම් තාක්ෂණය
- යාන්ත්‍රික තාක්ෂණය

ප්‍රායෝගික ඇගයීම්

නිපුණතා පාදක පුහුණුලාභීනගේ (CBT) ප්‍රායෝගික ඇගයීම් පැවැත්වීම පාඨමාලා ප්‍රතීතනය කරන ලද ආයතනයක් තුළම ද අනිකුත් ක්‍රමවේද මඟින් ඇගයීම් කරන අය ප්‍රතිතනය කරන ලද පාඨමාලා ඇති පුහුණු මධ්‍යස්ථානය හෝ පෙර අනුමැතිය ලද පුහුණු මධ්‍යස්ථානයක සිදුකරනු ඇත. මෙම ඇගයීම මඟින් ඔවුන්ගේ ප්‍රායෝගික හැකියාව පිළිබඳ පරීක්ෂාවන් අදාල ක්ෂේත්‍රයේ ඇගයීම්කරුවන් දෙදෙනකුගේ සහභාගීත්වයෙන් සිදුකරනු ඇත. මෙම කාර්යය සිදු කිරීමේ ප්‍රධාන අංග කිහිපයකි.

- ඇගයීම් නිලධාරි සංචිතය පවත්වාගෙන යාම
- ඇගයීම් අධීක්ෂණය
- ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් ප්‍රදානය කිරීම

ඇගයීම් නිලධාරී සංචිතය

ඇගයීමිකරුවන් පත්කිරීම හා පුහුණු කිරීම

ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රදානය සඳහා සුදුසුකම් පරීක්ෂා කිරීමේ ප්‍රායෝගික ඇගයීම් සිදුකිරීම සඳහා එක් එක් ක්ෂේත්‍රයේ නිපුණතාවය හා ප්‍රවීණතාවය ඇති සුදුසුකම් ලත් අය ඇගයීමිකරුවන් ලෙස කොමිෂන් සභාවේ ලියාපදිංචි කර ඇගයීම්කරුවන්ගේ සංචිතයක් පවත්වාගෙන යනු ඇත. එම සංචිතයේ ඇගයීම්කරුවන් ස්වයංක්‍රිය දත්ත පද්ධතියක් තුළින් ඇගයීම් සඳහා පත්කරනු ඇත.

මෙම වර්ෂය අවසන් වන විට ඇගයීම් සංචිතය ඇගයීම්කරුවන් 3905 සමන්විතයි. මෙම වර්ෂයතුළ ඇගයීම් සංචිතයේ සිටින සියලුම නිලධාරීන්ගේ තොරතුරු යාවත්කාලීන කිරීම සිදුකිරීම මඟින් ඇගයීම් ක්‍රියාවලිය කාර්යක්ෂමතාවය හා ගුණාත්මකභාවය වර්ධනය කර ඇත. එමෙන්ම ක්‍රියාකාරී මට්ටමේ නොමැති ඇගයුම්කරුවන් 164 ක් ඇගයුම් සංචිතයෙන් තාවකාලිකව ඉවත් කරන ලදී.

2022

නිපුණතාපාදක ඇගයීම් නිලධාරීන් ලෙස පත්වීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයෙන්ද ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් 02 මඟින් ඉල්ලුම්පත් කැඳවන ලදී. එසේ අප වෙත ලැබුණු අයදුම්පත්‍ර අදාල වෘත්තීන් පිළිබඳව විශේෂඥ දැනුමින් යුත් පුද්ගලයන් මඟින් සම්මුඛ පරීක්ෂණයට යොමුකර සුදුස්සන් තෝරා ගන්නා ලදී. එවැනි සම්මුඛ පරීක්ෂණ දින 19ක් 2022 වසර තුළ පවත්වා ඇගයුම්කරුවන් 299 දෙනෙක් මෙම වර්ෂය තුළදී ඇගයීම් සංචිතයට ඇතුළත් කරන ලදී. මෙම වර්ෂය තුළදී වැඩමුළු 12ක් පවත්වන ලදී. වැඩමුළු 04ක් වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය මඟින් පවත්වන ලදී. අප කොමිෂන් සභාවේ හා Youlead ආයතනයෙන් මෙම වැඩසටහන සඳහා මුදල් වැයකරන ලදී.

නිපුණතා පාදක ඇගයීම් කටයුතු නියාමනය කිරීම

මේ යටතේ මෙතෙක් පැවති ඇගයීම්කරුවන් පත්කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම සිදු කිරීම සඳහා ඩිජිටල් ක්‍රමයට ඇගයීම්කරුවන් පත්කිරීම හා ඇගයීම් පැවැත්වීමේ දින නිශ්චය කිරීමට ඉවහල් වන පරිගණක පද්ධතියක් හඳුන්වාදෙන ලදී. මෙම ඩිජිටල් ක්‍රමවේදය තුළින් මෙතෙක් පැවති අත්හැරීම් හා වැරදි සිදුවීම් අවම කරගැනීමට හැකියාව ලැබී ඇත. ඒ අනුව CBT, EBT, RPL හා අලුතින් හඳුන්වාදුන් FLM ක්‍රම 04 හිම ඇගයීම්කරුවන් පත්කිරීම පරිගණක ක්‍රම මත පදනම් වේ. ඒ තුළින් ඇගයීම්කරුවන් පත්කිරීමේ ක්‍රියාවලියේ ගුණාත්මකභාවය සැළකිය යුතු ලෙස ඉහළ තත්ත්වයකට පත්ව ඇත. මේ යටතේ ප්‍රධාන කාර්යයන් ලෙස රාජ්‍ය හා පෞද්ගලික අංශයට අයත් පුහුණු මධ්‍යස්ථානවල ඇගයීම් පැවැත්වීම සඳහා අනුමැතිය ලබාදීම, ඇගයීම්කරුවන් නම් කිරීම හා අදාල ආයතන සමඟ ඇගයීම්කරුවන් පත්කිරීම පිළිබඳව ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම සිදු කිරීමට හැකියාව ලැබී ඇත.

2022

අදාල නිර්නායක පරීක්ෂා කොට ඒවා සපුරන ලද අවස්ථාවන්හී දී කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යනු ලබන ඇගයීම් සංචිතයේ සිටින ඇගයීම්කරුවන් ඇගයීම් සඳහා පත්කොට ඔවුන් ලවා ඇගයීම් කටයුතු සංවිධානය කළ යුතුය. විවිධ පුහුණු මධ්‍යස්ථාන/ ආයතන විසින් 2022 වසර තුළ NVQ මට්ටම් 1-4 ඇගයීම් සඳහා අනුමැතිය පෞද්ගලික අංශය සඳහා කරන ලද ඉල්ලීම් 1136 සඳහා ඇගයීම්කරුවන් ස්වයංක්‍රිය පද්ධතිය

තුළින් සිදුකර ඇත. එමෙන්ම NVQ මට්ටම් 5 හා 6 අවසන් ඇගයීම් පැවැත්වීම සඳහා අයදුම්කළ ඇගයීම් 492 සඳහා ඇගයුම්කරුවන් පත්කරන ලදී.

නිපුණතාපාදක ඇගයීම් කටයුතු

පුහුණු ආයතන සහ ඇගයීම්කරුවන් ඇගයීම් පැවැත්වීමේ ක්‍රියාවලිය සිදුකළ යුත්තේ කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති නීතිරීති, චක්‍රලේඛ, මාර්ගෝපදේශ අත්පොත් හා ඇගයීම් මූලධර්මවලට අනුකූලවය. මෙම ක්‍රියාවලිය නිසි ලෙස සිදුවනවාද යන්න කොමිෂන් සභාවේ නිළධාරීන්ගේ අහඹු අධීක්ෂණයට ලක්වනු ඇත. එසේ දෝෂ සහගත ලෙස ඇගයීම් සිදුකර ඇත්නම් NVQ චක්‍රලේඛ අංක 2017/1ට අනුව සහ ඉහළ කළමනාකාරිත්වයේ උපදෙස් මත ආයතනවලට සහ ඇගයීම්රුවන්ට අවශ්‍ය උපදෙස් ලබාදීම හා අනෙකුත් අදාල විනයානුකූල තීරණ ගන්නා ලදී.

2022

වසර තුළ රාජ්‍ය හා පෞද්ගලික අංශයට අයත් පුහුණු ආයතනවල පවත්වන ලද නිපුණතා පාදක ඇගයීම් 77 ක් අධීක්ෂණය කරන ලදී.

එම අධීක්ෂණ ප්‍රතිඵල අනුව NVQ චක්‍රලේඛ අංක 2017/1 අනුව සහ ඉහළ කළමනාකාරිත්වයේ උපදෙස් මත ඇගයීම් ඇගයීම් ක්‍රියාවලියට හා මූලධර්මවලට පටහැනිව කටයුතු කළ අවස්ථාවලදී ඇගයීම්කරුවන්ට අවශ්‍ය උපදෙස් ලබාදීම හා අනෙකුත් අදාල විනයානුකූල තීරණ ගන්නා ලදී. එමෙන්ම ඇගයුම් සම්බන්ධ පුහුණු ආයතනවලින් ලද පැමිණිලි අනුව විමර්ෂණ 05ක් සිදුකර තීරණ ලබාදෙන ලදී.

ආබාධ සහිත අපේක්ෂකයින් සඳහා NVQ ඇගයීම්වලදී සිදුකළ යුතු සාධාරණ ගැලපුම් (01/2020 චක්‍රලේඛයට අනුව) පිළිබඳ ඇගයුම්කරුවන් දැනුවත් කිරීම

මේ සම්බන්ධව ඇගයුම්කරුවන් පුහුණු කිරීම සඳහා Skills for Inclusive Growth ආයතනය අනුග්‍රහය දක්වන ලදී. ඒ අනුව හෝටල් හා සංචාරක ක්ෂේත්‍රයේ ඇගයුම්කරුවන් 50කට ආසන්න සංඛ්‍යාවක් මේ වන විට පුහුණු කර ඇත.

ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් නිකුත් කිරීම

ජාතික වෘත්තීය සුදුසුකම් ඇගයීම් ක්‍රියාවලිය නිසි ලෙස සම්පූර්ණ කරන ලද සිසුන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් සහතික නිකුත් කරනු ඇත. මේ සඳහා පරිගණක දත්ත පද්ධතියක් පවත්වාගෙන යන අතර, ඇගයීම්කරුවන් විසින් ලබාදෙන ඇගයීම් ප්‍රතිඵල මෙම පරිගණක පද්ධතියට යාවත්කාලීන කිරීම ඒ ඒ පුහුණු ආයතන විසින් සිදුකරනු ඇත. එම යාවත්කාලීන කරන ලද දත්ත කොමිෂන් සභාවේ නිළධාරීන් විසින් ඇගයීම්කරුවන්ගේ භෞතික ප්‍රතිඵල ලේඛන සහ අනෙකුත් ලේඛන සමඟ සසඳා ජාතික වෘත්තීය සුදුසුකම් සහතික මුද්‍රණය සඳහා අනුමැතිය ලබාදෙනු ඇත.

2022 වර්ෂය තුළදී NVQ මට්ටම් 1-6 දක්වා සහතික පත්‍ර 117,954ක් නිකුත් කර ඇත. ඒ තුළ නිපුණතා පාදක ඇගයීම් ක්‍රමය (CBT), කර්මාන්ත ගත පුහුණු ක්‍රමය (EBT) හා පෙර දැනුම ඇගයීම් ක්‍රමය (RPL) සහතික පත්‍ර අඩංගු වේ.

2022 වර්ෂය සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත්ලාභීන් (ආයතන අනුව)

ආයතනය	සහතිකපත් ලද පුද්ගලයින් සංඛ්‍යාව				සහතිකපත් ප්‍රමාණය			
	CBT	RPL	EBT	එකතුව	CBT	RPL	EBT	එකතුව
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව	8448	161	0	8609	9607	175	0	9782
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය	1769	7364	39442	48575	2149	7969	39911	50029
වෘත්තීය පුහුණු අධිකාරිය	17551	2742	0	20293	22301	3131	0	25432
ජාතික තරුණ සේවා සභාව	4244	0	0	4244	4903	0	0	4903
පෞද්ගලික අංශය	24139	0	0	24139	27808	0	0	27808
එකතුව	**56151**	**10267**	**39442**	**105860**	**66768**	**11275**	**39911**	**117954**

NVQ 1 සිට NVQ 6 දක්වා මට්ටම්වලට 2022 වර්ෂය තුළදී නිකුත් කර ඇති සහතිකපත් ප්‍රමාණයන් ඒ ඒ ආයතන අනුව පහත වගුවේ දැක්වේ.

ආයතනය	පළමු මට්ටම	දෙවන මට්ටම	තෙවන මට්ටම	සිව්වන මට්ටම	පස්වන මට්ටම	හයවන මට්ටම	එකතුව
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය	12	2138	39815	8064	0	0	50029
කාර්මික අධ්‍යාපන හා පුහුණුකිරීමේ දෙපාර්තමේන්තුව	0	249	2817	5128	1354	234	9782
ජාතික තරුණ සේවා සභාව	0	343	2082	2478	0	0	4903
වෘත්තීය පුහුණු අධිකාරිය	138	797	10300	14011	175	11	25432
පෞද්ගලික අංශය	0	837	16234	8824	903	1010	27808
එකතුව	**150**	**4364**	**71248**	**38505**	**2432**	**1255**	**117954**

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය

2022 වර්ෂයේදී පුහුණු ආයතන විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් සහතික (ස්ත්‍රී / පුරුෂ භාවය අනුව) පහත වගුවේ දැක්වේ.

ආයතනය	සහතිකපත් ප්‍රමාණය			සහතිකපත්ලාභීන්		
	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
කාර්මික අධ්‍යාපන හා පුහුණුකිරීමේ දෙපාර්තමේන්තුව	6709	3073	9782	5603	3003	8606
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය	33346	16683	50029	32202	16311	48513
වෘත්තීය පුහුණු අධිකාරිය	15906	9526	25432	12218	8068	20286
ජාතික තරුණ සේවා සභාව	1598	3305	4903	1393	2851	4244
පෞද්ගලික අංශය	16742	11066	27808	14615	9524	24139
එකතුව	**74301**	**43653**	**117954**	**66031**	**39757**	**105788**

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 2022 වසර තුළ සහතිකපත් 1325ක් නැවත මුද්‍රණය කරන ලදී. ඒ පිළිබඳ විස්තර පහත වගුවේ දැක්වේ.

සහතික වර්ගය	සහතික පත්‍ර ප්‍රමාණය
මුද්‍රණ දෝෂ හේතු කොටගෙන නැවත මුද්‍රණය කරන ලද සහතික පත්‍ර	693
අස්ථානගත වූ සහතික වෙනුවට අනු පිටපත් මුද්‍රණය	632
එකතුව	**1325**


2006 සිට 2022 දක්වා නිකුත් කරන ලද මුළු සහතික පත්‍ර ප්‍රමාණය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව ආරම්භයේ සිට 2022 වර්ෂය අවසාන වන විට සහතිකපත් 627,536 ක් නිකුත්කර රටේ ශ්‍රමබලකාය ශක්තිමත් කිරීම සඳහා සක්‍රීය දායකත්වයන් සපයන ලදී.

වර්ෂය	සහතිකපත්‍ර සංඛ්‍යාව
2006	259
2007	1629
2008	8915
2009	11249
2010	13256
2011	16572
2012	18111
2013	22855
2014	28546

වර්ෂය	සහතිකපත්‍ර සංඛ්‍යාව
2015	44148
2016	47017
2017	65212
2018	61150
2019	78007
2020	47621
2021	45033
2022	117954
එකතුව	**627534**

2006 සිට 2022 දක්වා නිකුත් කරන ලද සහතිකපත් ප්‍රමාණය



ජාතික වෘත්තීය සුදුසුකම් ලබා නොදෙන පාඨමාලා, ජාතික වෘත්තීය සුදුසුකම් 5/6 මට්ටම් සමඟ සමාන කිරීම/ගැළපීම

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) වෘත්තීය පුහුණු සපයන්නන්, විවිධ වෘත්තීය සුදුසුකම්ලත් අය, පිළිගත් හා ඒ ඒ පාඨමාලා සඳහා සමාන NVQ මට්ටම් ඉල්ලා සිටින විදේශීය සුදුසුකම් ප්‍රදානය කරන ආයතන වෙතින් සිදුකරන ඉල්ලීම් අනුව ඔවුන්ගේ සුදුසුකම තක්සේරු කිරීම සඳහා විධිමත් පටිපාටියක් හඳුන්වා දී ඇත. ඒ අනුව මේ සඳහා කොමිෂන් සභාවේ 5/2021 (www.tvec.gov.lk) චක්‍රලේඛය අනුව හා අනිකුත් අදාල නිර්ණායක සළකා බලනු ඇත.

2022

ජාතික වෘත්තීය සුදුසුකම් 5/6 මට්ටම්වලට සමානකිරීම සඳහා නිකුත් කර ඇති ජාතික වෘත්තීය සුදුසුකම් චක්‍රලේඛ අනුව සමාන කිරීමේ ක්‍රියාවලියේදී පහත සඳහන් පාඨමාලා ජාතික වෘත්තීය සුදුසුකම් 5/6 මට්ටම් සමඟ සමාන කරන ලදී.

පාඨමාලාව පවත්වනු ලබන ආයතනය	සමාන කිරීමේ ක්‍රියාවලියට යොමුකළ පාඨමාලාව	ජාතික වෘත්තීය සුදුසුකම් සමානතා මට්ටම
ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය (CMA)	ගිණුම්කරණ හා ව්‍යාපාර කළමනාකරණ ඩිප්ලෝමාව (DABM)	6 වන මට්ටම
ශ්‍රී ලංකා ටෙලිකොම් පුහුණු මධ්‍යස්ථානය (SLTC)- වැලිසර	Pearson BTEC උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (විදුලි හා ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු)	6 වන මට්ටම (ඉලෙක්ට්‍රොනික් තාක්ෂණය)
ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය (AAT)	ගිණුම්කරණ හා ව්‍යාපාර ඩිප්ලෝමාව - AAT අවසන් අදියර සමත්වූවන්	5 වන මට්ටම

වෘත්තීය පරිණාතභාවය සහිත අයදුම්කරුවන් ජාතික වෘත්තීය සුදුසුකම් 5 වන මට්ටමේ සුදුසුකමට සමාන කිරීම

වෘත්තීය පරිණතභාවය මත ජාතික වෘත්තීය සුදුසුකම් 5 වන මට්ටමට සමාන කිරීමේ සහතික ලබාදීම සඳහා අයදුම් කළ ක්ෂේත්‍රයන්ට අදාලව සම්මුඛ පරීක්ෂණ පවත්වා සහතිකපත් 75 ක් සුදුසුකම්ලාභීන් හට ප්‍රදානය කර ඇත.

අධීක්ෂණ මට්ටමේ සේවා පළපුරුද්ද සහිත අයදුම්කරුවන්හට ජාතික වෘත්තීය සුදුසුකම් 5 වන මට්ටමට සමාන කිරීමේ සහතික ලබාදීම සඳහා අයදුම් කල ක්ෂේත්‍රයන් 20කට අදාලව සම්මුඛ පරීක්ෂණ පවත්වා 56 දෙනෙක් සඳහා සහතික ප්‍රදානය කර ඇත.

NVQ මට්ටම් 5 සහතිකය කඩිනමින් නිකුත් කිරීම සඳහා පවතින සාමාන්‍ය ක්‍රමවේදයට අමතරව Speedy Process නමින් මසක් ඇතුළත සහතිකය නිකුත් කිරීමේ (NVQ Level 5ට අදාල ක්ෂේත්‍රයන් කිහිපයක් හැර ඉතිරි ක්ෂේත්‍රයන් සඳහා) ක්‍රමවේදයක් ආරම්භ කළ අතර ඒ සඳහා අයදුම්පත් 60ක ප්‍රමාණයක් 2022 වර්ෂය පුරා ලැබුණු අතර, ඒ සියලු අයදුම්පත් ඇගයීම්කර අවසන්කර ඇත.

ජාතික වෘත්තීය සුදුසුකම් ලබානොදෙන පාඨමාලා මඟින් ලබාදෙන සුදුසුකම් ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම්වලට සමානකිරීම

ජාතික වෘත්තීය සුදුසුකම් සම්මත පිළියෙල කර ඇති නමුත් ඒ හරහා ජාතික වෘත්තීය සුදුසුකම් ලබා නොගත් හඳුනාගත් ක්ෂේත්‍රයන්හි පුද්ගලයන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් සමාන කරදීම සිදුකර ඇත.

2022

ජාතික තාක්ෂණ සහතිකපත්‍රලාභීන්ට ජාතික වෘත්තීය සුදුසුකම් සමානතාවය පිරිනැමීමට පුවත්පත් දැන්වීමක් මඟින් අයදුම්පත් කැඳවා දැනුම පරීක්ෂා කිරීම සඳහා 2021 දී පවත්වන ලද පොදු විභාගයෙන් සමත්වූවන් 914 අතුරින් 505 දෙනෙකු සඳහා 2022 වසරේදී මාර්ගගත ක්‍රමය ඔස්සේ වෘත්තීය සමාලෝචන පරීක්ෂණ සිදුකරන ලදී.

එම වෘත්තීය සමාලෝචන පරීක්ෂණ මඟින් සමත්වූවන් 302 දෙනෙකු හට පහත සඳහන් පරිදි ජාතික වෘත්තීය සුදුසුකම් සමානකිරීමේ සහතික නිකුත්කරන ලදී. තව ද එම සහතිකපත්‍ර නැවත සහතික කරගැනීම සඳහා විවිධ ආයතන මඟින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම් 87 ක් සඳහා ද සහතික කිරීමේ ලිපි නිකුත්කරන ලදී.

පාඨමාලාවේ නම	ජාතික වෘත්තීය සුදුසුකම් සමානතා මට්ටම	නිකුත් කරන ලද සමානතා සහතික සංඛ්‍යාව
ජාතික තාක්ෂණ සහතික පත්‍රය (සිවිල් ඉංජිනේරු) සහ කර්මාන්ත තාක්ෂණ ජාතික සහතික පත්‍රය (සිවිල් ඉංජිනේරු)	5 වන මට්ටම	193
ජාතික තාක්ෂණ සහතික පත්‍රය (ප්‍රමාණ සමීක්ෂණ)	5 වන මට්ටම	14
ජාතික තාක්ෂණ සහතික පත්‍රය (විදුලි තාක්ෂණය)	5 වන මට්ටම	78
ජාතික තාක්ෂණ සහතික පත්‍රය (යාන්ත්‍රික ඉංජිනේරු)	5 වන මට්ටම	17

පහත දක්වා ඇති සහතික පත්‍ර සඳහා එම සහතිකපත්‍රලාභීන්ගේ ඉල්ලීම් අනුව ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් සමාන කිරීමේ සහතික නිකුත්කිරීම

ආයතනයේ නම	පාඨමාලාවේ නම	ජා: වෘ: සුදුසුකම් සමානතා මට්ටම	සමානතා කිරීමේ සහතික සංඛ්‍යාව
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය / ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය	තොරතුරු සන්නිවේදන තාක්ෂණ ජාතික ඩිප්ලෝමාව	5 වන මට්ටම	14
වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය	ප්‍රමාණ සමීක්ෂණ ජාතික ඩිප්ලෝමාව	6 වන මට්ටම	08
ඉංජිනේරු තාක්ෂණ ආයතනය	ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව	6 වන මට්ටම	34

ආයතනයේ නම	පාඨමාලාවේ නම	ජා: වෘ: සුදුසුකම් සමානතා මට්ටම	සමානතා කිරීමේ සහතික සංඛ්‍යාව
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය	කළමනාකරණ උසස් ජාතික ඩිප්ලෝමාව	6 වන මට්ටම	95
	තොරතුරු තාක්ෂණ උසස් ජාතික ඩිප්ලෝමාව	6 වන මට්ටම	16
	විදුලි ඉංජිනේරු උසස් ජාතික ඩිප්ලෝමාව	6 වන මට්ටම	03
	සිවිල් ඉංජිනේරු උසස් ජාතික ඩිප්ලෝමාව	6 වන මට්ටම	02
	යාන්ත්‍රික ඉංජිනේරු උසස් ජාතික ඩිප්ලෝමාව	6 වන මට්ටම	01

ජාතික වෘත්තීය සහතික පත් නිකුත් කිරීම පිළිබඳ වැඩසටහන්

පෙරදැනුම් ඇගයීමේ ක්‍රමය පිළිබඳව ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවතීම

වරින්වර පෙර දැනුම් ඇගයීමේ ක්‍රම පිළිබඳව ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලද අතර, මෙහෙයුම් කමිටු රැස්වීම්වලදී ද විභාග මණ්ඩල රැස්වීම්වලදී ද ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය, වෘත්තීය පුහුණු අධිකාරිය හා කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව සමඟ ගැටළු හා අභියෝග පිළිබඳව සාකච්ඡා කරන ලදී.

නිපුණතා පාදක ඇගයීම්වල සංඝතභාවය තහවුරු කිරීමේ වැඩසටහන්

නිපුණතා පාදක ඇගයීම්වල සංඝතභාවය තහවුරු කිරීමේ හා ඇගයීම්කරුවන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ වැඩමුළු පැවැත්වීම සිදු කරයි.

2022

ඉහත සඳහන් කරන ලද අභිමතාර්ථය සපුරාගැනීමේ අරමුණින් වැඩමුළු 12 ක් වසර තුළ පැවැත්වීමට සැලසුම් කරන ලදී. නමුත් කොවිඩ් 19 වසංගත තත්ත්වයේ ව්‍යාප්තිය හමුවේ රැස්වීම් වැඩමුළුව සඳහා ඇගයීම්කරුවන් සියළුදෙනාම ගෙන්වා ගැනීම සිදුකල නොහැකි නිසා මේ වර්ෂය තුළ වැඩමුළු 06ක් Zoom තාක්ෂණය ඔස්සේ පවත්වන ලදී.

තොරතුරු පද්ධති

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පරිගණක තොරතුරු පද්ධති සංවර්ධනය කර මෙහෙයවීම සිදු කරන අතර, අභ්‍යන්තර නිළධාරීන්ට මෙන්ම තොරතුරු පද්ධතිය හා සෘජු සම්බන්ධතා පවතින වෘත්තීය පුහුණු ආයතනවලටද ඔවුන්ට අදාල දත්ත යාවත්කාලීන කිරීමේ හැකියාව පවතී. එමෙන්ම තොරතුරු ලබාදීම සඳහා විවිධ වෙබ් පිටු පවත්වාගෙන යනු ඇත.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය සංවර්ධනය හා පවත්වාගෙන යාම

කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම් වඩාත් නිවැරදිව හා යාවත්කාලීනව පවත්වාගෙන යාම හා කොමිෂන් සභාවේ නව වැඩිදියුණු වීම් හා වෘත්තීය හා කාර්මික අධ්‍යාපන පුහුණු ක්ෂෙත්‍රයේ නව සංවර්ධනයන් හඳුන්වාදීම් කොමිෂන් සභා අන්තර්ජාල වෙබ් අඩවියේ ඇතුළත් වේ. මෙම තොරතුරු එකී ක්ෂේත්‍රය පිළිබඳව උනන්දුවක් දක්වන අයට අතිශයින්ම ප්‍රයෝජනවත් වේ.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අන්තර්ජාල වෙබ් අඩවියේ අනුරුවක් පහත දැක්වේ.



කොමිෂන් සභාවේ ප්‍රධාන අන්තර්ජාල වෙබ් අඩවිය තුළින් පහත සඳහන් වෙබ්පිටුවලට පිවිසීමට අවස්ථාව සලසා ඇත.

- කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ප්‍රතිපත්ති
- ජාතික වෘත්තීය සුදුසුකම් චක්‍රලේඛන
- ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු (LMI)
- ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)
- පාඨමාලා ලියාපදිංචිය හා ප්‍රතීතනය (Registration & Accreditation)
- සැලසුම් හා පර්යේෂණ (Planning & Research)
- අභ්‍යන්තරජාලය (Intranet)
- කොමිෂන් සභාවේ පර්යේෂණ කවය
- පුවත් හා සිදුවීම්
- තොරතුරු පද්ධති
- කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු මගපෙන්වීම
- ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රදානය කිරීමේ ක්‍රමවේදය
- අයදුම්පත් හා තොරතුරු බාගත කිරීම
- අභ්‍යන්තර වෙබ් ජාලය

ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීම හා පවත්වාගෙන යාම

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ වර්තමාන රැකියා ඉල්ලුම සහ අනෙකුත් ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු සැපයීම අරමුණු කරගෙන ඊට අදාල ශ්‍රම වෙළෙඳපොල තොරතුරු පද්ධතියක් ස්ථාපනය කර ඇත.

දත්ත සමීක්ෂණය හා විශ්ලේෂණය මඟින් ලබාගන්නා ලද තොරතුරු ශ්‍රම වෙළෙඳපොළ ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සම්පාදකයන්, වෘත්තීය මාර්ගෝපදේශකයන්, රැකියාගත කිරීමේ නියුතු ආයතන, පුහුණුකරුවන්, සේවායෝජකයන් හා රැකියා අපේක්ෂකයින් යනාදී පාර්ශවවල ප්‍රයෝජනය සඳහා ප්‍රකාශයට පත්කරනු ලැබේ.

ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු වෙබ් පිටුව

කාර්යක්ෂම හා ඵලදායී ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු සේවාවක් යාවත්කාලීනව ඒවා භාවිත කරන්නන් හට ලබාදීමේ අරමුණින්ම වෙන් වූ ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු වෙබ් පිටුව 2022 වසර තුළ යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් ඇත.

- වත්මන් ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු විශ්ලේෂණය
- පුහුණු පාඨමාලා තොරතුරු අන්තර්ජාලයෙන් බලාගත හැකිවීම
- පසුගිය ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශන
- ශ්‍රම වෙළෙඳපොළ පිළිබඳ සංකල්ප හා අර්ථ දැක්වීම
- ප්‍රයෝජනවත් වෙබ් අඩවිවලට පිවිසුම
- ජීව දත්ත සහිත ඉල්ලුම් පත්‍ර සාදා ගැනීමට සහය වීම
- රැකියා ඇබෑර්තු තොරතුරු ලබාගැනීමට හැකිවීම
- කාර්මික හා ඊට සම්බන්ධ වෘත්තීය ක්ෂේත්‍රයේ ඉහළ ඉල්ලුමක් ඇති රැකියා 10 ක් ප්‍රදර්ශනය කිරීම යනාදී වැදගත් කරුණු ලබාදීමට කටයුතු කර ඇත.
- ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු පිළිබඳ සංකල්පීය යෙදුම් අර්ථ දැක්වීම් සහ පාරිභාෂික ශබ්දමාලා, වචන ශ්‍රම වෙළෙඳපොළ රැකියා දැන්වීම්වලට අමතරව සේවා නියුක්තිකයන් විසින් ඉදිරිපත් කරන ලද විවිධ තොරතුරු යාවත්කාලීන කර මෙම වෙබ් පිටුව ප්‍රකාශයට පත්කර ඇත.

ලියාපදිංචි හා ප්‍රතීතන වෙබ්පිටුව

මෙම වෙබ්පිටුව මඟින් ආයතන ලියාපදිංචිය හා පාඨමාලා ප්‍රතීතනය පිළිබඳ සියළුම තොරතුරු ලබාගැනීමට හැකිය. තවද මෙම වෙබ් අඩවියේ ලියාපදිංචි ආයතන හා කොමිෂන් සභාව විසින් ප්‍රතීතනය කරන ලද පාඨමාලා පිළිබඳ තොරතුරු, තත්ත්ව කළමනාකරණ පද්ධතිය පිළිබඳ තොරතුරු, ලියාපදිංචි ඉල්ලුම්පත්, ලියාපදිංචිය අළුත්කිරීමේ ඉල්ලුම්පත්, පාඨමාලා ප්‍රතීතන අයදුම්පත් ආදිය අඩංගු කර ඇත. තව ලියාපදිංචි වී ඇති ආයතන හා ප්‍රතීතනය කරන ලද පාඨමාලා පිළිබඳ තොරතුරු අන්තර්ජාලය ඔස්සේ පරීක්ෂා කල හැකි අතර එමඟින් ඕනෑම අයෙකුට නොයෙක් ක්‍රමවේදයන්ට අනුව තොරතුරු සොයාගත හැකිය.

වෙබ්පිටුව මඟින් පාඨමාලා ලියාපදිංචිය, ආයතන ලියාපදිංචි කිරීම සඳහා Online ක්‍රමයට අයදුම්කල හැකිවීම සහ එක් එක් ආයතන සඳහා වෙනම ද්වාරයක් වෙන් කර තිබීම විශේෂත්වයකි. මෙම ක්‍රියාවලිය 2022 වසරේ දී තවදුරටත් වැඩි දියුණු කරන ලදී. මෙම පහසුකම් NVQ සහතිකපත් මුද්‍රණය කරන වෙබ් අඩවිය හා සම්බන්ධ කර ඇත. මෙය තත්ත්ව කළමනාකරණයේ ඉදිරි පියවරකි.

NVQ තොරතුරු පද්ධති මෘදුකාංගය නව අංගයන් එකතු කරමින් වැඩිදියුණු කිරීම

2022 වර්ෂයේ දී කොමිෂන් සභාවේ ප්‍රධාන පරිගණක මෘදුකාංග වන NVQ තොරතුරු පද්ධති මෘදුකාංගය සඳහා පහත නව අංගයන් එකතු කර පද්ධතිය වැඩි දියුණු කිරීම සිදු කරන ලදී. මේ මඟින් අපගේ සියළු පාර්ශවකරුවන්ට ගුණාත්මක බවින් ඉහළ සේවාවක් ලබාදීමට හැකි වී ඇත.

- ඇගයීම්කරුවන් බඳවා ගැනීමට ඉල්ලුම් කිරීමේදී Online ක්‍රමයට ඉල්ලුම් කිරීමට පද්ධතිය වැඩි දියුණු කිරීම ආරම්භ කිරීම
- Online ක්‍රමයට RPL සඳහා ඉල්ලුම් කිරීමට පද්ධතිය වැඩිදියුණු කිරීම ආරම්භ කිරීම
- DTET සහ VTA ආයතනවල ප්‍රධාන කාර්‍යාලයෙන් එම ආයතවලට අයත් සියළුම පුහුණු ආයතන වල සාරාංශ තොරතුරු බලාගත හැකි පරිදි පද්ධතිය වැඩි දියුණු කිරීම
- Curriculum වලංගුභාවය තහවුරුකිරීමේ ප්‍රගතිය NAITA ආයතනයේ යාවත්කාලීන කිරීමට පද්ධතිය සැකසීම
- දැනුම පරීක්ෂා කිරීමේදී තනි අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල (individual candidates results) ඇතුළත්කල හැකිපරිදි පද්ධතිය වැඩිදියුණු කිරීම

අන්තර්ජාලය, විද්‍යුත් තැපෑල හා පහසුකම්

- විද්‍යුත් තැපෑල භාවිත කිරීම පිළිබඳව වූ රජයේ චක්‍රලේඛය අනුව කාර්යාල තොරතුරු හුවමාරු කිරීමේදී කාර්යක්ෂමතාවය වැඩිකිරීම, වියදම අඩුකිරීම සහ කාලය ඉතුරු කර ගැනීම සඳහා නව්‍යතාවයකින් යුතුව අන්තර්ජාලය හා විද්‍යුත් තැපැල් පහසුකම් කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකුටම භාවිත කිරීමට පහසුකම් සලසා ඇත. එමඟින් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සන්නිවේදන කාර්යක්ෂමතාවය වර්ධනය කර ගැනීමට මෙන්ම අන්තර්ජාලය තුළින් නව දැනුම ලබාගැනීමට පහසුකම් සලසා ඇත. කාර්යය මණ්ඩලය වෙත තොරතුරු ලබාදීම සඳහා අභ්‍යන්තර ජාලයක් නඩත්තු කරනු ලබයි.
- මෙම නව සන්නිවේදන ක්‍රමයේ ඇති නම්‍යශීලි බව හා එමඟින් තොරතුරු ලබාගැනීමේ ඇති පහසුව නිසා එය පරිහරණය කරන්නන්ගේ අවධානයට ලක්ව තිබේ.

- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට කාර්යක්ෂමව තොරතුරු සන්නිවේදනය කරගැනීමේ වැඩි ඉඩ ප්‍රස්ථාවක් සලසනු වස් විද්‍යුත් තැපෑල (Email) සහ අන්තර්ජාල පහසුකම් 2022 වසරේ දී වඩාත් පුළුල් කර ඇත.
- තොරතුරු පද්ධති අංශය අභ්‍යන්තර පරිගණක ජාලය, අන්තර්ජාල හා ඉලෙක්ට්‍රෝනික තැපැල් පද්ධති, පරිගණක ජාල පිවිසුම් බාධක (Network Firewall) ආදිය ආයතනයේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා 2022 වසර තුළද පවත්වාගෙන ගොස් ඇත.

කොමිෂන් සභාවේ පුස්තකාලය

කොමිෂන් සභාවේ පුස්තකාලය මඟින් දෙස් විදෙස් විවිධ අධ්‍යාපන ක්ෂේත්‍රවල නියුතු විවිධ තරාතිරම්වලට අයත් පර්යේෂකයන් විද්වතුන් හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ පුද්ගලයන් හට පුස්තකාල පහසුකම් සලසා ඇත. ඒ අනුව පුස්තකාලය මඟින් පහත සඳහන් සේවාවන් ලබා දීම සිදුවේ.

- වෘත්තීය හා කාර්මික අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයට අදාල පොත්පත්, පර්යේෂණ වාර්තා සැපයීම.
- කොමිෂන් සභාවේ ප්‍රකාශන පාලනය හා බෙදාහැරීම.
- වාර සඟරා පරිහරණයට ඉඩ සැලසීම.
- දිනපතා පුවත්පත් පරිහරණයට ඉඩ සැලසීම හා අනෙකුත් ප්‍රලේඛන කාර්යයන්
- වෙනත් විවිධ තොරතුරු පරිශීලන, ප්‍රලේඛන සේවා සහ තොරතුරු සේවා සැපයීමේ පහසුකම්

ඊට අමතරව කොමිෂන් සභාවේ පුස්තකාලයේ නොමැති එහෙත් උනන්දුවක් දක්වන පාඨකයන් හට අන්තර් පුස්තකාල පිරුළු සේවාව මඟින් අවශ්‍ය පුස්තකාල තොරතුරු සේවාව සපයා ඇත. කාර්යය මණ්ඩලයේ නිලධාරීන්ගේ තොරතුරු අවශ්‍යතා ඉටුකරනු වස් පසුගිය වසර තුළ ද වෙනත් පුස්තකාල මඟින් තොරතුරු සම්පත් හුවමාරු කරගෙන ඇත.

තවද බ්‍රිතාන්‍ය කවුන්සිලයේ ඇති පුස්තකාලයේ ආයතනික සාමාජිකත්වය ද ලබාගෙන තිබේ. එමඟින් අතිරේක පොතපත පරිශීලනය කිරීමට පහසුකම් සළසා ඇති අතර අන්තර්ජාතික දැනුම පාඨකයන්ට ලබා දීමට පුස්තකාලය 2022 වසරේ ද කටයුතු කර ඇත.

පුහුණු සැසි පැවැත්වීම

කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි වී ඇති සහ ලියාපදිංචි විය යුතු ආයතන සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය වන පරිගණක මෘදුකාංග පවත්වාගෙන යාම සහ එම කටයුතු සාර්ථකව කරගෙන යෑමට අවශ්‍ය පුහුණු සැසි පැවැත්වීම සහ අවශ්‍ය තොරතුරු එම ආයතන වෙත ලබා දීම 2022 වර්ෂයේදී ද සිදුකරන ලදී.

කර්මාන්ත සබඳතා

හැඳින්වීම

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව කාර්මික වෘත්තීය අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රය කර්මාන්තයේ අවශ්‍යතාවයන්ට ගැළපෙන ලෙස අනාගත වෘත්තීය අවස්ථාවන් සඳහා නිපුණ ශ්‍රම බලකායක් බිහි කිරීම සඳහා කර්මාන්ත ක්ෂේත්‍රය සමඟ මනා සබඳතාවයක් ගොඩනඟා ගනිමින් ආංශික නිපුණතා සහා ප්‍රාදේශීය කර්මාන්තකරුවන් සමඟ සබඳතා පවත්වාගෙන කර්මාන්තයේ අවශ්‍යතාවයන් හඳුනාගනී. එමෙන්ම තරුණ තරුණියන්ට නිවැරදි වෘත්තීය මාර්ගෝපදේශන ලබාදීම සඳහා ඉහළ තත්ත්වයකින් යුතු වෘත්තීය මාර්ගෝ -පදේශන සේවාවන් ක්‍රියාත්මක කිරීමට සහ කාර්මික වෘත්තීය අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ජාත්‍යන්තර සංවිධාන ආයතනයන්හි සබඳතා ශක්තිමත් කිරීමට අවශ්‍ය කටයුතු ඉටුකර ඇත. එමෙන්ම මෙම ක්ෂේත්‍රය පිළිබඳව පොදු මහජනතාව දැනුවත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

ආංශික නිපුණතා සහා පවත්වාගෙන යාම

ආංශික නිපුණතා සහා 6ක් පවත්වාගෙන යාම වෙනුවෙන් ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන මඟින් ලබාදෙන ප්‍රතිපාදන ආංශික නිපුණතා සහා වෙත ප්‍රතිපූරණය කිරීම සහ වඩාත් ඵලදායීව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.

- ඉදිකිරීම් කර්මාන්ත ආංශික නිපුණතා සභාව.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්ත ආංශික නිපුණතා සභාව.
- නිෂ්පාදන හා ඉංජිනේරු සේවා ආංශික නිපුණතා සභාව.
- සංචාරක කර්මාන්ත ආංශික නිපුණතා සභාව.
- සෞඛ්‍ය හා රැකවරණ සේවා ආංශික නිපුණතා සභාව.
- කෘෂිකර්මාන්ත ආංශික නිපුණතා සභාව.

ඉදිකිරීම් කර්මාන්ත ආංශික නිපුණතා සභාව.

ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍රයේ කර්මාන්තකරුවන් එකී ක්ෂේත්‍රයේ වෘත්තික සංගම් නියෝජනය සහිතව පිහිටුවා ඇති අතර, ක්ෂේත්‍රයේ පුහුණු ශ්‍රම අවශ්‍යතාවයන් පුරෝකථනය කරමින් ජාතික නිපුණතා සම්මත සංවර්ධනය කිරීමට සහ යාවත්කාලීන කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. එමෙන්ම Trade guilds, ජලනල කාර්මික සහ විදුලිකාර්මික ක්ෂේත්‍රයන්හි ක්‍රියාත්මක කර ඇත.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්ත ආංශික නිපුණතා සභාව.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ කර්මාන්තයේ අවශ්‍යතා හඳුනාගෙන ඒ අනුව අවශ්‍ය පියවර ගැනීම සඳහා මෙම නිපුණතා සභා පිහිටුවා ඇති අතර, ඒ අනුව අවශ්‍ය නිර්දේශයන් විවිධ අවස්ථාවලදී ලබාදීමට කටයුතු කර ඇත.

2022

- වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ පුහුණුව අවසන් කළ සිසුන් ලියාපදිංචි කිරීම හා කර්මාන්තකරුවන් ලියාපදිංචි කර සේවාව ලබාගැනීම සඳහා Mobile App නිර්මාණය කිරීම සිදුකරන ලදී.
- තොරතුරු හා සන්නිවේදන ක්ෂේත්‍රයේ නියැලෙන සිසුන් ලියාපදිංචි කර එම සිසුන් හට තොරතුරු හා සන්නිවේදන ක්ෂේත්‍රයේ පාඨමාලාවන් හැදෑරීමට අවස්ථාව සැලසීමේ වැඩමුළු පවත්වන ලදී.

නිෂ්පාදන හා ඉංජිනේරු සේවා ආංශික නිපුණතා සභාව

ප්‍රධාන කර්මාන්ත ක්ෂේත්‍ර ආවරණය වන පරිදි මෙම සභාව ක්‍රියාත්මක වන අතර, කර්මාන්තයේ අවශ්‍යතාවය අනුව Production Technician ක්ෂේත්‍රයට අදාල නිපුණතා සම්මත සකස් කර ඇත.

සංචාරක කර්මාන්ත ආංශික නිපුණතා සභාව

සංචාරක කර්මාන්ත අංශයේ නියෝජනය සහිතව මෙම සභාව පිහිටුවා ක්‍රියාත්මක කරන අතර, එම ක්ෂේත්‍රයේ ප්‍රධාන ශ්‍රම අවශ්‍යතාවයන් සංවර්ධනය කිරීමේ අරමුණ පෙරදැරි කරගනිමින් ක්‍රියාත්මක කරයි.

2022

- සංචාරක ආංශික නිපුණතා සභාව ලෝක කාන්තා දිනයට සමගාමීව Homestay ව්‍යවසායකයින් දැනුවත් කිරීමේ වැඩසටහනක් 2022 මාර්තු 8 වන දින සීගිරිය කාශ්‍යප ලයන් රොක් හෝටලයේදී පවත්වන ලදී.
- ලෝක නිපුණතා දිනයට සමගාමීව දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් පවත්වන ලදී.
- හෝටල් හා සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රයේ පාඨමාලා හදාරන සිසුන් හට වෘත්තිකයෙකු බවට පත්වීම සඳහා අවශ්‍ය නිපුණතාවයන් පිළිබඳව සහ ව්‍යවසායකයින්ගේ අපේක්ෂා පිළිබඳ දැනුවත් කිරීමක් අහංගම වෘත්තීය පුහුණු අධිකාරියේ පැවැත්වීය.
- හෝටල් හා සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රයේ පාඨමාලා පවත්වන පුහුණු ආයතනවලට කර්මාන්තයේ අපේක්ෂාවන් පිළිබඳව සිසුන්ගේ ඉදිරි ගමන් මඟ පිළිබඳ දැනුවත් කිරීමක් සිදුකරන ලදී.
- F & B and Cookery ,Housekeeping & front office, Social Media & Marketing පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් සීගිරිය දඹුල්ල හබරන ප්‍රදේශයන්හි Homestay ව්‍යවසායකයින් හට පවත්වන ලදී.
- සංචාරක ක්ෂේත්‍රයේ නව අවස්ථා හඳුනාගෙන ඒ සඳහා ජාතික නිපුණතා සංවර්ධනය යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම

කෘෂිකර්මාන්ත ආංශික නිපුණතා සභාව

කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ කර්මාන්තයන්හි සහභාගීත්වය සහිතව මෙම ආංශික සභාව 2022 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර, මේ වන විට මූලික කටයුතු ඉටුකර ක්‍රියාත්මක මට්ටමේ පවතී.

2022

කෘෂිකර්මාන්ත ආංශික නිපුණතා සභාව අළුතින් ආරම්භ කරන ලද අතර එහි ආරම්භක රැස්වීම් 6ක් වර්ෂයේදී පවත්වනු ලැබීය.

සෞඛ්‍ය හා රැකවරණ සේවා කමිටුව

සෞඛ්‍ය හා රැකවරණ ක්ෂේත්‍රයේ නියෝජනය සහිතව අදාලව ක්‍රියාමාර්ග ගැනීම සඳහා මෙම කමිටුව ස්ථාපිත කර ඇත අතර, ඒ සඳහා ප්‍රධාන පෞද්ගලික රෝහල් නියෝජනය සහිතව ක්‍රියාත්මක වේ.

2022

- වර්ෂයේදී පහත සඳහන් ජාතික නිපුණතා සම්මතයන් හා විෂය මාලා සංවර්ධනය කිරීම සිදුකරන ලදී.
    - Phlebotomist
    - Cardiac Care Technician
    - Nursing Educator
    - Nursing level 6
    - Medical Laboratory Technician
    - Dialysis Technician
    - Health Promotion
- 2022 වර්ෂයේ මණ්ඩලීය රැස්වීම් 12ක් පවත්වන ලදී.

ආංශික නිපුණතා සභාවන්හි ප්‍රගති සමාලෝචනය

2022

- ආංශික නිපුණතා සභාවන්හි ප්‍රගති සමාලෝචනය හා ඉදිරි කටයුතු පැහැදිලි කිරීම සඳහා සභාපතිවරුන් සමඟ රැස්වීම් පැවැත්වීම.
- ආංශික නිපුණතාවන්හි ප්‍රගති සමාලෝචනය හා ඉදිරි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙන්ම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ගැටළු නිරාකරණය සඳහා වර්ෂයේදී රැස්වීම් 3ක් පමණක් පවත්වන්නට යෙදුනි. අවශ්‍ය සන්නිවේදන කටයුතු ඊමේල් මගින් පවත්වන ලදී.

වෘත්තීය මාර්ගෝපදේශන සේවාව සම්මතකරණය

වෘත්තීය මාර්ගෝපදේශ ප්‍රමිතිකරණය (NVQ 4 සහ 5 මට්ටම) සඳහා ජාතික නිපුණතා ප්‍රමිති හඳුන්වාදීම

වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම හඳුන්වාදීම

වෘත්තීය මාර්ගෝපදේශක වෘත්තිකයන් සඳහා හැඳුනුම්පත හඳුන්වාදීම

වෘත්තීය මාර්ගෝපදේශන නිළධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම

- සුදුසුකම්ලත් වෘත්තීය මාර්ගෝපදේශන නිළධාරීන් ප්‍රකාශයට පත්කිරීම.වෘත්තීය මාර්ගෝපදේශන මෙහෙයුම් කමිටුවේ යෝජනාවකට අනුව දිවයින පුරා පවත්නා වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන අධීක්ෂණයට ලක්කිරීම වර්ෂයේ ආරම්භ කළ අතර මධ්‍යස්ථාන 41ක් පරීක්ෂාවට ලක්කරන ලදී.
    - වෘත්තීය මාර්ගෝපදේශනය වෘත්තීය සුදුසුකම් 5 සඳහා ජාතික නිපුණතා සම්මතයක් හා විෂය මාලාව සංවර්ධනය කිරීම
    - වෘත්තීය මාර්ගෝපදේශන මෙහෙයුම් කමිටු රැස්වීම් 5ක් පැවැත්වීම

- වෘත්තීය මාර්ගෝපදේශනයෙහි නියුතු නිලධාරීන් ලියාපදිංචි කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ 20ක් පැවැත්වීම
- සුදුසුකම් ලත් වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරීන් 67ක් දත්ත පද්ධතියට ඇතුළත් කිරීම
- වෘත්තීය මාර්ගෝපදේශන ජාතික වෘත්තීය සුදුසුකම් 4 සඳහා ඇගයුම්කරුවන් තෝරාගැනීම
- වෘත්තීය මාර්ගෝපදේශකයින් සඳහා ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වා දීම
- වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම සඳහා ක්‍රමවේදයක් සහ වෘත්තීය මාර්ගෝපදේශකයින් සඳහා හැඳුනුම්පත් ක්‍රමවේදයක් හඳුන්වා දීම
- පොදු වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන සංවර්ධනය හා වැඩිදියුණු කිරීමට දිස්ත්‍රික් වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන සංවර්ධනයට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීම.
- 2022 වර්ෂයේදී තාක්ෂණ හා කාර්මික විද්‍යාලයන්හි කුරුණෑගල, මාතලේ, වරකපොල, රත්නපුරය, කොළඹ, වාරියපොල, ගම්පහ, දඹුල්ල, නුවරඑළිය, බෙලිඅත්ත, වීරවිල, බණ්ඩාරවෙල, මහනුවර, පාතදුම්බර සහ ඇඹිලිපිටිය යන මධ්‍යස්ථාන සඳහා ප්‍රතිපාදන ලබාදෙන ලදී.
- එමෙන්ම ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියෙහි පුත්තලම, කෑගල්ල, මඩකලපුව, මහනුවර, කටුගස්තොට, බදුල්ල හා තලල්ල මධ්‍යස්ථාන සංවර්ධනය සඳහා ප්‍රතිපාදන ලබාදෙන ලදී.
- පෙර දැනුම ඇගයීම RPL ක්‍රමවේදය e - RPL ක්‍රමවේදය ලෙස ක්‍රියාත්මක කිරීම පිළිබඳව වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරීන්, නිපුණතා සංවර්ධන නිලධාරීන්, සමෘද්ධි නිලධාරීන් දැනුවත් කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- නිපුණතා සංවර්ධන නිලධාරීන්, වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරීන්, වෘත්තීය මාර්ගෝපදේශන ක්ෂේත්‍රයේ නිලධාරීන් සඳහා කුසලතා වර්ධන වැඩසටහන් පැවැත්වීම.
- දිස්ත්‍රික්ක 25ම ආවරණය වන පරිදි වෘත්තීය මාර්ගෝපදේශන කාර්යයෙහි නියුතු සියලුම නිලධාරීන් සඳහා කුසලතා වර්ධන වැඩසටහන් 25ක් සහ ජාතික යොවුන් සේනාංකයේ නිලධාරීන් සඳහා වැඩසටහන් 4ක් වන පරිදි වැඩසටහන් 29ක් ජාත්‍යන්තර කම්කරු සංවිධානය හා ඒකාබද්ධව පැවැත්විය.

- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ප්‍රතිපාදන සහිතව වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරීන් සඳහා මාර්ගගත ක්‍රමවේදයක් ආරම්භ කිරීම
- ජාතික වෘත්තීය සුදුසුකම් ජාත්‍යන්තරව පිළිගැනීමට ලක්කිරීම සඳහා අදාල පාර්ශවයන් සමඟ සම්බන්ධ වීම.
- ජාතික වෘත්තීය සුදුසුකම ගලපා ගැනීම සඳහා සෞදි අරාබිය හා අනෙකුත් රටවල් සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කර අවශ්‍ය නීතිමය කටයුතු සම්පාදනය කරන ලදී. එමෙන්ම ඉදිකිරීම් අංශය සඳහා ජර්මානු ව්‍යාපෘතියක් සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම ආරම්භ කරන ලදී.

කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රය පිළිබඳ දැනුවත් කිරීම (මාධ්‍ය/ මාර්ගගත දැනුවත් කිරීමේ වැඩසටහන්)

- ජනමාධ්‍ය සමඟ සම්බන්ධව වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය පිළිබඳව ප්‍රචාරය කිරීම හා තොරතුරු බෙදා හැරීම.
- වෘත්තීය අධ්‍යාපනය පිළිබඳව දැනුවත් කිරීම සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශය සමඟ මාධ්‍ය සාකච්ඡා දෙකක් පැවැත්වූ අතර සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම් පිළිබඳ ගුවන් විදුලි පණිවුඩ මාසයක් පුරාවටම ප්‍රචාරය කරන ලදී. එමෙන්ම දොරමඩලාව වැඩසටහනේ වැඩසටහන් දෙකක්, රූපවාහිනී දැනුවත් කිරීමේ වැඩටසහන් 8ක් ගුවන් විදුලි දැනුවත් කිරීමේ වැඩසටහන් 5ක් පවත්වන ලදී.

- ලෝක තරුණ නිපුණතා දිනයට සමගාමීව විවිධ වෘත්තීය ක්ෂේත්‍රයන්හි online webinar series පැවැත්වීම
- ප්‍රතිපත්ති සංවර්ධනය උදෙසා ජාතික වෘත්තීය මාර්ගෝපදේශන මෙහෙයුම් කමිටුවක් ක්‍රියාත්මක කිරීම. මෙමඟින් පහත සඳහන් අරමුණු ක්‍රියාත්මක කරන ලදී.
- කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂෙත්‍රයේ නව සංවර්ධන මානයන් පිළිබඳව දිස්ත්‍රික් මට්ටමින් වැඩසටහන් පැවැත්වීම හා පවත්නා රැකියා අවස්ථාවන් පිළිබඳව මහජනතාව, පාසල් සිසුන්, පාසල් හැරගිය සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට අවශ්‍ය කටයුතු කිරීම.
    - දොම්පෙ අධ්‍යාපන කලාපයට අයත් විදුහල්පතිවරුන් හා ගුරුවරුන් දැනුවත් කිරීම
    - ඩී එස් සේනානායක විද්‍යාලයේ තාක්ෂණික අංශයේ සිසුන් දැනුවත් කිරීම
    - දොම්පෙ අධ්‍යාපන කලාපයට අයත් පාසල් හැරගිය සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම
    - රූපලාවන්‍ය අංශයේ සේවයෙහි නියුතුවූවන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම ලබාගැනීමට දැනුවත් කිරීම
    - රාජ්‍ය සේවකයන් හට වෘත්තීය පුහුණු ක්‍රමවේදය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් මහනුවරදී සිදුකිරීම
    - ආධුනිකත්ව පුහුණුවෙහි නියුතුවූවන් සඳහා දැනුවත් කිරීම් සිදුකිරීම
    - මීගමුව කලාපයේ පාසල් සිසුන් හට දැනුවත් කිරීම් සිදුකිරීම
    - අළුතින් බඳවා ගන්නා ලද උපාධිධාරීන් සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම
    - හාපිටිගම ගුරුවරුන් පුහුණු කිරීමේ ආයතනයේදී දැනුවත් කිරීම් සිදුකිරීම
    - සමෘද්ධි නිලධාරීන් හට පෙර ඇගයීම් ක්‍රමවේදය පිළිබඳව දැනුවත් කිරීම් සිදුකිරීම
    - පේරාදෙණිය විශ්ව විද්‍යාලයීය ශිෂ්‍ය සමාජය විසින් තරුණයින් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහනක් සංවිධානය කරන ලද අතර ඒ සඳහා මාර්ගගතව සම්පත්දායකත්වය සැපයීම
    - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය මඟින් සංවිධානය කරන ලදුව තරුණ තරුණියන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන සැසි පැවැත්වීම
    - අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය අධ්‍යාපන කලාපයේ පාසල් දෙකක් සහ කොට්ඨාශ මට්ටමින් වෘත්තීය මාර්ගෝපදේශන ගුරුවරුන් දැනුවත් කිරීම සහ තරුණ තරුණියන් දැනුවත් කිරීම සඳහා වැඩසටහන් හතරක් පවත්වන ලදී
- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිබඳව පුහුණු ආයතන හා නිලධාරීන්, මහජනතාව, පාසල් සිසුන්, දෙමාපියන් දැනුවත් කිරීම සඳහා අත්පත්‍රිකා සකස් කිරීම.

මජහනතා දැනුවත් කිරීමේ අත්පත්‍රිකා සහ පොත්

- දැනට භාවිතයේ ඇති අත්පත්‍රිකා යාවත්කාලීන කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලද E-players, පෝස්ටර්, බැනර් සකස් කර ප්‍රචාරණය කරන ලදී.
- කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා විවිධ ආයතන ව්‍යාපෘති සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම.

ජාත්‍යන්තර ආයතන සමඟ සම්බන්ධතා

- ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ලෝක කම්කරු සංවිධානය, Youlead, KOICA, S4IG සමඟ සම්බන්ධ වී කටයුතු කරන ලදී.
- **ILO** - ජාත්‍යන්තර කම්කරු සංවිධානය සම එළඹී එකඟතාවය අනුව කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රය සංවර්ධනය සඳහා ආධාර ලබාදෙන ලදී. ඒ අනුව,
    - ජාතික මට්ටමින් TVEC වෙබ් අඩවි සේවා සංවර්ධනය කිරීම
    - ඇගයීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්
    - පොදු ජනතාව දැනුවත් කිරීම
    - මාර්ගගත නිපුණතා ඇගයීම සහ සහතිකකරණය සඳහා ක්‍රමෝපායන් සංවර්ධනය හඳුනාගත් ක්ෂේත්‍ර 04 සඳහා
    - ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
    - (ඇගයුම්කරුවන්, වෘත්තීය මාර්ගෝපදේශන නිළධාරීන්, NVQ ඇගයීම් සම්බන්ධ ප්‍රාදේශීය නිළධාරීන්, නිපුණතා බලපත්‍ර ලබාදෙන නිළධාරීන් ආදී)
    - ජාත්‍යන්තර කම්කරු සංවිධානය හා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව අතර අංක 40374532/0 දරණ ගිවිසුම ක්‍රියාත්මක කිරීම.
- **KOICA** - මාර්ගගත වෘත්තීය පද්ධතියක් NVQ 5/6 පාඨමාලා හැදෑරීමට බලාපොරොත්තුවනල හදාරන තරුණ තරුණියන් සිසුන් ඉලක්ක කර ක්‍රියාත්මක කිරීම
    - KOICA සමඟ වෘත්තීය මාර්ගෝපදේශන තොරතුරු පද්ධතියක් සඳහා 2023-2026 ගිවිසුමකට එළඹීම සහ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම
- S4IG සහ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව අතර අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම

ඔවුන්ගේ සංවිධානාත්මක විධානයන්ට අනුකූලව පාර්ශවයන් පහත සඳහන් ප්‍රතිඵල ලබාගැනීමට සහයෝග යෙන් කටයුතු කිරීම

- ආබාධ සහිත පුද්ගලයන් සඳහා ප්‍රවේශය හා කුසලතා පිළිගැනීම වැඩි කිරීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සාධාරණ ගැලපුම් චක්‍රලේඛ, මාර්ගෝපදේශ සහ මෙවලම් ජාතික වශයෙන් ක්‍රියාත්මක කිරීම මෙන්ම තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ඇගයීම්කරුවන්ට පුහුණු මොඩියුලයක් ලබාදීම.
- අවම වශයෙන් රැකියා අටක් සඳහා ඇගයීම්කරුවන්ගේ ඇගයීම් සඳහා මෙවලම් කට්ටලයක් සැදීම.
- සංචාරක කර්මාන්තය, රජයේ සහ පෞද්ගලික ආගන්තුක සත්කාර ආශ්‍රිත පුහුණු ආයතන සමඟ සහයෝග යෙන් S4IG සංවර්ධිත පුහුණු පාඨමාලා/ මොඩියුල ප්‍රතිනතය හා පිළිගැනීම.
- ආගන්තුක සත්කාර කුසලතා, වෘත්තීය ඉවුම් පිහුම් සහ වෘත්තීය පේස්ට්‍රි, බේකරි සහ රසකැවිලි පාඨමාලා සඳහා කර්මාන්ත පුහුණුකරුවන් සහ තක්සේරුකරුවන් ලියාපදිංචි කිරීම හා සහතික කිරීම
- සූපවේදීන්ගේ සහ මුළුතැන්ගෙයි මෙහෙයුම් කාර්ය මණ්ඩලයේ කුසලතා වැඩිදියුණු කිරීම සඳහා පෙර ඇගයුම් (RPL) හඳුනාගැනීම සහ ආගන්තුක සත්කාර අංශයේ දැනට සිටින පුද්ගලයින්ගේ කුසලතා ඉහළ නැංවීම.
- සංචාරක හා ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ වර්තමාන කර්මාන්ත අවශ්‍යතා සඳහා අවශ්‍ය නිපුණතා සංවර්ධනය කිරීම සඳහා කුසලතා පරතරයන් හඳුනාගැනීමට සහ නිපුණතා නොගැලපීම් ඉවත් කිරීමට සියලුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලට සැලසුම් නිර්මාණය කිරීම

- සංචාරක කර්මාන්තයේ විශේෂයෙන්ම කුඩා සහ මධ්‍ය පරිමාන සමාගම්වල ආගන්තුක සත්කාර සේවා සඳහා ප්‍රතීතන කටයුතු මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදුකිරීමට අවශ්‍ය මෙවලම් සකස් කිරීම
- සංචාරක හා ආගන්තුක සත්කාර කර්මාන්තවල නම්‍යශීලී ඉගෙනුම් අවස්ථා සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ඉගෙනීමට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා වෙබ් අඩවියේ තීරයක් වෙන් කිරීම
- සංචාරක ක්ෂේත්‍රයේ වෘත්තීය සංවර්ධනයට හා විකල්ප වෘත්තීන්ට අදාල කුසලතා සංවර්ධනය කිරීමට අවශ්‍ය වෘත්තීය උපදේශනය හා මාර්ගෝපදේශනය සඳහා මෙවලම් සකස් කිරීම. එම මෙවලම් සකස් කිරීමට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් පහසුකම් සලසනු ඇත.
- නව සේවකයන් හා දැනට ක්ෂේත්‍රයේ සිටින සේවකයන් සඳහා පුහුණුව හා රැකියාවේ ඵලදායීතාවය වැඩිදියුණු කිරීම සඳහා ආංශික නිපුණතා සභාව සමඟ සම්බන්ධ වෙමින් රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ආකෘති සංවර්ධනය කිරීම

විශේෂ වැඩසටහන්

අප විසින් විවිධ වර්ෂයන් තුළදී ඇගයුම්කරුවන්ගේ සංඝතභාවය ආරක්ෂා කිරීම සඳහා දීප ව්‍යාප්ත මට්ටමේ වැඩමුළු පවත්වනු ලබයි. 2022 වර්ෂය තුළදී රටේ පැවති තත්ත්වය හමුවේ අපි භෞතික වැඩමුළු නොපැවැත්වූ අතර ඒ වෙනුවට මාර්ගගත ක්‍රමයට පහත ක්ෂේත්‍රයන්හි ඇගයුම්කරුවන් දැනුවත් කිරීමේ වැඩමුළු (05) පවත්වන ලදී.

- තොරතුරු සන්නිවේදන ක්ෂේත්‍රය
- හෝටල් හා සංචාරක ක්ෂේත්‍රය
- සෞඛ්‍ය ක්ෂේත්‍රය
- ඉදිකිරීම් ක්ෂේත්‍රය
- කෘෂිකාර්මික ක්ෂේත්‍රය

දිස්ත්‍රික් මට්ටමේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළු

අප කොමිෂන් සභාව හා ජාත්‍යන්තර කම්කරු සංවිධානය හා ඒකාබද්ධව දිස්ත්‍රික් 25 තුළ සිටි සියළු රාජ්‍ය අංශයේ වෘත්තීය පුහුණු ආයතනවල කළමණාකාරිත්වය හා පද්ධතිය භාරව රාජකාරි කටයුතුවල නියුතු නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළු පවත්වන ලදී. මෙමඟින් ඉදිරියේදී පද්ධතිය තුළ දත්ත ඇතුළත් කිරීමේදී ඇතිවන ප්‍රායෝගික ගැටළු අවම වීම තුළින් ආයතනය විසින් සපයන සේවාව කාර්යක්ෂම හා ඵලදායී කරගැනීමට හැකිවේයැයි අපගේ අපේක්ෂාවයි.

RPL ක්‍රමවේදය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම

RPL ක්‍රමවේදය හරහා NVQ සහතික පත්‍ර ලබාදෙන ප්‍රමුඛ පෙලේ රාජ්‍ය ආයතනවල දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන් මාර්ගගත ක්‍රමය ඔස්සේ (Zoom හරහා) අදාල ක්‍රමවේදය නිසි පරිදි සිදුකරන ආකාරය පිළිබඳව දැනුවත් කරන ලදී.

කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ආධාර සපයන ව්‍යාපෘති/ වැඩසටහන් සමඟ කටයුතු කිරීම.

- ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 සඳහා KOICA ව්‍යාපෘතිය සමඟ 2023 සිට 2026 දක්වා සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම
- YouLead ව්‍යාපෘතිය සමඟ වෘත්තීය මාර්ගෝපදේශන සංවර්ධන කටයුතු සඳහා දායක වීම
- කාර්මික අධ්‍යාපන හා පුහුණු දෙපාර්තමේන්තුව සමඟ KOICA ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම
    - කර්මාන්තය සමඟ සම්බන්ධවීමට කාර්මික සේවා කාර්යාංශය සම්බන්ධ කිරීම
    - ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය සමඟ මෝටර්රථ කාර්මික, රැකවරණ සේවා, ශීතකරණ හා වායු සමීකරණ සහ ඇලුමිනියම් කර්මාන්ත සංවර්ධනය පිළිබඳ සාකච්ඡා කිරීම
    - ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය සමඟ තාක්ෂණ විෂය මාලාව හදාරන සිසුන් සඳහා කර්මාන්තගත පුහුණුව පිළිබඳව කටයුතු කිරීම
    - කර්මාන්ත නඟා සිටුවීම උදෙසා කර්මාන්ත අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව කටයුතු කිරීම
    - බෝම්බ නිශ්කාශන අංශයේ සේවය කරන ලද සේවකයින් සඳහා කෙටිකාලීනව නිපුණතාවන් ලබාදීමට අවශ්‍ය කටයුතු කිරීම
    - දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සඳහා කර්මාන්ත සම්බන්ධතා අංශයේ නිලධාරීන් සම්බන්ධ වූ අතර ප්‍රාදේශීය කර්මාන්ත සභා හා ඒකාබද්ධව කටයුතු කිරීම සඳහා මෙම කමිටුවලට යෝජනා ඉදිරිපත් කිරීම.
    - වයඹ හා සබරගමුව නිපුණතා උද්‍යානය සඳහා ප්‍රධාන දායකත්වය සැපයීම
    - වයඹ කර්මාන්ත කරුවන්ගේ හමුවක් පැවැත්වීම
    - සේවා යෝජකයන් සහ ආධුනික අභ්‍යාසලාභීන් සඳහා රැකියා පුහුණු මාර්ගෝපදේශ පොත සකස් කිරීම සහ එළිදැක්වීම
    - ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය, කර්මාන්ත ආංශික නිපුණතා සභා, අමාත්‍යාංශය සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් කර්මාන්තගත පුහුණුව සඳහා සම්බන්ධීකරණ කමිටුවක් පිහිටුවීම
    - මහජන උපයෝගීතා කොමිෂන් සභාව සමඟ නිපුණතා බලපත්‍රය ලබාදීම පිළිබඳව කටයුතු කිරීම
    - ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමඟ දෙමාපියන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ මොඩියුල සංවර්ධනය කිරීම
    - ලෝක නිපුණතා දිනයට සමගාමීව Webinar මාලාවක් පැවැත්වීමට කටයුතු කිරීම
    - නව ආසියානු සංවර්ධන බැංකුවේ ව්‍යාපෘතිය සඳහා උපදේශකවරුන් සමඟ සාකච්ඡා කිරීම
    - ඔටිසම් ළමුන්ගේ සංගමය සඳහා වැඩමුළුවක් පැවැත්වීම
    - YouLead ආයතනය හා ශ්‍රී ලංකා පදනම් ආයතනය සමඟ සංක්‍රමණික ශ්‍රමිකයන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම සඳහා විෂය මාලා සංවර්ධනය කිරීම
    - ජාතික අධ්‍යාපන ආයතනික වැඩසටහන් යටතේ අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ තාක්ෂණ විෂය ධාරාව හදාරන සිසුන් සඳහා පවතින වෘත්තීය අවස්ථාවන් පිළිබඳ ලේඛනයක් සංවර්ධනය කිරීම

ප්‍රකාශන

ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශන 2 ක් වසරකට ප්‍රකාශයට පත්කරයි (TVEC website: www.tvec.gov.lk).

කාර්මික හා වෘත්තීය අධ්‍යාපන / පුහුණු මාර්ගෝපදේශය (TVET Guide)

ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශයට අමතරව 2022 වර්ෂය සඳහා කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණුව පිළිබඳ මඟ පෙන්වීමේ ප්‍රකාශනය (TVET GUIDE 2023) 2022 වසර අවසානයේ දී ප්‍රකාශයට පත් කරන ලදී.

මෙම (TVET GUIDE) ප්‍රකාශය පළාත් මට්ටමින් ආයතන අනුව හා අධ්‍යාපන ක්ෂේත්‍ර අනුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ වෘත්තීය පුහුණු පාඨමාලා විස්තර, පාඨමාලා බඳවා ගැනීමේ සුදුසුකම් ආදී විස්තර, පාඨමාලා ගාස්තු, ලියාපදිංචි පුහුණු ආයතන පිළිබඳ විස්තර හා ප්‍රතීතනය කල පාඨමාලා පිළිබඳ විස්තරවලින් සමන්විතව ඇත. පළාත් මට්ටමින් එක් එක් ආයතනවල පාඨමාලා හැදෑරීමට අවශ්‍ය සුදුසුකම් අනුව වර්ග කර දක්වා ඇත.

මෙම ප්‍රකාශනය පළාත් 9 ඇතුළත්වන සේ කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇති අතර, ඒ තුළින්

- පළාත් සහ අධ්‍යයන ක්ෂේත්‍ර අනුව ආයතන විස්තර
- පළාත් සහ අධ්‍යාපන සුදුසුකම් අනුව ආයතන විස්තර
- පළාත් සහ අධ්‍යයන ක්ෂේත්‍ර අනුව පාඨමාලා තොරතුරු ලබා ගත හැක



TVEC පුවත් ලිපිය



2022 වසර තුළ දී තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් සිදුකරන ලද කාර්යයන් පිළිබඳ දැනුවත් කිරීමේ අරමුණින් TVEC පුවත් ලිපියක් (TVEC Newsletter) ප්‍රකාශයට පත්කර සියලුම ලියාපදිංචි පුහුණු මධ්‍යස්ථාන හා ඒ පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන් අතරේ නොමිලයේ බෙදා හරින ලදී.

ජාතික නිපුණතා මෙහෙයුම් අත්පොත

යාවත්කාලීන කරන ලද ජාතික නිපුණතා මෙහෙයුම් අත්පොත සඳහා කොමිෂන් සභා අනුමැතිය ලබාගත් අතර 2022 වසරේදී එය ප්‍රකාශයට පත් කරන ලදී. (www.tvec.gov.lk)

කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ පර්යේෂණ අධ්‍යයන

කොමිෂන් සභාව විසින් සිදුකරන ලද පර්යේෂණ ප්‍රකාශයට පත් කර ඇත. (www.tvec.gov.lk)

වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස්කිරීම හා යාවත්කාලීන කිරීම

වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් මුද්‍රිත මාධ්‍යයෙන් ප්‍රකාශයට පත්කරනු ඇත.

කොමිෂන් සභාවේ මානව සම්පත

කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිළධාරියා ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා කටයුතු කරන අතර ඔහුගේ සහාය සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු, අධ්‍යක්ෂවරුන් හත් දෙනෙකු සහ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/සහකාර අධ්‍යක්ෂවරුන් හා සමාන්තර ශ්‍රේණි නිළධාරීන් 34 දෙනෙකු ඇතුළුව සෙසු කාර්යය මණ්ඩලය 73 දෙනෙකුගෙන් යුත් අනුමත කාර්යය මණ්ඩලය 116කින් සමන්විතයි. 2022.12.31 දිනට කාර්යය මණ්ඩලය 84 දෙනෙකුගෙන් සමන්විත විය. එහි සංක්ෂිප්තය ඇත.

කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලය - 2022

තනතුරු නාමය	2022/12/31 දිනට සේවයේ යෙදී සිටින සේවක සංඛ්‍යාව
අධ්‍යක්ෂ ජනරාල්	01
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්	01
අධ්‍යක්ෂ	03
සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ හා සමාන්තර නිළධාරීන්	28
පරිපාලන නිලධාරී හා වැඩසටහන් සම්බන්ධීකරණ නිලධාරි	07
සංවර්ධන නිළධාරි	08
තොරතුරු තාක්ෂණ නිළධාරි	00
තොරතුරු තාක්ෂණ සහකාර,පරිගණක යෙදවුම් සහායක	07
කළමණාකරන සහකාර (I ශ්‍රේණිය/ II ශ්‍රේණිය / III ශ්‍රේණිය) තොරතුරු සහායක	14
රියදුරු (I ශ්‍රේණිය/ II ශ්‍රේණිය / III ශ්‍රේණිය)	11
කාර්යාල කාර්ය සහායක	04
එකතුව	84

මානව සම්පත් කළමනාකරණයට අදාලව තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පහත නම් සඳහන් නිලධාරීන් 2022 වසර තුළදී කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි තනතුරුවලට පත්කර ගන්නා ලදී.

2022 වසරේ පත්වීම්

නම	තනතුර	පත්වීම් ලද දිනය
පී.ජී.කේ.පුංචිහේවා මෙනවිය	කළමනාකරණ සහකාර	2022.02.07

2022 වසරේ සේවයෙන් ඉවත්වීම් / විශ්‍රාම ගැනීම

නම	තනතුර	පත්වීම් ලද දිනය
ඩබ්.ඒ.ඩබ්.සී. ප්‍රේමරත්න මිය	අධ්‍යක්ෂ	2022.04.07
එම්.එල්.එන්.එස්. එදිරිසූරිය මිය	ශ්‍රම වෙළඳපළ විශ්ලේෂක	2022.08.15
ආර්.එස්. ප්‍රනාන්දු මිය	සහකාර අධ්‍යක්ෂ	2022.03.14
අයි.ඩබ්.එස්.ඒ. දිසානායක මිය	භාෂා පරිවර්ථක	2022.06.30
ඊ.ඩබ්.ඩී. විජයංග මහතා	කළමනාකරණ සහකාර	2022.07.15

2022 වර්ෂය තුළ ක්‍රියාත්මක වූ වැඩ බැලීමේ / වැඩ ආවරණය කිරීමේ තනතුරු සඳහා කොමිෂන් සභාව තුළින් තේරී පත් වූ නිළධාරීන්

2021 වර්ෂයේ වැඩ බැලීම්/වැඩ ආවරණය කිරීමේ විස්තර පහත පරිදි වේ

නම		තනතුර	පත්වීම් ලද දිනය
1.	මංජුල විදානපතිරණ මහතා	අධ්‍යක්ෂ (කර්මාන්ත සබඳතා)	2017.03.17
2.	ඒ.එස්. අමරසිංහ මිය	අධ්‍යක්ෂ (පාලන) වැඩ බලන / වැඩ ආවරණ	2020.07.10
3.	පී.පී. නානායක්කාර මිය	අධ්‍යක්ෂ (තත්ත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන) වැඩ ආවරණ	2021.08.09.
		අධ්‍යක්ෂ (වැ.බ.) (තත්ත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන)	2022.10.15
4.	ටී.සෙන්තුරන් මහතා	අධ්‍යක්ෂ (වැ.බ.) (සැලසුම් හා පර්යේෂණ)	2022.10.15
5.	එච්.බී.අයි.සම්පත් මහතා	සහකාර අධ්‍යක්ෂ (වැ.බ.)	2022.08.31
6.	ආර්.පී.ඩබ්.මුතුකුමාරණ මහතා	සහකාර අධ්‍යක්ෂ (වැ.බ.)	2022.08.31
7.	වයි.පී.එස්.උදයකාන්ති මිය	සහකාර අධ්‍යක්ෂ (වැ.බ.)	2022.08.31
8.	පී.ඒ.පී.කේ.පනන්ගල මිය	සහකාර අධ්‍යක්ෂ (වැ.බ.)	2022.08.31
9.	ආර්.ඩී.බී.මංජුලා මිය	සහකාර අධ්‍යක්ෂ (වැ.බ.)	2022.10.06
10.	ආර්.එන්.පී.ද සිල්වා මයා	සහකාර අධ්‍යක්ෂ (වැ.ආ.)	2022.03.15

දේශීය පුහුණු

කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ විෂය දැනුම වර්ධනය කිරීම පෙරදැරිව නිළධාරීන් දේශීය පුහුණුවීම් සම්මන්ත්‍රණවලට යොමු කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව 2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා දේශීය පුහුණු වීම් / සම්මන්ත්‍රණවලට සහභාගි වූ නිළධාරීන් පිළිබඳ විස්තර දැක්වේ.

තනතුර	තනතුරු සංඛ්‍යාව	පුහුණු පාඨමාලාව	කාල සීමාව
සහකාර අධ්‍යක්ෂ	02	Phd in Management - Lincoln University College Malaysia through the Sri Lanka Foundation Institution	4 years
සහකාර අධ්‍යක්ෂ (වැ.බ)	01	පශ්චාත් උපාධිය	02 years
සංවර්ධන නිළධාරී	01		
තොරතුරු තාක්ෂණ සහකාර	01	ඉලෙක්ට්‍රොනික විද්‍යාව - ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය	06 months
කාර්යාල කාර්යය සහායක	03	Food & Beverage	03 months
සහකාර අධ්‍යක්ෂ (වැ.බ)	01	Annual Stock Verification	1 Day
සහකාර අධ්‍යක්ෂ (වැ.බ)	01	Maintenance of Government Vehicle	
තොරතුරු සහායක	01		
කළමනාකරණ සහකාර	02	Workshop in Internal Auditing	
සංවර්ධන නිළධාරී, පරිගණක යෙවුම් සහායක, තොරතුරු තාක්ෂණ සහකාර, කළමනාකරණ සහකාර, තොරතුරු සහායකලේකාර්යා, කාර්යය සහායක	16	ලිපි ලිවීම	1 Day

වාර්ෂික වෘත්තීය සාමාජික ගාස්තු ප්‍රතිපූර්ණය

කොමිෂන් සභාවේ නිලධාරීන් වෘත්තීය ආයතනවල සාමාජික ගාස්තු ගෙවීමේදී පහත සඳහන් නිලධාරීන් සඳහා ඔවුන්ගේ සාමාජික ගාස්තු ප්‍රතිපූර්ණය කර ඇත.

1. ඒ.එස්. අමරසිංහ මහත්මිය -
   නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)
   ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය - සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරී සාමාජික ගාස්තු
2. ආර්.ජේ. සමරවීර -
   නියෝජ්‍ය අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන හා විමර්ශන)
   ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය - සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරී සාමාජික ගාස්තු
3. ආචාර්ය දිල්රුක්ෂි හේරත් මිය -
   නියෝජ්‍ය අධ්‍යක්ෂ (ආවරණ)
   වරලත් පුද්ගල කළමනාකරණ ආයතනය (CIPM)
4. එච්.බී.අයි. සම්පත් මයා -
   සහකාර අධ්‍යක්ෂ (වැ.බ)
   ශ්‍රී ලංකා වරලත් කළමනාකරණ ආයතනය
5. වයි.පී.එස්.උදයකාන්ති මිය -
   සහකාර අධ්‍යක්ෂ (වැ.බ)
   ශ්‍රී ලංකා වරලත් කළමනාකරණ ආයතනය
6. කුසලා පනංගල -
   සහකාර අධ්‍යක්ෂ (වැ.බ)
   වරලත් පුද්ගල කළමනාකරණ ආයතනය (CIPM)

අභ්‍යන්තර විගණන හා විමර්ශනය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්යයන්ට අදාලව විගණන පරීක්ෂණ පැවැත්වීම අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරනු ඇත. පෙර වර්ෂවලදී මෙන් අභ්‍යන්තර පාලන ක්‍රමවල ප්‍රමාණවත් බව, චක්‍රලේඛ උපදෙස්වලට, කොමිෂන් සභා පනත හා කොමිෂන් සභාවට අදාල වන වෙනත් නීතිරීතිවලට අනුකූලවීම විමසමින් කාර්ය සාධනය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන හා විමර්ශන කටයුතු විගණන සැළැස්මට අනුව ඉදිරියට ගෙන යන ලදී.

අභ්‍යන්තර විගණන හා විමර්ශන වැඩසටහන අනුව සැලසුම් කරන ලද ප්‍රධාන විගණන ප්‍රදේශ 06 ආවරණ කරන ලද අතර අභ්‍යන්තර විගණන හා විමර්ශන වැඩසටහන අනුව සැලසුම් නොකරන ලද විගණන විමර්ශනයන් ද අභ්‍යන්තර විගණනය විසින් අධ්‍යක්ෂ ජනරාල්ගේ හා විගණන හා කළමනාකරණ කමිටුවේ උපදෙස් පරිදි ඉටු කරන ලදී.

විගණන හා විමර්ශන කටයුතු සහ නව ප්‍රතිපත්ති යෝජනා කිරීම හෝ වෙනස් කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මෙන්ම විගණන හා කළමනාකරණ කමිටුව විසින් කෙරුණු අතර කොමිෂන් සභාවේ දුර්වලතා හා ඌනතා අවම මට්ටමක පවත්වා ගැනීමට අවශ්‍ය යෝජනා අදාල නිලධාරීන්ගේ අවධානයට යොමු කිරීමට අවශ්‍ය කටයුතු අදාල වර්ෂයේදී සිදු කරන ලදී.

විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

2022 වර්ෂයේ දී අවස්ථා කිහිපයකදීම කළමනාකරණ කමිටු සාමාජිකයින්ගේ ස්ථීර තනතුරේ ස්ථාන මාරුවීම් අනුව කමිටුවේ සාමාජිකත්වය අවසන්වීම හේතුවෙන් විගණන හා කළමනාකරණ කමිටුව අවස්ථා දෙකකදී දී පමණක් රැස්වූ අතර එම අවස්ථාවලදී විගණන හා කළමනාකරණ කමිටුව විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් කළමනාකරණ තීරණ කොමිෂන් සභාව වෙත නිර්දේශ කරන ලදී.

i. අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීම.

ii. මූල්‍ය වාර්තා සමාලෝචනය හා ඒ සම්බන්ධ කළමනාකරණ තීරණ

iii. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධ කළමනාකරණ තීරණ

iv. අභ්‍යන්තර විගණනයේ හා විමර්ශනයන්හි කාර්ය සාධනය

v. කොමිෂන් සභාවේ කාර්ය සාධනය සම්බන්ධයෙන් සමාලෝචන හා කළමනාකරණ තීරණය

vi. විගණකාධිපති වාර්තා සමාලෝචන

vii. අනෙකුත් මෙහෙයුම් හා පාලන කාර්යයන් සම්බන්ධ විවිධ කළමනාකරණ තීරණ

මේ අනුව විගණන හා කළමනාකරණ කමිටුව මනා ලෙස ඉහත තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කරන ලදී.

2022 වසරේ විගණන හා කළමනාකරණ කමිටුවේ සංයුතිය

මෙම කමිටු කාර්යයන් ඉටු කිරීමේ දී විගණන හා කළමනාකරණ කමිටුවේ සංයුතිය පහත පරිදී විය.

2022 ජනවාරි මස 01 දින සිට 2022 දෙසැම්බර් 31 දක්වා පත් වූ විගණන හා කළමනාකරණ කමිටු පහත නම් සඳහන් කොමිෂන් සභා සාමාජිකයන්ගෙන් යුක්ත විය.

i. 2022 අප්‍රේල් 27 විගණන හා කළමනාකරණ කමිටුව පහත නම් සඳහන් කොමිෂන් සභා සාමාජිකයන්ගෙන් සමන්විත විය.

- හර්ෂණී සමරසිංහ මිය - කමිටු සභාපති
- එම්.ජී.කේ. එම්.ප්‍රනාන්දු මයා - කමිටු සාමාජික
- කනිෂ්ක වීරසිංහ මයා - කමිටු සාමාජික
- තරංග නලීන් ගම්ලත් මයා - කමිටු සාමාජික
- ජේෂ්ඨ මහාචාර්ය ටී.එම්. බන්දුල පාලවත්ත මයා - කමිටු සාමාජික
- ඉංජිනේරු පී.ඒ.ඩී.ආර්. චන්ද්‍රසිරි මයා - කමිටු සාමාජික
- එල්.ඒ.ජී.එස්. ගුණසේකර මිය (විගණකාධිපති නියෝජිත) - නිරීක්ෂක
- එච්.ඩී. අනුරුද්ධිකා මිය (අමාත්‍යාංශ විගණක) - නිරීක්ෂක

ii. 2022 ඔක්තෝම්බර් 31 විගණන හා කළමනාකරණ කමිටුව පහත නම් සඳහන් කොමිෂන් සභා සාමාජිකයන්ගෙන් සමන්විත විය.

- හර්ෂණී ප්‍රනාන්දු මිය - කමිටු සභාපති
- එම්.ජී.කේ.එම්. ප්‍රනාන්දු මයා - කමිටු සාමාජික
- කනිෂ්ක වීරසිංහ මයා - කමිටු සාමාජික
- රුචික අමරසේකර මයා - කමිටු සාමාජික
- ජේෂ්ඨ මහාචාර්ය ටී.එම්. බන්දුල පාලවත්ත මයා - කමිටු සාමාජික
- ඉංජිනේරු පී.ඒ.ඩී.ආර්. චන්ද්‍රසිරි මයා - කමිටු සාමාජික
- එල්.ඒ.ජී.එස්. ගුණසේකර මිය (විගණකාධිපති නියෝජිත) - නිරීක්ෂක
- එච්.ඩී. අනුරුද්ධිකා මිය (අමාත්‍යාංශ විගණක) - නිරීක්ෂක

නීති කටයුතු

පනත සංශෝධනය කිරීමේ ප්‍රගතිය

1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත 1999 අංක 50 දරණ (සංශෝධන) පනත මඟින් සංශෝධන වී ඇත. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ආයතන ලියාපදිංචි කිරීම විධිමත් කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන පනතට අන්තර්ගත කිරීමේ වැදගත්කම හඳුනාගැනීමෙන් පසු අදාළ පනත තවදුරටත් ශක්තිමත් කිරීමට කටයුතු කරන ලදී.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මෙන්ම ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය ද 1990 අංක 20 දරණ පනත තුළින්ම පිහිටුවා ඇති හෙයින් එම දෙපාර්ශවයන්ගේම සහභාගිත්වයෙන් අදාල සාකච්ඡා පැවැත්වීමට කටයුතු කරන ලදී. ඒ අනුව අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් සාකච්ඡා වට කිහිපයක් පවත්වන ලද අතර තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සංශෝධිත කෙටුම්පත් සාකච්ඡා කරන ලදී. මේ හා සමගාමීව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියෙන් කෙටුම්පතක් ඉදිරිපත් වී නොමැති අතර එම කෙටුම්පතෙහි අවශ්‍යතාවය ද එහිදී සාකච්ඡා විය.

පනත සංශෝධන කටයුතු කඩිනමින් සිදුකිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇති හෙයින් කඩිනමින් සිදුකළ යුතු සංශෝධන හඳුනාගෙන ඒ සඳහා පවතින පනතට සංශෝධන පනතක් සකස් කිරීම සඳහා යෝජනා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. TVEC සහ NAITA ආයතනයන් මඟින් එකඟතාවයන්ගෙන් යුක්තව පූර්ණ පනතක සංශෝධනය සිදුකිරීමට ගතවන කාලය අවම කරගනිමින් කඩිනම් සංශෝධන සඳහා අමාත්‍යාංශය සමග කටයුතු කරනු ඇත.

අවසන් කළ නඩු කටයුතු

රාජ්‍ය මුද්‍රණ දෙපාර්තුමේන්තුවේ ඉල්ලීම පරිදි සකස් කරන ලද NVQ 5 මට්ටමේ විභාගයේ අත්‍යවශ්‍ය අංශයක් වන වාචික පරීක්ෂණය පැවැත්වීමට එම ආයතනය කටයුතු නොකිරීම සම්බන්ධයෙන් WRIT 363/2020 නැමැති නඩුව සමථයකට පත් කරමින් ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත්‍රලාභීන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව කටයුතු කරන ලදී.

ජාතික වෘත්තීය සුදුසුකම් චක්‍රලේඛ

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීම් ක්ෂේත්‍රය මනාලෙස සමායෝජනය කිරීම උදෙසා වරින් වර NVQ චක්‍රලේඛ නිකුත් කරයි. ඒ යටතේ පහත සඳහන් චක්‍රලේඛ 2022 පිළියෙල කර TVEC වෙබ් අඩවිය තුළ ඇතුළත් කර ඇත.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් 2022 වර්ෂය සඳහා පහත සඳහන් චක්‍රලේඛන නිකුත් කරන ලදී.

- ජාතික වෘත්තීය සුදුසුකම් චක්‍රලේඛ අංක 01/2022

  ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය මඟින් පිරිනමන ලබන උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමා (HNDM) පාඨමාලාව හා ගිණුම්කරණ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDA) පාඨමාලාව සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් 6 මට්ටමට සමානතාවය පිරිනැමීම

- ජාතික වෘත්තීය සුදුසුකම් චක්‍රලේඛ අංක 02/2022
  දිගු කාලීන වෘත්තීය පරිණතභාවය සහිත ශිල්පීන්/පුහුණුකරුවන්හට (පවතින ජාතික නිපුණතා සම්මත සඳහා) ජාතික වෘත්තීය සුදුසුකම් 5 වන මට්ටමට සමානතා සහතිකය පිරිනැමීමේ මාර්ගය ඉගැන්වීම් හා පුහුණු ක්ෂේත්‍රයන්ට අදාලව

- ජාතික වෘත්තීය සුදුසුකම් චක්‍රලේඛ අංක 03/2022

  ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය මඟින් පිරිනමනු ලබන උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමා (HNDM) පාඨමාලාව සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් 6 මට්ටමට සමානතාවය පිරිනැමීම

- ජාතික වෘත්තීය සුදුසුකම් චක්‍රලේඛ අංක 04/2022
  ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත්‍ර ගාස්තු සංශෝධනය (සංශෝධිත)

- ජාතික වෘත්තීය සුදුසුකම් චක්‍රලේඛ අංක 05/2022
  රැකියාගත පුහුණුව සංවිධානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ

- ජාතික වෘත්තීය සුදුසුකම් චක්‍රලේඛ අංක 06/2022
  සංශෝධිත ජාතික නිපුණතා සම්මතයන්හි මුල් පිටපත් භාවිතය අවසන් කිරීම

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශය

විස්තරය	සටහන	2022 (රු.)	2021 (රු.)	2020 (රු.)
ආදායම්				
භාණ්ඩාගාර ප්‍රදාන	01	157,629,961	135,709,694	128,178,117
ව්‍යාපෘති ප්‍රදාන	02	8,955,724	18,978,335	28,979,442
ඉපයූ මෙහෙයුම් ආදායම්	03	63,774,928	29,404,202	28,548,468
මූල්‍ය ප්‍රදාන ආපසු ලැබීම්				227,885
ඉපයූ මෙහෙයුම් නොවන ආදායම්	04	3,954,929	90,824	229,718
		234,315,542	184,183,055	186,163,631
සේවක ණය පොලී ආදායම්	05	504,879	407,299	416,336
ස්ථාවර වත්කම් විකුණුම් ලාභ		66,310		.
		234,886,731	184,590,355	186,579,966
කල් දැමූ ආදායම්		5,079,372	6,058,862	6,396,799
		239,966,103	190,649,217	192,976,766
වියදම්				
පාලක මණ්ඩල සහ කළමනාකරණ කමිටු දීමනා	06	991,491	757,086	607,654
පුද්ගලික පාරිශ්‍රමික	07	86,791,235	79,435,665	78,512,906
ගමන් වියදම්	08	1,099,599	665,648	334,499
සැපයුම් සහ පාරිභෝජන ද්‍රව්‍ය	09	15,209,606	11,041,272	9,356,879
නඩත්තු වියදම්	10	7,153,547	5,499,152	4,133,883
පුනරුත්ථාපන වියදම්	11	675,150	799,672	539,550
ගිවිසුම්ගත සේවා	12	14,485,679	12,000,401	11,856,272
මෙහෙයුම් වියදම්	13	80,881,617	65,020,789	44,194,035
		207,287,924	175,219,685	149,535,679
ව්‍යාපෘති වියදම්	14	8,955,724	18,978,335	29,061,642
		216,243,648	194,198,020	178,597,321
වෙන්කිරීම්වලට පසු ශුද්ධ අතිරික්තය /ඌනතාවය		23,722,454	-3,548,803	14,379,445
වර්ෂය සඳහා ප්‍රතිපාදන				
වෙන්කිරීම්වලට පසු ශුද්ධ අතිරික්තය /ඌනතාවය		23,722,454	-3,548,803	14,379,445

කොමිෂන් සභාව වෙනුවෙන් අත්සන් කරන ලදී.

ඒ.එස්.අමරසිංහ
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)

ආචාර්ය කේ.ඒ. ලලිතධීර
අධ්‍යක්ෂ ජනරාල්

2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	සටහන	2022 (රු.)	2021 (රු.)	2020 (රු.)
වත්කම්				
දේපළ, පිරියත හා උපකරණ	15	98,007,119	16,073,319	18,614,363
පරිගණක මෘදුකාංග		7,628,755	643,933	858,578
ජංගම වත්කම්				
ණයගැතියෝ	16	15,237,967	13,616,734	13,802,390
තැන්පත් සහ ලැබීම්	17	25,674,844	23,883,904	28,040,186
අවසන් තොගය	18	5,980,402	3,019,798	4,094,190
මුදල් හා මුදල් සමකය	19	82,059,561	68,404,152	62,487,207
		128,952,774	108,924,588	108,423,973
මුළු වත්කම්		234,588,648	125,473,605	127,896,914
හිමිකම් හා වගකීම්				
හිමිකම්				
සමුච්චිත අරමුදල	20	81,512,159	65,563,607	73,222,442
කල් දැමූ ආදායම්	21	105,635,874	16,717,252	19,472,941
		187,148,034	82,280,859	92,695,383
ජංගම නොවන වගකීම්				
පාරිතෝෂික ප්‍රතිපාදන (උප ලේඛන -01)	1	26,859,368	25,748,230	24,957,438
		214,007,402	108,029,089	117,652,821
ජංගම වගකීම්				
ණයහිමියෝ	22	6,981,453	6,981,453	2,785,445
ගෙවිය යුතු තැන්පතු හා අනෙකුත් ගෙවීම්	23	13,599,794	10,463,063	7,458,647
		20,581,246	17,444,516	10,244,093
මුළු වගකීම්		234,588,648	125,473,605	127,896,914

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

ඒ.එස්.අමරසිංහ
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)

ආචාර්ය කේ.ඒ. ලලිතධීර
අධ්‍යක්ෂ ජනරාල්

ඉංජිනේරු උදේනි වික්‍රමසිංහ
සභාපති

2022 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

	සමුච්චිත අරමුදල (රු.)
2019.12.31 දිනට ශේෂය	52,841,507
පෙර වර්ෂ ගැලපුම්	-1,783,946
වර්ෂයට අදාල අතිරික්තය/ඌනතාවය	22,164,882
2020.12.31 දිනට ශේෂය	73,222,443
පෙර වර්ෂ ගැලපුම්	-2,584,667
වර්ෂයට අදාල අතිරික්තය/ඌනතාවය	-3,548,803
ආරම්භක ශේෂ ගැලපුම	-1,156,404
ආරම්භක ක්ෂය ගැලපුම	-368,537
ආඝන්න අගයට වැටයීම්	-425
2021.12.31 දිනට ශේෂය	65,563,607
වර්ෂයට අදාල අතිරික්තය/ඌනතාවය	23,722,454
ආරම්භක ශේෂ ගැලපුම	-1,926,401
පෙර වර්ෂ ගැලපුම්	-5,847,501
2022.12.31 දිනට ශේෂය	81,512,159

2022 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	2022 (රු.)	2021 (රු.)	2020 (රු.)
ශුද්ධ මෙහෙයුම් ආදායම			
අතිරික්ත / ඌනතාවය	23,722,454	-3,548,803	22,164,882
මූල්‍ය නොවන ගැලපුම්			
පෙර වර්ෂ ගැලපීම්	-5,847,501	-2,584,667	-1,783,946
ක්ෂය කිරීම්	5,079,372	6,058,862	6,396,799
ආරම්භක ශේෂ වෙනස ගැලපීම් (ක්ෂය)	-1,926,401	-1,524,941	
ප්‍රත්‍යාගණනය හා ඉවත්කිරීම් සම්බන්ධ ගැලපුම්	-19,219		
ආසන්න අගයට වැටයීම්		-425	
පාරිතෝෂික වෙන් කිරීම්	2,903,988	2,617,565	4,654,654
කල්දැමූ ආදායම	-5,079,372	-2,755,689	-6,396,799
	-4,889,133	1,810,705	2,870,708
පොලී ආදායම්			
පාරිතෝෂික ගෙවීම්	1,827,795	1,826,772	279,750
කාරක ප්‍රාග්ධන වෙනස ගැලපීමට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම්	17,005,526	-3,564,870	24,755,840
ශුද්ධ මුදල් ප්‍රවාහය			
ණයගැතියෝ (අඩුවීම/වැඩිවීම)	-1,621,233	185,656	-400,485
තැන්පත් සහ ලැබීම් (අඩුවීම/වැඩිවීම)	-1,790,940	4,324,518	-1,626,834
ඉතිරි තොග (අඩුවීම/වැඩිවීම)	-2,960,604	1,074,392	-824,173
ණයහිමියෝ (අඩුවීම/වැඩිවීම)		4,196,007	-1,860,176
ආපසු ගෙවිය යුතු වියදම් සහ තැන්පතු (අඩුවීම/වැඩිවීම)	3,136,730	3,004,417	839,813
	-3,236,046	12,784,990	-3,871,855
පොලී ආදායම්			
මෙහෙයුම් ක්‍රියාකාරකම්වල වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	13,769,480	9,220,120	20,883,985
ආයෝජනවලින් වූ මුදල් ප්‍රවාහය			
දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම	-2,587,278	-2,515,306	-1,173,662.00
පරිත්‍යාගකල වත්කම් වල ශුද්ධ අගය			
ඉවත්කල වත්කම් වල ශුද්ධ අගය		-787,868	
වත්කම් විකුණුම් ආදායම	-66,310		
ආයෝජන වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	-2,653,588	-3,303,174	-1,173,662.00

	2022 (රු.)	2021 (රු.)	2020 (රු.)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහය			
සමුච්චිත අරමුදල			
වත්කම් මිළදී ගැනුම් සඳහා මහා භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන	2,587,278		1,173,662
මහා භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන නැවත යැවීම	-47,761		
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	2,539,517		
මුදල් හා මුදල් සමකයේ ශුද්ධ වැඩිවීම/අඩුවීම	13,655,409	5,916,946	20,883,987
වසර ආරම්භයේ මුදල් හා මුදල් සමකය	68,404,152	62,487,207	41,603,220
වසර අවසානයේ වූ මුදල් හා මුදල් සමකය	82,059,561	68,404,152	62,487,207
මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ සටහන් වසර අවසානයේ වූ මුදල් හා මුදල් සමකය			
මහජන බැංකුව - ගිණුම් අංකය - 078-1001-722-66044	75,167,592	59,508,486	58,141,549
මහජන බැංකුව - ගිණුම් අංකය - 078-1001-122-68324	6,230,034	7,332,941	3,062,256
මහජන බැංකුව - ගිණුම් අංකය - 078-1001-422-66050	661,935	1,562,725	1,283,402
	82,059,561	68,404,152	62,487,207

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශ සටහන

	උප සටහන	2022 (රු.)	2021 (රු.)	2020 (රු.)
01 භාණ්ඩාගාර ප්‍රදාන				
පුනරාවර්තන		152,725,000	131,500,000	131,000,000
ප්‍රාග්ධන ප්‍රදාන - පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම්		676,000	1,000,000	600,000
ප්‍රාග්ධන ප්‍රදාන - වත්කම් අත්පත් කරගැනීම්		2,587,278	1,075,000	1,200,000
ප්‍රාග්ධන ප්‍රදාන - හැකියා ප්‍රවර්ධන		4,276,722	4,650,000	3,450,000
		160,265,000	138,225,000	136,250,000
අඩුකලා- කල්දැමූ ආදායමට මාරුකිරීම්		2,587,278	2,515,306	1,173,662
මහාභාණ්ඩාගාරය වෙත නැවත ගෙවීම්		47,761		
		157,629,961	135,709,694	135,076,338
02 ව්‍යාපෘති ප්‍රදාන				
කෙටිකාලීන වැඩසටහන් (දේශීය/විදේශීය)	02.1	7,679,525	287,930	1,887,670
නිපුණතා ආංශික සංවර්ධන	02.2	1,276,199	18,690,405	27,091,772
		8,955,724	18,978,335	28,979,442
03 මෙහෙයුම් ආදායම්				
ආයතන ලියාපදිංචි ගාස්තු	03.1	3,584,600	2,685,300	2,517,800
ප්‍රතීතන ගාස්තු	03.2	2,138,700	1,534,500	1,522,900
ජාතික වෘත්තීය සුදුසුකම් සහතික මුද්‍රණය (ශුද්ධ)	03.3	54,089,593	23,781,989	23,020,681
ඇගයුම්කරුවන් ලියාපදිංචි ගාස්තු	03.4	167,825	195,075	86,250
ප්‍රකාශන අලෙවිය	03.5	30,000	5,625	419,650
ශිෂ්‍ය වාර්ථා පොත් විකුණුම් ශුද්ධ ආදායම	03.6	3,764,210	1,201,713	981,187
		63,774,928	29,404,202	28,548,468
04 මෙහෙයුම් නොවන ආදායම්				
අබලි ද්‍රව්‍ය විකිණීම		34,672	728	2,642
පුද්ගලික භාවිතය සඳහා වාහන පැවරීමේ ආදායම		21,617	17,000	25,500
අතිරික්ත දුරකථන බිල්පත් අයකර ගැනීම			72,806	201,576
වෙනත් සාමාන්‍ය ආදායම්		3,898,640	290	
		3,954,929	90,824	229,718
05 මෙහෙයුම් නොවන ආදායම්				
අබලි ද්‍රව්‍ය විකිණීම		61,683	52,572	67,424
පුද්ගලික භාවිතය සඳහා වාහන පැවරීමේ ආදායම		437,977	333,781	345,730
අතිරික්ත දුරකථන බිල්පත් අයකර ගැනීම		5,219	20,947	3,182
වෙනත් සාමාන්‍ය ආදායම්		504,879	407,299	416,336

	උප සටහන	2022 (රු.)	2021 (රු.)	2020 (රු.)
06 පාලක මණ්ඩල සහ කළමනාකරණ කමිටු දීමනා				
පාලක මණ්ඩල දීමනා		880,071	662,116	578,154
කළමනාකරණ කමිටු දීමනා		111,420	94,970	29,500
		991,491	757,086	607,654
07 පෞද්ගලික පඩිනඩි				
වැටුප් හා වේතන			63,400,943	60,751,973
සේවක අර්ථ සාධක අරමුදල			7,022,506	6,900,194
සේවක භාරකාර අරමුදල			1,755,627	1,724,647
අතිකාල හා නිවාඩු දින දීමනා			3,115,205	3,059,208
පුහුණු දීමනා			622,795	522,230
සභාපති දීමනා			901,025	900,000
පාරිතෝෂිකය			2,617,565	4,654,654
		86,791,235	79,435,665	78,512,906
08 ගමන් වියදම්				
දේශීය		1,020,026	665,648	334,499
විදේශීය		79,573		
		1,099,599	665,648	334,499
09 සැපයුම් හා පරිභෝජන				
මුද්‍රණ ලිපි ද්‍රව්‍ය	09.1	3,673,752	3,627,449	2,234,628
ඉන්ධන	09.2	6,622,864	2,675,313	2,759,424
ප්‍රවාහන වියදම්		2,138,155	2,396,695	2,369,837
නිළ ඇඳුම්		120,000	152,000	152,000
පුවත්පත්		181,770	136,737	95,035
අනිකුත් සේවා ගාස්තු		1,291,202	805,027	736,185
සංග්‍රහ වියදම්		685,247	463,192	368,370
සුභ සාධන වියදම්		496,615	784,860	641,400
		15,209,606	11,041,272	9,356,879
10 නඩත්තු වියදම්				
වාහන නඩත්තු හා රක්ෂණ වියදම්	10.3	5,308,174	3,600,755	2,547,537
යන්ත්‍ර සූත්‍ර නඩත්තු වියදම්		187,799	6,750	188,740
ගොඩනැගිලි නඩත්තු වියදම්		835,998	1,279,549	549,276
පරිගණක සේවා		676,841	365,110	620,470
යාන්ත්‍රික හා විදුලි උපකරණ		134,785	176,773	219,618
නඩත්තු වියදම්		9,950	70,216	8,241
		7,153,547	5,499,152	4,133,883

	උප සටහන	2022 (රු.)	2021 (රු.)	2020 (රු.)
11 පුනරුත්ථාපන වියදම්				
වාහන පුනරුත්ථාපන වියදම්		675,150	799,672	539,550
යන්ත්‍ර පුනරුත්ථාපන වියදම්				
ගොඩනැගිලි පුනරුත්ථාපන වියදම්				
		675,150	799,672	539,550
12 ගිවිසුම්ගත සේවා				
දුරකථන ගාස්තු		4,617,361	2,834,435	3,503,584
තැපැල් වියදම්		151,434	66,410	154,345
විදුලි වියදම්		2,659,522	2,108,717	2,514,973
ජල ගාස්තු		73,810	64,799	79,326
වරිපනම්		214,200	214,200	214,200
ආරක්ෂක සේවා		1,914,658	1,459,437	1,592,718
සනීපාරක්ෂක ගාස්තු		1,839,876	1,722,732	1,523,190
විගණන ගාස්තු		750,000	750,000	
නීති ගාස්තු		62,500	25,380	130,000
සාමාජික ගාස්තු - දේශීය		30,410	51,410	47,621
සාමාජික ගාස්තු - විදේශීය				18,276
කාර්යය මණ්ඩල පුහුණුව හා සංවර්ධනය		1,236,000	1,775,580	1,142,400
රක්ෂණ (මාර්ගස්ථ මුදල්)		17,288	13,682	13,682
සේවා ගිවිසුම්		918,058	913,260	919,795
බැංකු වියදම්		562	358	2,162
		14,485,679	12,000,401	11,856,272
13 මෙහෙයුම් වියදම්				
ආයතන ලියාපදිංචි වියදම්	13.1	3,558,171	2,076,314	1,480,371
ප්‍රතීතන වියදම්	13.2	2,985,390	1,068,230	1,050,670
ජාතික වෘත්තීය සුදුසුකම් වැඩසටහන් වියදම්	13.3	58,351,177	46,048,654	28,500,421
වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලසුම් ක්‍රියාත්මක කිරීම	13.4	1,500,000	508,350	547,500
ශ්‍රම වෙළෙඳපොළ ප්‍රකාශය වියදම්	13.5	659,415	731,249	970,523
කර්මාන්ත සබඳතා ක්‍රියාකාරකම්	13.6	5,196,293	4,974,457	2,338,464
තත්ත්ව කළමනාකරණ පද්ධති වියදම්			8,200	89,555
නිපුණතා සම්මත පිළියෙල කිරීම		1,846,916	3,101,068	1,411,442
පර්යේෂණ වියදම්		882,895	139,760	440,305
මුදල් ප්‍රදාන පසු විපරම් කිරීම		13,930		
පරිවර්තන ගාස්තු		333,059	305,646	80,767
වාර්ෂික ක්ෂය		5,079,372	6,058,862	6,396,799
වෘත්තීය අධ්‍යාපන ප්‍රතිපත්ති වාර්තාව		475,000		
		80,881,617	65,020,789	43,306,818

	උප සටහන	2022 (රු.)	2021 (රු.)	2020 (රු.)
14 ව්‍යාපෘති වියදම්				
කෙටිකාලීන වැඩසටහන් වියදම්	14.1	7,679,525	287,930	1,968,870
නිපුණතා ආංශික සංවර්ධන	14.2	1,276,199	18,690,405	27,092,772
		8,955,724	18,978,335	29,061,642
15 දේපල පිරියත හා උපකරණ				
පිරිවැය	සටහන	2022.12.30 ප්‍රත්‍යාගණනය කරන ලද	මිළඳී ගැනුම්	31.12.2022
වාහන	15.1	71,600,000		71,600,000
ලීබඩු සහ සවිකිරීම්	15.2	6,088,845		6,088,845
පිරියත හා උපකරණ	15.3	7,416,450		7,416,450
කාර්යාල උපකරණ	15.4	5,353,195	206,798	5,559,993
පරිගණක හා උපාංග	15.5	4,031,500	3,730,993	7,762,493
පුස්තකාල පොත්	15.6	1,026,548	32,286	1,058,833
නාම පුවරු	15.7	500,100		500,100
		96,016,638	3,970,077	99,986,714
ක්ෂයවීම්	%	30.12.2022	ප්‍රත්‍යාගණනයෙන් පසු	31.12.2022
වාහන	25%	1,718,813	56,838	1,775,651
ලීබඩු සහ සවිකිරීම්	10%		1,668	1,668
පිරියත හා උපකරණ	25%		5,080	5,080
කාර්යාල උපකරණ	25%		15,251	15,251
පරිගණක හා උපාංග	33%		180,325	180,325
පුස්තකාල පොත්	25%		1,278	1,278
නාම පුවරු	25%		343	343
		1,718,813	260,782	1,979,595
		31,187		98,007,119
15.1 පරිගණක මෘදුකාංග				
		ප්‍රත්‍යාගණිත	වර්ෂයට අදාල ක්ෂය	ලියාහල අගය
		7,633,984	5,229	7,628,755

	උප සටහන	2022 (රු.)	2021 (රු.)	2020 (රු.)
16 ණය ගැතියෝ				
මෙහෙයුම් ණය ගැතියෝ	16.1	304,695	304,695	304,695
සේවක ණය	16.2	14,933,272	13,312,039	13,497,695
		15,237,967	13,616,734	13,802,390
17 තැන්පත් සහ ලැබීම්				
කාර්ය මණ්ඩල අත්තිකාරම්	17.1	8,843,268	13,240,415	12,613,079
බාහිර ආයතන වලින් ලැබිය යුතු හිමිකම්	17.2	6,365,457	5,650,016	10,204,696
කාර්ය මණ්ඩලයෙන් අයවිය යුතු අගයන්		369,090	397,881	279,855
කලින් ගෙවීම්	17.3	49,039	36,856	36,856
පුද්ගලික ඩයලොග් බිල් දුරකථන		29,152	38,123	77,526
අයකරගතහැකි ජාතික වෘත්තීය සුදුසුකම් සහතික මුද්‍රණ වියදම්	17.4	10,018,838	4,520,613	3,923,173
ස්ථාවර වත්කම් ඇණවුම්				905,000
		25,674,844	23,883,904	28,040,186
18 අවසන් තොගය				
ඉතිරි තොගය - ශිෂ්‍ය වාර්ථා පොත්		3,716,796	2,103,479	578,112
ඉතිරි තොගය - ලිපි ද්‍රව්‍ය		2,263,606	916,319	891,469
ඉතිරි තොගය - සහතිකපත්				2,624,610
		5,980,402	3,019,798	4,094,190
19 මුදල් හා මුදල් සමකය				
මහජන බැංකුව - ගිණුම් අංකය -078-1001-72266044		75,167,592	59,508,486	58,141,549
මහජන බැංකුව - ගිණුම් අංකය -078-1001-12268324		6,230,034	7,332,941	3,062,256
මහජන බැංකුව - ගිණුම් අංකය - 078- 1001-42266050		661,935	1,562,725	1,283,402
		82,059,561	68,404,152	62,487,207
20 සමුච්චිත අරමුදල්				
ආරම්භක ශේෂය		65,563,607	69,794,665	49,413,730
සමුච්චිත අරමුදල් ආරම්භක ශේෂය			3,427,777	
ආරම්භක ශේෂ ගැලපුම් (ක්ෂය)		-1,926,401	-1,156,404	
ප්‍රතිපාදන ගැලපීම - (අඩුවීම/වැඩිවීම)			-368,537	
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය		23,722,454	-3,548,803	22,164,882
ආරම්භක ශේෂය වැටයීම			-424	-1
පෙර වර්ෂ ගැලපුම්		-5,847,501	-2,584,667	-1,783,946
		81,512,159	65,563,607	69,794,665

	උප සටහන	2022 (රු.)	2021 (රු.)	2020 (රු.)
21 කල් දැමූ ආදායම				
කල් දැමූ ආදායම -ආරම්භක ශේෂය		16,717,252	19,472,941	27,087,974
ආරම්භක ශේෂ ගැලපුම්		1,926,401	1,156,404	
නැවත තක්සේරු කළ වත්කම්වල වටිනාකම		101,900,623		
සමුච්චිත ක්ෂයවීම් ගැලපුම		-2	-368,537	
		120,544,274	20,260,808	27,087,974
එකතු කරන්න: -දේපල, පිරියත සහ උපකරණ		2,587,278	2,515,306	1,173,662
ව්‍යාපෘතිය මඟින් ලබාදෙන ලද වත්කම්		1,382,798		
		124,514,350	22,776,114	28,261,636
අඩුකළා: ඉවත්කරනු ලැබූ ස්ථාවර වත්කම්වල ශුද්ධ වටිනාකම		514,610		2,391,896
නැවත තක්සේරු කළ ශුද්ධ වත්කම්වල වටිනාකම		13,284,494		
		110,715,246	22,776,114	25,869,740
අඩුකළා: වර්ෂය තුළ විස්තීරණ ගිණුමට ලියාහැරීම්		5,079,372	6,058,862	6,396,799
විලම්භිත ගිණුම් ශේෂය		105,635,874	16,717,252	19,472,941
22 ණයහිමියෝ				
මෙහෙයුම් ණය හිමියෝ	22.1	6,981,453	6,981,453	2,785,445
		6,981,453	6,981,453	2,785,445
23 ආපසු ගෙවිය යුතු නැන්පතු සහ ගෙවීම්				
මහාභාණ්ඩාගාරය වෙත නැවත ගෙවීම්	23.1	536,504	440,019	162,351
ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවීම්	23.2	119,870	117,595	103,434
ගෙවිය යුතු ව්‍යාපෘති ප්‍රදාන	23.3	2,896,437	2,896,437	2,184,367
ගෙවිය යුතු පෞද්ගලික පඩිනඩි	23.4	579,842	1,916,919	712,200
ටෙන්ඩර් තැන්පතු		621,611	621,611	621,611
ගෙවිය යුතු විගණන ගාස්තු		750,000	750,000	500,655
රදවාගත් තැන්පතු		595,777	595,777	595,777
තත්ත්ව කළමනාකරණ පද්ධති තැන්පතු		15,000	15,000	15,000
ගිණුම මාරුකිරීම		49,536	49,536	49,536
ගැලපීම් සඳහා මාරු කිරීම		206,100	1,600	1,600
උපචිත වියදම්		5,444,854	1,324,421	934,828
චෙක්පත් අවලංගු කිරීම්		318,981	290,676	159,345
තොරතුරු හා සන්නිවේදන ආංශික නිපුණතා සහාව		118,115	118,115	118,116
සංචාරක කර්මාන්ත නිපුණතා ආංශික නිපුණතා සහාව		168,236	168,236	108,375
කාර්ය මණ්ඩල නිළධාරීන් සඳහා ගෙවීම්		1,178,931	1,157,122	1,191,452
		13,599,794	10,463,063	7,458,647

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශ උප සටහන්

02.1	කෙටිකාලීන වැඩසටහන් (දේශීය සහ විදේශීය)			
	කෙටිකාලීන වැඩසටහන් (දේශීය)		287,930	1,392,500
	Touch Your Future වැඩසටහන			495,170
	ILO	7,679,525		
		7,679,525	287,930	1,887,670
02.1	නිපුණතා ආංශික සංවර්ධන අංශය			
	නිපුණතා ආංශික සංවර්ධන ප්‍රධාන	1,276,199	18,690,405	27,091,772
		1,276,199	18,690,405	27,091,772
03.1	ආයතන ලියාපදිංචි ගාස්තු			
	ආයතන ලියාපදිංචි ගාස්තු	3,578,200	2,685,300	2,517,800
	ආයතන ලියාපදිංචි ප්‍රමාද ගාස්තු	6,400		
		3,584,600	2,685,300	2,517,800
03.2	පාඨමාලා ප්‍රතීතන ගාස්තු			
	ප්‍රතීතන ගාස්තු	2,138,700	1,534,500	1,522,900
		2,138,700	1,534,500	1,522,900
03.3	ජාතික වෘත්තීය සුදුසුකම් සහතික මුද්‍රණ සහ අනෙකුත් ආදායම			
	ජාතික වෘත්තීය සුදුසුකම් සහතික මුද්‍රණ ආදායම - නව	13,532,075	1,485,840	2,740,630
	ජාතික වෘත්තීය සුදුසුකම් සහතික නැවත මුද්‍රණ ආදායම	212,400	20,850	28,050
	ජාතික වෘත්තීය සුදුසුකම් සහතික පිටපත් මුද්‍රණ ආදායම	162,950	34,025	25,650
	ජාතික වෘත්තීය සුදුසුකම් සැසඳුම් ආදායම	397,600	321,000	1,281,500
	තත්ත්ව කළමනාකරණ පද්ධති ඇගයුම් ගාස්තු		275,000	46,600
	තත්ත්ව කළමනාකරණ සහතික ගාස්තු	100,000	375,000	695,000
	සහතික කිරීමේ ගාස්තුව - (NVQ නොවන)	2,166,000	750,000	415,000
	ජාතික වෘත්තීය සුදුසුකම් විභාග ගාස්තු	35,942,068	20,424,774	17,772,251
	ජාතික වෘත්තීය සුදුසුකම් සහතික පරීක්ෂණ ගාස්තු	12,000		
	නිපුණතා බලපත්‍රය	247,000	1,000	16,000
	නිපුණතා කවුන්සල සම්මුඛ පරීක්ෂණ	37,500	94,500	
	ඇගයුම් කබා විකුණුම් ආදායම්	1,280,000		
		54,089,593	23,781,989	23,020,681

		2022 (රු.)	2021 (රු.)	2020 (රු.)
03.4	ඇගයුම් නිළධාරීන් ලියාපදිංචි ගාස්තු			
	ජාතික වෘත්තීය සුදුසුකම් ඇගයුම් නිළධාරීන් ලියාපදිංචි ගාස්තු	167,825	195,075	85,250
	ජාතික වෘත්තීය සුදුසුකම් ඇගයුම් බලපත්‍ර ගාස්තු			1,000
		167,825	195,075	86,250
03.5	ප්‍රකාශන විකිණීම			
	ජාතික නිපුණතා සම්මත විකිණීම			
	විෂය මාලා විකිණීම	30,000		418,050
	වෘත්තීය පුහුණු සැලසුම් විකිණීම			1,600
	ශ්‍රම වෙළෙඳපොළ ප්‍රකාශන විකිණීම			
	අනෙකුත් ප්‍රකාශන අලෙවිය		5,625	
		30,000	5,625	419,650
03.6	ශිෂ්‍ය වාර්තා පොත් ආදායම - ශුද්ධ			
	ශිෂ්‍ය වාර්තා පොත් විකුණුම් ආදායම	6,977,475	2,906,950	3,059,575
	ශිෂ්‍ය වාර්තා පොත් ආරම්භක තොගය	2,103,479	578,112	262,500
	පුහුණු ශිෂ්‍ය වාර්තා පොත් මුද්‍රණ වියදම	4,474,183	3,080,633	2,394,000
	ශිෂ්‍ය වාර්තා පොත් විකුණුම් වියදම	352,399	149,971	
		6,930,061	3,808,716	2,656,500
	අඩු කලා - අවසන් තොගය පුහුණු ශිෂ්‍ය වාර්තා පොත්	3,716,796	2,103,479	578,112
	අඩු කලා - ශිෂ්‍ය වාර්තා පොත් මුද්‍රණ වියදම	3,213,265	1,705,237	2,078,388
		3,764,210	1,201,713	981,187
09.1	මුද්‍රණ ලිපි ද්‍රව්‍ය			
	ලිපි ද්‍රව්‍ය	2,720,113	2,177,115	1,297,618
	මුද්‍රණ වියදම්	487,367	898,238	160,850
	පුවත්පත් දැන්වීම්	466,272	552,096	776,160
		3,673,752	3,627,449	2,234,628
09.2	ඉන්ධන වියදම්			
	අනුයුක්ත වාහන සඳහා ඉන්ධන - ලිහිසි තෙල්	3,191,767	1,178,996	1,820,464
	සංචිත වාහන සඳහා ඉන්ධන - ලිහිසි තෙල්	3,431,097	1,496,317	938,960
		6,622,864	2,675,313	2,759,424
10.3	වාහන නඩත්තු හා රක්ෂණ වියදම්			
	වාහන නඩත්තු වියදම KE - 0488	93,480	164,254	113,362
	වාහන නඩත්ත වියදම KB - 9869	451,218	95,366	104,533
	වාහන නඩත්ත වියදම KF-6350	333,955	159,980	253,493
	වාහන නඩත්තු වියදම 18-1901	78,175	35,714	5,832
	වාහන නඩත්තු වියදම PB 4729	285,874	280,882	205,539
	වාහන නඩත්තු වියදම 57-7603	178,487	183,877	127,413
	වාහන නඩත්තු වියදම PD- 2405	733,088	412,038	262,104

		2022 (රු.)	2021 (රු.)	2020 (රු.)
	වාහන නඩත්තු වියදම KR- 7697	418,368	75,357	66,600
	වාහන නඩත්තු වියදම KS- 2350	332,663	217,346	205,623
	වාහන නඩත්තු වියදම KS- 2645	292,674	181,487	123,505
	වාහන නඩත්තු වියදම NB- 2942	564,135	614,074	212,329
	වාහන නඩත්තු වියදම PE-0572	279,432	359,106	196,670
	වාහන නඩත්තු වියදම NC-0021	570,167	426,956	340,858
	වාහන නඩත්තු වියදම PF -6302	696,459	394,317	329,676
		5,308,174	3,600,755	2,547,537
13.1	ආයතන ලියාපදිංචි වියදම්			
	ආයතන ලියාපදිංචි සහ ඇගයුම් වියදම	3,546,171	2,076,314	1,480,371
	ඉන්ධන වියදම්	12,000		
	ආයතන ලියාපදිංචි සහ ඇගයුම් වැඩසටහන් වියදම්			
		3,558,171	2,076,314	1,480,371
13.2	ප්‍රතිනන වියදම්			
	පාඨමාලා ඇගයීම් ගාස්තු	2,981,690	994,730	994,720
	ඉන්ධන වියදම්	3,700	73,500	47,450
	ප්‍රතිනන වැඩසටහන් වියදම්			8,500
		2,985,390	1,068,230	1,050,670
13.3	ජාතික වෘත්තීය සුදුසුකම් වැඩසටහන් වියදම්			
	ජාතික වෘත්තීය සුදුසුකම් ගැලපීම	2,146,149		
	ඇගයුම්කරුවන් ලියාපදිංචිය	706,310	1,034,640	546,810
	ISO සහතික කිරීම හා ක්‍රියාත්මක කිරීම		173,120	86,400
	ජාතික වෘත්තීය සුදුසුකම් ඇගයුම් ගාස්තු	15,733,198	10,697,810	12,327,319
	විභාග ගාස්තු	32,397,005	26,164,930	13,889,344
	ජාතික වෘත්තීය සුදුසුකම් සහතික මුද්‍රණ වියදම්	6,537,091	6,724,710	1,205,688
	විභාග අධීක්ෂණ	541,730	289,945	322,400
	ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රියාත්මක කිරීම	33,530	40,900	29,565
	ඇගයුම්කරුවන්ගේ දැනුම් වර්ධන වැඩසටහන්	256,165	922,599	92,895
		58,351,177	46,048,654	28,500,421
13.4	වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලසුම් පිළියෙල කිරීම			
	වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලසුම් (නව)		432,600	
	වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලසුම් (යාවත්කාලීන)		75,750	547,500
	පළාත් වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලසුම	1,500,000		
		1,500,000	508,350	547,500

		2022 (රු.)	2021 (රු.)	2020 (රු.)
13.5	ශ්‍රම වෙළෙඳපොළ ප්‍රකාශය හා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලසුම් වියදම්			
	ශ්‍රම වෙළෙඳපොළ ප්‍රකාශය /ප්‍රවෘත්ති ලිපි වියදම්			8,170
	ශ්‍රම වෙළෙඳපළ දත්ත කේතකිරීම	659,415	731,249	936,573
	වෘත්ත්‍ය පුහුණු මාර්ගෝපදේශන මුද්‍රණ			
	ශ්‍රම වෙළෙඳපොළ ප්‍රකාශය/ප්‍රවෘත්ති ලිපි තැපල් වියදම්			25,780
	යුනිවොක් වියදම්			
		659,415	731,249	970,523
13.6	කර්මාන්ත සබඳතා ක්‍රියාකාරකම්			
	සංවර්ධනය හා අධීක්ෂණය	778,750	578,220	115,225
	වෘත්තීය මාර්ගෝපදේශ ශක්තිමත් කිරීම	1,498,550	2,389,023	510,821
	වෘත්තීය මාර්ගෝපදේශ නියාමනය කිරීම	394,174	466,820	516,850
	ජා.වෘ.සු.මෙහෙයුම් කමිටු රැස්වීම් සම්බන්ධීකරණය	642,440	25,615	95,365
	ප්‍රවර්ධන වැඩසටහන්	1,474,629	1,196,454	884,804
	රැකියා ස්ථානගත කිරීම	310,515	318,325	215,400
	කාර්මික නිපුණතා කවුන්සිලය	97,236		
		5,196,293	4,974,457	2,338,464
14.1	කෙටිකාලීන වැඩසටහන් (දේශීය / විදේශීය)			
	Touch Your Future Programme			576,370
	UNFPA වැඩසටහන			89,500
	SL CERT		287,930	103,000
	EDB			1,200,000
	ILO (14.1 a)	7,679,525		
		7,679,525	287,930	1,968,870
	ILO (14.1 a)			
	විෂයමාලා සංවර්ධනය කිරීම	508,505		
	ILO ප්‍රචාරණ වැඩසටහන්	6,412,341		
	සේවක දීමනා	663,480		
	නිපුණතා බලපත්‍ර වියදම්	95,200		
		7,679,525		
14.2	නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන			
	ප්‍රතීතන ප්‍රතිපත්ති			725,900
	ජාතික නිපුණතා සම්මත පිළියෙල කිරීම		2,256,771	5,627,003
	තත්ත්ව කළමනාකරණ පද්ධති		39,000	407,988
	ශ්‍රම වෙළඳපළ තොරතුරු පද්ධති හා පුහුණු වාර්ථා			12,462
	දීමනා		2,215,673	2,717,007
	පුහුණු ආයතන ලියාපදිංචිය			243,000
	ඇගයුම් ගාස්තු		620,000	1,409,870

		2022 (රු.)	2021 (රු.)	2020 (රු.)
	පර්යේෂණ වියදම්		830,600	928,900
	නිපුණතා සභා	1,276,199	10,981,978	11,999,606
	නිපුණතා පරතරය විශ්ලේෂණය		280,000	
	පුහුණු දීමනා		670,560	1,818,675
	තත්ත්ව සම්මාන		795,823	1,202,362
		1,276,199	18,690,405	27,092,772
16.1	මෙහෙයුම් ණය ගැනියෝ			
	සකුරා පරිගණක ආයතනය	167,895	167,895	167,895
	අනිකුත් ණය ගැනියන්	136,800	136,800	136,800
		304,695	304,695	304,695
16.2	කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම්			
	කොමිෂන් සභා ණය	1,980,594	1,653,318	1,812,142
	ආපදා ණය	12,865,393	11,575,936	11,518,455
	සුනාමි විශේෂ ණය	39,000	39,000	39,000
	උත්සව අත්තිකාරම්	7,300	4,800	62,300
	විශේෂ අත්තිකාරම්	6,213	4,213	4,213
	ලැබිය යුතු විශේෂ අත්තිකාරම් පොළිය			3,359
	සුනාමි විශේෂ ණය (II)	34,771	34,771	58,225
		14,933,272	13,312,039	13,497,695
17.1	අත්තිකාරම් - සේවක හා අනෙකුත්			
	සේවක අත්තිකාරම්	3,521,058	5,431,371	5,384,000
	ව්‍යාපෘති අත්තිකාරම්- නිෂ්පාදන හා ඉංජිනේරු	2,901,504	4,829,941	4,376,466
	ව්‍යාපෘති අත්තිකාරම්- ඉදිකිරීම් ආංශික සභා	2,410,706	2,810,866	2,852,614
	නිපුණතා සම්මත සංවර්ධන අත්තිකාරම්	10,000		
	ව්‍යාපෘති අත්තිකාරම්- සංචාරක ආංශික සභා		168,236	
		8,843,268	13,240,415	12,613,079
17.2	බාහිර පාර්ශවයන්ගෙන් ලැබිය යුතු			
	නිපුණතා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය			89,500
	නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය	5,979,724	5,650,016	10,115,196
	ILO	385,733		
		6,365,457	5,650,016	10,204,696
17.3	කලින් ගෙවීම්			
	මාර්ගස්ථ මුදල් රක්ෂණය	23,739	11,556	11,556
	සේවා ගිවිසුම්	25,300	25,300	25,300
		49,039	36,856	36,856
17.4	ලැබිය යුතු ජාතික වෘත්තීය සුදුසුකම් සහතික මුද්‍රණ වියදම්			

		2022 (රු.)	2021 (රු.)	2020 (රු.)
	ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ ආයතනය	1,153,690	986,990	851,700
	වෘත්තීය පුහුණු අධිකාරිය	3,118,191	1,813,666	1,666,126
	ජාතික යොවුන් සේනාංකය	5,325	5,325	5,325
	කාර්මික අධ්‍යාපන පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව	5,076,808	1,049,808	964,108
	ජාතික තරුණ සේවා සභාව	228,910	228,910	
	ජර්මානු කාර්මික අධ්‍යාපන ආයතනය	74,750	74,750	74,750
	මිනින්දෝරු දෙපාර්තමේන්තුව	69,900	69,900	69,900
	රාජ්‍ය නොවන සංවිධාන /පුද්ගලික හා රාජ්‍ය ආයතන	291,264	291,264	291,264
		10,018,838	4,520,613	3,923,173
22.1	ණය හිමියෝ			
	මෙහෙයුම් ණය හිමියෝ	1,880,445	1,880,445	1,880,445
	ණය හිමියෝ (ජාතික වෘත්තීය සුදුසුකම් ඇගයුම්කරු)			
	අනිකුත්	5,101,007	5,101,007	905,000
		6,981,453	6,981,453	2,785,445
23.1	මහාභාණ්ඩාගාරය වෙත ගෙවීම්			
	රාජ්‍ය භාග ගෙවීම්	536,504	440,019	162,351
	ආපසු යැවිය යුතු අගයන්	47,761		
		536,504	440,019	162,351
23.2	ආදායම් බදු දෙපර්තමේන්තුවට ගෙවීම්			
	රඳවා ගැනීම් බදු	59,536	59,536	59,511
	මුද්දර බදු	60,334	58,059	43,923
		119,870	117,595	103,434
23.3	ගෙවිය යුතු ව්‍යාපෘති ප්‍රදාන			
	කෙටිකාලීන ගෙවිය යුතු ප්‍රදාන	2,892,945	2,892,945	2,180,875
	කාර්මික අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය	3,492	3,492	3,492
		2,896,437	2,896,437	2,184,367
23.4	ගෙවිය යුතු පෞද්ගලික පඩි නඩි			
	අතිකාල සහ නිවාඩු දින දීමනා			
	සේවක භාරකාර අරමුදල		360,132	
	වැටුප්	347,398	287,913	10,239
	සේවක අර්ථසාධක අරමුදල	232,443	1,268,874	701,961
		579,842	1,916,919	712,200

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශ උප ලේඛන

නම	සේවක අංකය	පත්වීමේ දිනය	වසර ගණන	වැටුප	පාරිතෝෂික ප්‍රතිපාදන
උප ලේඛන 01 - පාරිතෝෂික වෙන්කිරීම්					
ඩබ්.පී.එස්.ඒ.කීර්ති	5	2001.02.01	21	60,975.00	640,238
එන්.ඩබ්.ජී.එන්.ජීවන්ත	6	2001.02.01	21	52,665.00	552,983
කේ.සිරිසේන	9	2001.02.05	21	42,430.00	445,515
ආර්.එන්.පී.ද.සිල්වා	10	2001.03.01	21	51,910.00	545,055
ඩී.බී.ආර්.මංජුලා	11	2001.03.01	21	54,175.00	568,838
වයි.පී.එස්.උදයකාන්ති	12	2001.02.01	21	54,175.00	568,838
එම්.එන්.අසංක රංගන	15	2001.09.03	21	39,850.00	418,425
ජී.කේ.හෑගොඩආරච්චි	20	2001.11.01	21	49,070.00	515,235
එච්.බී.ඉන්දික සම්පත්	24	2001.11.16	21	54,930.00	576,765
බී.කේ.එස්.දිනේෂ්	26	2001.11.16	21	41,440.00	435,120
ජී.ජී.අජිත් කුසුම්	28	2001.12.03	21	94,905.00	996,503
ඩබ්.එම්.ටී.අනුර වීරකෝන්	31	2002.07.01	20	95,735.00	957,350
එස්.විජේසේකර	40	2005.04.20	17	40,450.00	343,825
ඩබ්.වී.පී.සී.ජගත් කුමාර	41	2005.05.16	17	37,330.00	317,305
ටී.සෙන්තුරන්	46	2005.01.04	17	84,275.00	716,338
පී.එම්.සී.පී.ගුණතිලක	47	2005.01.18	17	73,350.00	623,475
ඩබ්.කේ.ඩී.හරිස්චන්ද්‍ර	48	2005.01.03	17	84,275.00	716,338
පී.ඒ.එම්.යූ.ගනේපොළ	49	2005.01.02	17	97,175.00	825,988
යූ.ඒ.පී.ධර්මසේන	51	2005.01.03	17	71,975.00	611,788
එම්.ඩී.චාමලී ද සිල්වා	56	2005.10.06	17	47,160.00	400,860
ආර්.ජේ.සමරවීර	57	2005.11.21	17	88,090.00	748,765
පී.බන්දුල	58	2006.02.20	16	40,120.00	320,960
ඒ.එස්.අමරසිංහ	60	2006.05.16	16	101,465.00	811,720
එස්.යූ.කේ.රුබසිංහ	65	2007.02.02	15	106,255.00	796,913
එම්.විදානපතිරණ	66	2007.02.02	15	86,185.00	646,388
ජේ.ඒ.ඩී.ජේ.ජයලත්	68	2007.08.01	15	126,445.00	948,338
ජී.ජී.ජී.නානායක්කාර	70	2007.10.15	15	84,275.00	632,063
ඩබ්.ජේ.එල්.ඒ.දමයන්ති	72	2007.12.12	15	84,275.00	632,063
සද්ධා මංගල	73	2008.02.01	14	39,490.00	276,430
ආර්.ජී.ඒ.ටී.කුමාර	74	2008.11.03	14	42,360.00	296,520
එන්.ඩී.විජේසේකර	75	2008.11.03	14	42,360.00	296,520
එස්.එස්.කල්පගේ	76	2008.11.03	14	37,510.00	262,570
පහලට ගෙන යන ශේෂය					18,446,025

නම	සේවක අංකය	පත්වීමේ දිනය	වසර ගණන	වැටුප	පාරිතෝෂික ප්‍රතිපාදන
ඉදිරියට ගෙන ආ ශේෂය					18,446,025
පී.සී.ජේ.ද සිල්වා	78	2009.09.01	13	41,335.00	268,678
කේ.එස්. සමීර	84	2011.08.01	11	37,390.00	205,645
ජී.සී.එස්.එම්.නානායක්කාර	85	2011.08.01	11	37,390.00	205,645
බී.එස්.ජේ.විපුල්සි	86	2012.01.02	11	67,850.00	373,175
එච්.එම්.ඒ.ඩී.කේ.හේරත්	87	2012.01.02	11	71,975.00	395,863
ඩී.එන්.අයි.ඩී.ද සිල්වා	90	2012.01.02	11	69,225.00	380,738
චන්දි මේනකා	91	2012.03.01	10	38,710.00	193,550
ඒ.පී.ඉන්ද්‍රානි	92	2012.03.01	10	34,300.00	171,500
පී.මුතුකුමාරණ	95	2012.11.03	10	54,175.00	270,875
පී.ජී.එස්.චතුරංගනී	99	2013.06.06	9	38,410.00	172,845
කේ.ඩී.එල්.පී.කරුනාදාස	101	2013.07.15	9	69,225.00	311,513
ටී.ඒ.ඩබ්.මධුෂානි	103	2013.07.15	9	44,005.00	198,023
එන්. එල්. එස්. දයාරත්න	105	2013.09.02	9	36,010.00	162,045
බී. ජී. එන්. කමල්ප්‍රිය	106	2013.09.10	9	36,520.00	164,340
එච්.ආර්.එම්.යූ.යූ. විජේබණ්ඩාර	109	2014.01.16	8	67,850.00	271,400
මදන් ආර්.	110	2014.01.27	8	71,975.00	287,900
ද. සිල්වා ඊ.ඒ.කේ.	112	2014.02.10	8	76,100.00	304,400
හදපාන්ගොඩ බී.සී.	117	2014.09.15	8	67,850.00	271,400
කුමාර එච්.එල්.කේ.එස්.	118	2014.09.22	8	36,250.00	145,000
කාරියවසම් පී.ඩී.එස්.	119	2014.10.01	8	78,850.00	315,400
ඒ.එච්.එන් සදමාලි	122	2015.06.03	7	42,670.00	149,345
එල්.කේ.කොහොම්බන්	125	2015.06.06	7	40,000.00	140,000
එන්.එච්.එස්.දර්ශන	126	2015.06.07	7	43,115.00	150,903
බී.එල්.කෙ.පී.සංදීපනි	129	2015.06.09	7	37,510.00	131,285
අයි.එම්.ජී.එච්.ලක්මාල්	131	2015.07.08	7	38,410.00	134,435
එච්.එම්.වී.එන්.හේරත්	132	2015.07.22	7	40,210.00	140,735
සුජානි දිල්හාරා	134	2017.08.29	5	39,610.00	99,025
පී.ඩබ්.එස්.භාෂිනි	136	2016.09.01	6	67,850.00	203,550
එන්.රාජපක්ස	137	2016.09.01	6	69,225.00	207,675
ඩබ්.ජී.එස්.කුමාර	138	2016.10.03	6	69,225.00	207,675
ඊ.සී.යූ.ගුණතුංග	139	2016.09.01	6	67,850.00	203,550
ඩබ්.එම්.ඩබ්.බී.විජේසිංහ	140	2016.09.01	6	69,225.00	207,675
කේ.ඒ ඩී.එච්.ලක්මිණි	141	2016.09.01	6	69,225.00	207,675
ජයමිණී මධුෂා	145	2017.05.22	5	33,800.00	84,500
ඩී.ඩබ්.ඉෂානි	149	2017.05.22	5	36,310.00	90,775
රවිඳු රන්දික කුමාර	151	2017.08.25	5	33,800.00	84,500
පහලට ගෙන යන ශේෂය					25,959,260

නම	සේවක අංකය	පත්වීමේ දිනය	වසර ගණන	වැටුප	පාරිතෝෂික ප්‍රතිපාදන
					25,959,260
වී.එන්.රම්මාවඩු	152	2017.08.25	5	39,610.00	99,025
නුවංගි කන්කානමගේ	155	2018.04.02	4	41,335.00	82,670
ජී.වී.අයි. පියුමාලි	156	2018.04.02	4	41,335.00	82,670
ඒ.එස්.කල්පගේ	162	2018.04.02	4	66,475.00	132,950
ජී.එල්.මාසකෝරාල	163	2018.04.02	4	65,100.00	130,200
පී.එල්.අයි.ඒ.ද සොයිසා	164	2018.04.02	4	41,335.00	82,670
පී.ඒ.පී.කේ.පනංගල	167	2018.07.02	4	52,665.00	105,330
කේ.ඒ.පී.පී.ජයවර්ධන	172	2021.03.01	1	38,110.00	19,055
ඒ.එම්.ජෙ.පී.බී. ආල්වීර	173	2021.03.01	1	38,110.00	19,055
ආර්.එම්.සී.ආර්.කේ.මුණසිංහ	174	2021.04.21	1	38,110.00	19,055
එච්.පී.එස්.හංසිනී	175	2021.05.10	1	36,010.00	18,005
පී.යූ.එස්.මධුමාල්	177	2021.05.10	1	35,710.00	17,855
ජේ.ඒ.එම්.එස්.සේනාරත්න	178	2021.05.10	1	36,010.00	18,005
කේ.ඒ.ලලිතධීර	179	2021.04.27	1	111,415.00	55,708
පී.ජේ.කේ.පුංචිහේවා	180	2021.02.07	1	35,710.00	17,855
					26,859,369

වැටුප -දෙසැම්බර් මස මූලික වැටුප + ජීවන වියදම් දීමනාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. VOT/D/TVEC/1/2022/11 මෙම අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2023 මැයි 31 දින

අධ්‍යක්ෂ ජනරාල්
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් තොරතුරු හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

සහතික කරන ලද ගිණුම් සහ යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.ඩී.ඒ.පොන්සේකා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් :- 1. ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය. (නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන අංශය)
2. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාරූඪනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 49 ඡේදය අනුව, වත්කම් ප්‍රත්‍යාගණනයකදී එම වත්කම් අදාළ පංතියට අයත් සියළුම වත්කම් ප්‍රත්‍යාගණනය කළයුතු වුවත් කොමිෂන් සභාවට අයත් මෝටර් වාහන ප්‍රත්‍යාගණනයේදී කැබ් රථයක් ප්‍රත්‍යාගණනයෙන් අත්හැරී තිබුණි. එහෙත් එම කැබ් රථයේ රු.1,750,000 ක් වූ පිරිවැය දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම් ගත නොකර ඊට අදාළ රු.1,726,610 ක් සමුච්චිත ක්ෂය ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 52 ඡේදය අනුව ප්‍රත්‍යාගණන ප්‍රතිඵලයක් ලෙස වත්කම් පන්තියක ධාරණ අගය වැඩිවන විටක එම වැඩිවීම සෘජුවම ප්‍රත්‍යාගණන අනිරික්තයට බැරකළ යුතු වුවද කොමිෂන් සභාවේ වත්කම් ප්‍රත්‍යාගණනයේදී වත්කම් පංති 7කට අදාලව රු.90,383,696 ක් වූ ප්‍රත්‍යාගණන අනිරික්තය ප්‍රත්‍යාගණන සංචිත ගිණුමට බැර කිරීම වෙනුවට විලම්බිත ආදායම් ගිණුමට බැර කර තිබුණි. එමෙන්ම එම ප්‍රමිතයේ 53 ඡේදය අනුව එක් වත්කමක ප්‍රත්‍යාගණිත අගය අඩුවීම එම වර්ෂයේ අනිරික්තයට හෝ ඌනතාවයට හඳුනාගත යුතු වුවත් පරිගණක හා උපාංග වත්කම් පංතියට අදාලව හඳුනාගත් රු.171,453 ක් වූ ප්‍රත්‍යාගණන අලාභය ප්‍රවර්තන වර්ෂයේ අනිරික්තයට ගැලපීම් වෙනුවට අනෙකුත් වත්කම්වල ප්‍රත්‍යාගණන අනිරික්තයෙන් හිලව් කර දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09 අනුව කොමිෂන් සභාව විසින් මූල්‍ය වාර්තා කරන දිනට පැවති සියළුම තොග අයිතමයන් පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් අඩු වටිනාකමට මිනුම් කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවත් කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු.10,843,810 ක්වූ සහනික පත්‍ර හා ඇඟයුම්කරුවන් සඳහා ලබා දෙන කබා (Assessor Overcoat) අවසන් තොගය ලෙස ගණනය කර නොතිබීම හේතුවෙන් වර්ෂ අවසාන තොගය හා අනිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. එසේම ඉතිරි තොග මැනීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුල ලැබී තිබුණු රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන රු.2,587,278 ක් සහ අනෙකුත් ප්‍රාග්ධන ප්‍රදාන රු.1,382,798 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 අනුව හඳුනා ගැනීම හා මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපීම් කිරීම සිදුකර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දී ආදායම් කාණ්ඩ 07 ක් සම්බන්ධයෙන් අදාල අංශයන්ගෙන් ලබාගත් තොරතුරු අනුව ආදායම් රු.60,640,900 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව ආදායම් රු.22,279,725 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ ආදායමේ රු.38,361,175 ක නොසැසඳීමක් විය.

(ඊ) 2022 දෙසැම්බර් 31 දිනට බාහිර ආයතන 04 ක් සඳහා සහනිකපත් නිකුත් කිරීම වෙනුවෙන් රු.34,418,355 ක ආදායමක් ලැබිය යුතු වුවද මූල්‍ය ප්‍රකාශන තුළ එම ආදායම් රු.9,348,689ක් ලෙස දක්වා තිබීමෙන් වර්ෂයේ ආදායම් හා ලැබිය යුතු ආදායම් රු.25,069,666 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3හි 7 ඡේදයේ විධිවිධාන වලට පටහැනිව බස්නාහිර පළාත සඳහා වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලැස්ම (VET Plan) සකස් කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ ප්‍රාග්ධන ප්‍රදාන වලින් රු.1,468,795ක් අදාල කාර්යය ඉටුකිරීමකින් තොරව උපචිත වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා උපචිත වියදම් එම ප්‍රමාණයෙන් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඌ) 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල දක්වා ඇති ආදායම් කාණ්ඩ 09 කට අදාලව එකතුව රු.40,898,093 ක් වූ ආදායමේ හා රු.6,537,091 ක් වූ NVQ සහතිකපත් මුද්‍රණ වියදමේ නිවැරදිභාවය තහවුරු කර ගැනීමට අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(එ) ඉකුත් වර්ෂයේ උපචිත වියදම් යටතේ දක්වා තිබූ මුද්‍රණ වියදම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණු රු.3,082,418 ක මුදල වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා උපචිත වියදම් එම ප්‍රමාණයෙන් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඒ) රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුදල රු.12,343,157 ක් ලෙස දක්වා තිබුණද කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන මගින් ගෙවිය යුතු ලෙස දක්වා තිබුණේ රු.2,018,589 ක් පමණි.

(ඔ) මූල්‍ය ප්‍රකාශනයන්හි 2017 වර්ෂයේ සිට ලැබිය යුතු අත්තිකාරම් ලෙස දක්වා තිබූ රු.4,207,767 ක් සමාලෝචිත වර්ෂයේදී අත්තිකාරම් ශේෂයෙන් අඩුකර පෙර වර්ෂ ගැලපීම් යටතේ දක්වා තිබුණද ඊට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කොමිෂන් සභාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් කොමිෂන් සභාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී

හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාවේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම් සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා, කොමිෂන් සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිෂන් සභාව සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික නත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව | **නිරීක්ෂණ**

2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9 ඡේදය (අ) මූදල් රෙගුලාසි 371 (2) (ආ) යම් විශේෂිත කාර්යයක් සඳහා එක්

	අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා පමණක් අතුරු අග්‍රිම ලබාදිය හැකි වුවත් ඊට පටහැනි ලෙස අවස්ථා 02 කදී රු.1,536,860 ක් හා රු.1,404,987 ක් ලෙස අතුරු අග්‍රිම ලබාදී තිබුණි.
(ආ) මූදල් රෙගුලාසි 371 (5)	යම් අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාල කාර්යයන් අවසන් කර දින 10ක් ගත වූ විටම එම අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු වුවත් කොමිෂන් සභාවේ නිලධාරීන් 77දෙනෙකුට ලබා දී තිබූ තත්කාර්ය අතුරු අග්‍රිම රු.3,521,058 ක් 2022 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් වී නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර කොමිෂන් සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

බලතල, කර්තව්‍ය, කාර්යයන්	නිරීක්ෂණ
1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා පනතේ 14(1), 15(1) උප වගන්ති හා 10(3)(අ), 20(1) වගන්තිවල දක්වා ඇති බලතල, කර්තව්‍ය හා කාර්යයන්.	i. 2023 අප්‍රේල් 20 වන විට තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වී තිබුණු ආයතන අතරින් ලියාපදිංචිය කල්ඉකුත් වූ වසර 20 ට වැඩි ආයතන 20 ක් ද වසර 01 ත් වසර 20 ත් අතර කාලයක් ගතවී තිබුණු ආයතන 1763 ක් ලියාපදිංචිය අලුත් කර ගැනීම සඳහා ඉල්ලීම් කර නොතිබුණද ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. ii. 2017 වසරේ සිට 2023 වසර දක්වා ආයතන 371 ක් ලියාපදිංචිය අලුත්කර ගැනීම සඳහා ඉල්ලීමකර තිබුණ ද විගණිත දිනය වන විට ද එම ආයතනවල ලියාපදිංචිය

අලුත්කර නොනිබුණි.

iii. ලියාපදිංචිය කල් ඉකුත් වූ ආයතන නැවත ලියාපදිංචි කිරීමට හෝ එම ආයතන ලියාපදිංචිය අලුත් නොකර වෘත්තීය සුහුණු කටයුතු දිගටම සිදු කරන බවට ක්‍රමානුකූලව පරීක්ෂා කිරීම සඳහා වැඩපිළිවෙලක් සකස්කර නොතිබීම හේතුවෙන් වෘත්තීය සුහුණු ආයතන සම්බන්ධයෙන් කොමිෂන් සභාවෙන් ඉටුවිය යුතු නියාමනය නිසි පරිදි සිදු වී නොනිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) 2019 වර්ෂයේ සිට ගෙවියයුතු රු.1,880,445 ක ණයගිමි ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද නිරවුල් කර නොනිබුණි.

(ආ) ආපසු ගෙවිය යුතු කෙටි කාලීන ප්‍රදාන (short term refundable grant) තුළ ඇතුලත්ව නිබුණු තැන්පත් කර වසර 5 ඉක්ම වූ රු.1,192,339 ක මුදල නිරවුල් කිරීමට කටයුතු කර නොනිබුණි.

(ඇ) 2019 හා 2020 වර්ෂවලදී ශ්‍රී ලංකා වෘත්තීය සුහුණු අධිකාරියේ අදියර 6 පාඨමාලා සඳහා නිකුත් කිරීමට අවස්ථා 03 කදී සහතික පත්‍ර 2500 ක් මුද්‍රණය කර නිබුණු නමුත් විගණිත දිනය වූ 2023 මාර්තු 31 දින වන විටත් ඉන් සියයට 99 ක් එනම් රු. 295,923ක වටිනා සහතික පත්‍ර 2482 ක් ගබඩාවේ ඉතිරිව නිබුණි.

(ඈ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වී ඇති ඇඟයුම්කරුවන් සඳහා උඩු කබා (Overcoats) ලබා දීමට 2022 වර්ෂයේදී රු.3,888,000 ක වටිනාකමින් යුතු උඩු කබා (Overcoats) 2000 ක් ලංකා සළුසල ආයතනයෙන් මිලදී ගැනීමට කටයුතු කර නිබුණි. ඉන් උඩු කබා 1084 ක් එනම් මිලදී ගත් ප්‍රමාණයෙන් සියයට 54 ක් බෙදානොහැර ඉතිරි වී නිබූ අතර එම කබා බෙදාහැරීමට විධිමත් වැඩ පිළිවෙලක් තීරණය නොකොට මිලදීගැනීම නිසා මෙම තත්ත්වය ඇති වී නිබූ බව විගණනයේදී අනාවරණය විය.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

2023.06.19 TVEC/E2/Audit/2022

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
306/72 පොල්දූව පාර,
බත්තරමුල්ල

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ අංක VOT/D/TVEC/1/2022/11 හා 2023.05.31 දිනැති විගණන වාර්තාව සඳහා වර්තමාන තත්ත්වය මේ සමඟ ඉදිරිපත් කරමි.

1 මූල්‍ය ප්‍රකාශන

1.2 මතය සඳහා පදනම

(අ) තොග ලේඛනයේ නිවැරදිව ඇතුළත් කර ඇති 57-7603 අංක දරණ කැබ් රථය ප්‍රත්‍යාගණන දිනය වන විට අළුත්වැඩියාව පිණිස ගරාජය වෙත යොමු කර ඇති බැවින් ප්‍රත්‍යාගණනය සඳහා භාජනය කළ නොහැකි වී ඇත. එම වත්කම් ප්‍රත්‍යාගණනය සඳහා පිරිවැය ගිණුමෙන් ප්‍රත්‍යාගණන ගිණුමට වටිනාකම මාරු වී තිබුණත් ප්‍රත්‍යාගණනය නොවීම මත සිදුව ඇති මෙම අතපසුවීම රථය අලුත්වැඩියා කළ වහාම ප්‍රත්‍යාගණනය කර නිවැරදි කිරීමට පියවර ගනිමි.

(ආ) ප්‍රත්‍යාගණනයට අදාල ප්‍රත්‍යාගණන අතිරික්තය විලම්භිත ආදායම් ගිණුමෙන් ඉවත් කොට වෙනම පෙන්වීමට කටයුතු කෙරේ. මේ සඳහා අදාල ජ'නල් සටහන් 2023 ආරම්භයට යොදනු ඇත.

ඉදිරියේදී අදාල ජ'නල් සටහන් යොදා එක් එක් වත්කම් පන්තියට අදාල ප්‍රත්‍යාගණන අතිරික්තයෙන් ඌනතාවය වෙන්වෙන්ව පෙන්වීමට පියවර ගනිමි.

(ඇ) සහතික පත්‍රවල මූල්‍ය වටිනාකම ඉතිරි තොග පිළිබඳව අවසාන ගිණුම් වාර්තාවල සටහන් අංක 2 මඟින් හෙලිදරව් කර ඇත. එම හෙලිදරව් කිරීම් ගිණුම්වලට ගැලපීම ඔබ විසින් පෙන්වාදී ඇති පරිදි 2023 වසරේ සිට නිවැරදිව සිදුකරමි. සහතික පත්‍ර තොග ශේෂවල වටිනාකම අවසාන මූල්‍ය වාර්තාවන්හි ගිණුම්වලට ගැලපීම මේ දක්වා සිදුනොකරන ලද අතර,එහි අගය සහ Assessor Overcoat ඉතිරි තොග පැවතුනහොත් පෙර වර්ෂ ගැලපීම් මඟින් ගිණුම්වලට ගැලපීම ඔබ විසින් පෙන්වාදී ඇති පරිදි 2023 වසරේ වාර්තාව සඳහා ඇතුළත් කරමි.

(ඈ) 2023 වර්ෂයේ සිට ශුද්ධ වත්කම් වෙනස් වීමේ ආකෘතිය අනුව ප්‍රාග්ධන ප්‍රදාන පිළිබඳව මූල්‍ය ප්‍රකාශනයේ වෙනම හෙලිදරව් කිරීමට පියවර ගනිමි.

(ඉ) ඇගයුම් අංශය මඟින් ලැබිය යුතු යැයි තහවුරු කරන ලද ඉන්වොයිස් පත්වල අගය පමණක් ආදායමට ගිණුම්ගත කොට ඇත.එය තවදුරටත් පරීක්ෂාකර අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කරමි.

(ඊ) මෙහිදීද ඇගයුම් අංශය මඟින් ලබාදෙන ලද ලැබිය යුතු ඉන්වොයිස් පත් අගය පදනම්කරගෙන අදායම් ගණනය කරන ලදී. ගිණුම්ගත වී නැහැයි සඳහන් රු.25,069,666 ගිණුම්ගතවීමට ඉදිරිපත් කර නොතිබූ ඉන්වොයිස් නැවත පරීක්ෂා කර ගිණුම්ගත කිරීමට පියවර ගනිමි.

(උ) මෙම Vet Plan සකස් කිරීම සඳහා කොමිෂන් සභා අනුමැතිය 2022 දෙසැම්බර් මස ලැබුණි. කෙසේ නමුදු මේ වනවිට උපචිත මුදලින් රු.499,460.00 මුදලක ප්‍රමාණයක් අදාල කාර්යය සඳහා වියදම් කර ඇති අතර, දැනට මෙම කාර්යය ඉටුකරමින් සිටී. මේ වන විට Vet Plan සකස් කිරීම සඳහා දත්ත රැස්කරමින් සිටී.

(ඌ) ආදායම් ඉපයීමට ලත් අනුමැතියන්හි මූලාශ්‍ර පිළිබඳව තවදුරටත් පරීක්ෂා කර බලා නිවැරදි තොරතුරු ඉදිරියේදී ඉදිරිපත් කරමි.

2022 වර්ෂය වෙනුවෙන් තත්ත්ව ආරක්ෂණ ඇගයුම් පාලන අංශය මඟින් ඉදිරිපත් කළ ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් මුද්‍රණ සඳහා වූ රු.6,537,091 ක වවුචර්පත් සඳහා පවත්නා ප්‍රතිපාදන වලට යටත්ව ගෙවීම් කර ඇති අතර,එම වවුචර්පත් ඔබ වෙත ඉදිරිපත් කර ඇත. කෙසේ නමුදු නිසි අනුමැතියකින් යුත් වවුචර් සඳහා කරන ලද ගෙවීම් එනම්, ජාතික වෘත්තීය සුදුසුකම් වැඩසටහන යටතේ අදාල වියදම් පිළිබඳ විස්තර ඔVEC/15/2/8, TVEC/02/01/03,TVEC/E2/Piece rate/i වෙළුම යන ලිපි ගොනුවල ඇතුළත්ව ඇත.

(එ)ඒ) විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත ගෙවන ලද එහි ණයහිමියන් උපචිත වියදම් ලෙස ගණනය වූ මුදල රු.3,082,418, ගිණුම් වර්ෂය තුළ වියදමක් ලෙස සටහන් වීම 2023 වර්ෂයේදී පෙර වර්ෂ ගැලපීම් මඟින් ණයහිමියන් නිවැරදි කර ඇත. එමෙන්ම මුද්‍රණ දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු සත්‍ය මුදල පිළිබඳ පරීක්ෂාකර 2023 දී ගිණුම්වලට ඇතුළත් කරමි.

(ඔ) මෙහිදී 2017 වසරේදී ගිණුම්කරණ පැකේජය අක්‍රීයවීමත් සමඟ වවුචර්පත් නව පැකේජයට ඇතුළත් කිරීමේදී පියවීම්වලට අදාල වවුචර්පත් කීපයක් අත්හැරී තිබූ අතර, එම වවුචර්පත් නැවත පරීක්ෂාකර බලා සමාලෝචිත වර්ෂයේදී පියවීම් සටහන් යෙදවීමට කටයුතු කළ බව සඳහන් කරමි.

2.2.2 නීති රීති/ විධානයට යොමුව

(ඈ) රු.100,000 ක උපරිමයකට යටත්ව අත්තිකාරම් දීමට කටයුතු කර තිබුණද රට තුළ පැවති කොරෝනා තත්ත්වය හේතුවෙන් ඇගයුම් අංශයේ අධ්‍යක්ෂවරිය නමින් අත්තිකාරම් ලබාගෙන විභාග මධ්‍යස්ථාන රාජකාරී භාරව සිටි නිළධාරීන්ගේ ගිණුම්වලට නියමිත සීමාවලට යටත්ව මුදල් තැන්පත් කරන ලදී. මෙම අත්තිකාරමෙන් පසුව රු.100,000 ඉක්මවා අත්තිකාරමක් ලබාදීම මේ වන විට සිදුනොකරනු ඇත.

(ආ) නොපියවූ අත්තිකාරම් ලෙස හර හා බැර ශේෂ වශයෙන් සඳහන්ව ඇති අගයන් පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට පියවර ගන්නා අතර, 2023 වසර තුළදී මෙම රු. 6,948 ක්වූ ශුද්ධ වෙනස පරීක්ෂාකර බලා නිවැරදි කරමි.

2.2.3 බලතල,කර්තව්‍ය,කාර්යයන්

i. ලියාපදිංචි අලුත් කිරීම සඳහා ඉල්ලුම් කරනු ලබන්නේ පුහුණු ආයතන මඟිනි. ඒ අනුව ඉහත කරුණු සත්‍ය වේ. ලියාපදිංචිය අවසන් වීමට මාස 3කට පෙර ඔවුන් වෙත ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ඉල්ලුම් කරන ලෙස දන්වා යවා ඇත. කෙසේ නමුදු ලියාපදිංචිය දිගුකාලයක් ඉකුත් ව ඇති ආයතන සම්බන්ධයෙන් දැනටමත් වැඩ පිළිවෙලක් ආරම්භකර ක්‍රියාත්මක කරනු ලැබේ.

ii. අලුත් කිරීම සඳහා අයදුම්පත්‍ර ලැබුණු පසු එම ආයතනය වෙත ගොස් ඇගයීමක් කරනු ලබයි. එම ඇගයීමේදී අදාල නිර්ණායක සපුරා නොමැති ආයතනවල ලියාපදිංචිය අළුත් කරනු නොලැබේ.

iii. ලියාපදිංචිය අළුත් නොකර ඇති බොහෝ ආයතන මේ වන විට වසා ඇති බව නිරීක්ෂණය කර ඇත. ඒ අනුව එම ආයතන වෙත සිහි කැඳවීම් යොමු කර ඇති අතර, ඒ පිළිබඳ සොයා බලා ඉදිරි ක්‍රියාමාර්ග ගනු ඇත.

2.3 වෙනත් කරුණු

(අ) 2019 වසරේ සිට ගෙවිය යුතු 1,880,445 අගය තුළ ඇතුළත් වූ වාහන පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම වෙනුවෙන් ගෙවිය යුතු අගය ලෙස වෙන් කරන ලද 905,993.90 අගයද ඇතුළත් ව ඇති අතර 2022 වර්ෂයේ දී මේ වෙනුවෙන් 741,484.50 ගෙවා ඇත. මෙහි අධි වෙන් කිරීම රු. 164,509.30 කි. මෙම අගය සහ ඉතිරි ශේෂය වශයෙන් ඇතුළත්ව තිබූ ඇගයුම් දීමනාද 2020 හා 2021 වසර තුළදී නිරවුල් කර ඇති බැවින් 2023 වසරේ දී ජ'නල් සටහන් මඟින් මෙය නිවැරදි කර ඇත.

(ආ) බාහිර ආයතන වෙතින් නිපුණතා සම්මත සැකසීම සඳහා ලබා දෙන ලද අරමුදල් මඟින් නිපුණතා සම්මත සකස් කිරීමට වැය වූ මුදල් හඳුනා ගෙන එම අගයන් ආදායම් ගිණුමට මාරු කිරීමට පියවර ගනිමි.

(ඇ) 2019 හා 2020 වර්ෂවලදී ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 6 වන මට්ටම පාඨමාලා සඳහා සහතික පත් තොග 2500 ක් අවස්ථා තුනකදී ඇණවුම් කරන ලදී.

මේ සඳහා අප විසින් කළ ඇනවුම් සහ ලැබී ඇති තොග පිළිබඳ විස්තර පහත පරිදි වේ.

ඇනවුම අප වෙත ලැබුණු දිනය	ලැබී තිබූ තොග ප්‍රමාණය	දැනට මුද්‍රණය කර ඇති ප්‍රමාණය	දැනට අප සතුව ඇති සත්‍ය තොග	විස්තරය
2019/02/28	200	18		වෘත්තීය පුහුණු අධිකාරියේ 6 වන මට්ටම පාඨමාලාවන් ආරම්භ කර 2018 වර්ෂයේ අප වෙත ලැබී තිබූ ඉල්ලුම අනුව අප විසින් සහතිකපත් 200 ක ප්‍රමාණයක් ප්‍රථමයෙන් ඇණවුම් කරන ලදී. දිගින් දිගටම වෘත්තීය පුහුණු අධිකාරිය සමඟ සාකච්ඡා වූ පරිදි 6 වන මට්ටම සඳහා නව පාඨමාලාවන් ආරම්භ කරන බව පැවසූ බැවින් 2020 දෙසැම්බර් මස සහතික පත් 2000ක් මුද්‍රණය කරනු ලැබුවේ 2021 වසර වන විට සහතිකපත් මුද්‍රණය සඳහා අයදුම්කරනු ඇතැයි අපේක්ෂාවෙනි.
2019/07/12	300	-		
2020/12/03	2000	-		

ඇනවුම අප වෙත ලැබුණු දිනය	ලැබී තිබූ තොග ප්‍රමාණය	දැනට මුද්‍රණය කර ඇති ප්‍රමාණය	දැනට අප සතුව ඇති සත්‍ය තොග	විස්තරය
				-නමුත් එම සහතිකපත් මුද්‍රණය සඳහා ඔවුන් අයදුම් නොකරන ලදී. ඔවුනගේ ඉල්ලීම පරිදි ඉදිරියේදී මෙම සහතිකපත් මුද්‍රණයට භාවිත කරමි. එමෙන්ම,රජයේ මුද්‍රණාලයෙන් සහතික පත් මුද්‍රණය කිරීමේදී කුඩා ඒකක ප්‍රමාණයක් මුද්‍රණය කිරීමේදී ඒකකයක් සඳහා පිරිවැය වැඩි වන බැවින් අවසාන වර සහතිකපත් 2000 මුද්‍රණය කෙළේය. නමුත් COVID වසංගතය හේතුවන් හා සිසුන් ඇතුළත් වීමේ හා සමත් වීම අවම වීම හේතුවෙන් සහතික මුද්‍රණය අවම විය. තව දුරටත් එම ආයතන නව පාඨමාලාවන් ආරම්භ නොකල බැවින් 2020 පසුව නව සහතිකපත් මුද්‍රණය සඳහා ඇනවුම් නොකරන ලදී.
එකතුව	2500	18	2482	

(ඈ) Overcoats බෙදා දීම ඇගයීම්කරුවන්ගේ පහසුව තකා දිස්ත්‍රික් මට්ටමින් වැඩ සටහන් මෙහෙයවා කෑගල්ල, රත්නපුර, බදුල්ල හා බණ්ඩාරවෙල යන ස්ථාන වෙත ගොස් ලබා දෙන ලදී. දිස්ත්‍රික්ක මට්ටමින් මෙම overcoats ලබාදීමේදී ඒවා ලබාගැනීමට ඇගයීම්කරුවන් පැමිණීම දුර්වල වී ඇත. පවතින ආර්ථික අපහසුතා මත මෙම වියදම දැරීමට ඇගයීම්කරුවන්ගේ උනන්දුව අඩුවී ඇත.

2022.11.01 දින සිට මෙම overcoats පැළඳීම අනිවාර්ය කරමින් 2022.09.05 වන දින ලිපියක් මාර්ගයෙන් දැනුම් දෙන ලදී . එම ලිපිය යැවූ පසු TVEC හි ලියාපදිංචි ඇගයීම්කරුවන් විශාල ප්‍රමාණයක් පැමිණ මෙම overcoats ලබා ගෙන ඇත. මෙලෙස ක්‍රියාකාරකම් කිහිපයක් මඟින් ඇගයීම්කරුවන්හට overcoats ලබා දීමට TVEC ආයතනය කටයුතු සිදු කල අතර, ඒ අනුව 2023.03.28 දින වන විට overcoats 912 ක ප්‍රමාණයක් බෙදා දී ඇත. තවද, ඇගයීම්කරුවන් පුහුණු වැඩසටහන සාර්ථකව නිම කරන අයවලුන් සඳහා 2023.01.04 වන දින සිට පත්වීම් ලිපිය සමඟම overcoats ලබා දීම ක්‍රියාත්මක කරන ලදී. මේ වනතුරු මිලදී නොගත් ඇගයීම්කරුවන් හට මෙම overcoats පැලඳීම අනිවාර්ය කර ඇති ලිපිය මඟින් නැවත වරක් සිහිකැඳවීමක් සිදු කිරීමට කටයුතු කරමි. තවද 2023.03.31 දින වන විට පුහුණුව ලත් ඇගයීම්කරුවන් 180ක් සිටින බැවින් ඔවුන් සඳහා ඉතිරි overcoats ලබාදීමට කටයුතු කරනු ඇත. දිස්ත්‍රික් මට්ටමින් රජයේ හා පෞද්ගලික පිළිගත් පුහුණු ආයතන හරහා ඇගයීම්කරුවන් වෙත ලබාදීමට කටයුතු කරමි. තවද ඉදිරියේදී ඇගයීම්කරුවන්ගේ සංඝතභාවය පිළිබඳ වැඩසටහන් 10ක් පැවැත්වීමට කටයුතු සැලසුම්කර ඇති අතර, එහිදී ද අදාල overcoats අදාල ගාස්තුව අයකිරීමෙන් අනතුරුව ලබා දීමට කටයුතු කරනු ලැබේ.

ආචාර්ය කේ.ඒ.ලලිතසිර
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් - විගණන අධිකාරී - රජයේ විගණන අංශය - දැ.ගැ.ස

TERTIARY AND VOCATIONAL EDUCATION COMMISSION
Ministry of Education

3rd Floor, "Nipunatha Piyasa"
354/2, Elvitigala Mawatha, Colombo 05.

Telephone : 011-7608000 | Fax : 011-2555007 | e-mail : info@tvec.gov.lk

www.tvec.gov.lk